

# අභිධම්ම මාතිකා ස්වරූපාර්ථ.

A 36

# අභිධම්ම මාතිකා

## සවරූපාර්ථ

සම්පාදිකා

සීලවතී පීරිස්

# ප්‍රස්තාවනා

සුවාසූ දහසක් ධර්මස්කන්ධය විනය පිටකය සූත්‍රාන්ත පිටකය අභිධර්ම පිටකය නමින් පිටක වශයෙන් තුනකට බෙදේ. ආඥා දේශනා වෝහාර දේශනා පරමත්ථ දේශනා නමින් ත්‍රිපිටකය හැඳින් වේ. විනය පිටකය බුද්ධ අඥාඥවකි. සූත්‍රාන්ත පිටකය ලෞකික ව්‍යවහාරයකි. අභිධර්ම පිටකය පරමාර්ථදේශනයකි.

යථාපරාධ සාසනා යථානුලෝම සාසනා යථා ධම්ම සාසනා නමින් ද ත්‍රිපිටකය හැඳින් වේ. වරදට අනුරූපව කෙරෙන අනුශාසනාව විනය පිටකයය. ලෞකික ව්‍යවහාරයට අනුව කෙරෙන අනුශාසනාව සූත්‍රාන්ත පිටකයය. ධර්මය වූ පරිදි කෙරෙන අනුශාසනාව අභිධර්ම පිටකයයි.

සංවරාසංවර කථා දිට්ඨි විනිවේඨන කථා නාමරූප පරිච්ඡෙද කථා නමින් ද තුන් පිටකය හැඳින්වේ. ලොකු කුඩා අසංවර කම් සංවර කෙරෙනුයේ විනය පිටකයෙනි. නානා දෘෂ්ටීන් නිරවුල් කෙරෙනුයේ සූත්‍රාන්ත පිටකයෙනි. නාමරූප පිළිබඳ වෙන් වෙන් වශයෙන් පිරිසිඳීම කෙරෙනුයේ අභිධර්ම පිටකයෙනි.

තවද අධිශීල ශික්ෂාව විනය පිටකයෙහි ද අධිචිත්ත ශික්ෂාව සූත්‍රාන්ත පිටකයෙහි ද අධිප්‍රඥා ශික්ෂාව අභිධර්ම පිටකයෙහි ද ඇතුලත් වේ. තදංග ප්‍රහාණය විනයෙහි ද විෂ්කම්භන ප්‍රහාණය සූත්‍රාන්තයෙහි ද සමුච්ඡේද ප්‍රහාණය අභිධර්මයෙහි ද ඇතුලත් වේ. ව්‍යතික්කම ක්ලේශයන්ගේ සංසිඳීම විනයෙහි ද පරියුට්ඨාන ක්ලේශයන්ගේ සංසිඳීම සූත්‍රයෙහිද අනුශය ක්ලේශයන්ගේ සංසිඳීම අභිධර්මයෙහි ද දක්වේ.

අර්ථ ගාම්භීරතාව ධර්ම ගාම්භීරතාව දේශනා ගාම්භීරතාව හා ප්‍රතිවේධ ගාම්භීරතාව පිටකත්‍රයෙහිම අනුපිළිවෙළින් ගාම්භීරමය. විනයෙහි වැරදි ලෙස පිහිටීමෙන් දුසිල් බවටද සූත්‍රාන්තයෙහි වැරදිලෙස පිහිටීමෙන් මිසදිටු බවට ද අභිධර්මයෙහි වැරදිලෙස පිහිටීමෙන් උමතු බවටද පැමිණීම සිදුවේ. විනයෙහි මනාව පිහිටීමෙන් සුසිල්වත් ව ත්‍රිවිද්‍යාලාභී වීමද සූත්‍රාන්තයෙහි

මනාව පිහිටීමෙන් ෂට් අභිඥා ලාභී වීමද අභිධර්මයෙහි මනාව පිහිටීමෙන් සිවුපිළිසිඹියා ඥාණ ලාභී වීමද සිදු වේ.

අභි - විශිෂ්ය ධර්මය, අභි - අතිරේක ධර්මය යන අර්ථයෙන් අභිධර්මය හැදින් වේ.

**''ධම්ම සඞ්ගණී විභඞ්ගඤ්ච කථා වත්ථුච පුග්ගලො**
**ධාතු යමක පට්ඨානං අභිධම්මොති වුච්චති''**

ධම්මසංගණී ප්‍රකරණය - විභංග - ධාතුකථා - පුද්ගල ප්‍රඥප්ති කථා වස්තු - යමක ප්‍රකරණය හා පට්ඨාන මහා ප්‍රකරණයයි ප්‍රකරණ වශයෙන් අභිධර්ම පිටකය සත් වැදෑරුම් වුවද මුලසිට අග දක්වා අනුපිළිවෙල සහිත අතිදීර්ඝ වූ එකම සූත්‍ර දේශනාවක් වැනිය එහෙයින් ම ධම්මසංගණී ප්‍රකරණයේ පටන් අධ්‍යයනය නොකළ කෙනෙකුට ඉන් ඉහළ ප්‍රකරණයක් නිසි සේ හැදෑරිය නොහැකිය.

අභිධර්මය හැදෑරීමේ පහසුව පිණිස ධම්ම සංගණියෙහි තික මාතිකා 22x3, දුකමාතිකා 100x2, නමින් අභිධර්ම මාතෘකා පද 266 ක් ද සූත්‍රාන්ත මාතිකා 42x2 පද 84 ක් ද වදරා ඇත. අභිධර්ම පිටකය අනුපිළිවෙළින් නිවැරැදිව නිරාකූලව උගෙනීම පිණිස අභිධර්ම මාතෘකා සියල්ල ප්‍රගුණ කරගත යුතුමය. පූර්වාචාර්යෝත්තමයන් විසින් ඒ සඳහා සකස් කරන ලද ස්වරූප කථනය අභිධර්ම මාතෘකා ස්වරූපය නමින් හැදින් වේ.

ත්‍රිපිටක ධර්මය පිළිබඳ දීර්ඝකාලීන මනා අවබෝධයක් ඇත්තාවූ ශ්‍රී සුමංගල ත්‍රිපිටක ධර්ම අධ්‍යයන පරීක්ෂණය පිළිබඳ සහයෝගය දෙන්නා වූ නුගේගොඩ බෞද්ධ කල්‍යාණ මිත්‍ර සංගමයේ සභාපතිනි ද වූ සත්ගුණවත් සීලවතී පිරිස් මාතාව අභිධර්මය හදරණ ආධුනිකයන්ගේ ප්‍රයෝජනය පිණිස සිය අතින් මෙම අභිධර්ම මාතෘකා ස්වරූප ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ අති මහත් ශාසනික දයාවෙනි. ඉතාමත් වයෝවෘද්ධව සිටත් මෙම මාහැඟි ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් සිදු කළ උදාර ශාසනික සේවය පිළිබඳව සත්ගුණවත් සීලවතී පිරිස් මාතාව ශාසනමාමක සාධූන්ගේ ගෞරවාදරයට හා ප්‍රසංසාවට

සුදුසුමය. රත්නත්‍රයානු භාවයෙන් පින්වත් සිලවතී පිරිස් මෑණියන්ට නිරෝගී සුවයෙන් ශතවර්ෂාධික කාලයක් දීර්ඝායු අත් වේවා. ප්‍රාර්ථනීය බෝධිඥානයෙන් ශාන්ත නිවන් සුව පිණිස සුවසේ පාරමී පිරේවා.

''සබ්බෙ භද්‍රානි පස්සන්තු''

මෙයට-මෙතැති,

නාළයනේ අරියධම්ම ස්ථවිර

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය.
ගල්දූව - කහව, 2536–1992. 10. 20

# සම්පාදිකාවගෙන්

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුධත්වය ලැබූතැන් පටන් සාවුරුද්දක ගේ ඇවැමෙන් තීර්ථකයින්ගේ මාන මර්දනය සඳහා යමා මහ පෙලහර පා වදරා ඊටපසු සත්වන වස්සාන කාලය ගත කිරීම සඳහා තව්තිසා දෙව්ලොවට වැඩිසේක. එහි පරසතු මදරා රුක්මූල පනවනලද පණ්ඩුකම්බල නම් ශෛලාසනාය මත බුධ රශ්මි මාලාවෙන් යුතුව වැඩසිටිසේක්, මාතෘ දිව්‍ය රාජයා ප්‍රධාන කොට දස දහසක් සක්වලින් පැමිණි දෙව් බඹ පිරිස උදෙසා අභිධර්ම දේසනාව කළසේක. ඒ දේසනාව අසාසිටි මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ අනන්ත අප්‍රමාණ දෙව් බඹ පිරිසකට චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධය වීය.

බුදු රජාණන් වහන්සේ විසින් අවබෝධ කරන ලද පරමාර්ථ ධර්මය වාග් භේද කොට දේසනා කරන ලද්දේය. එහි නිදන කථාව මෙසේය. ''එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු, පාරිච්ඡත්තක මූලෙ පණ්ඩුකම්බල සිලායං තත්‍රඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්ම කථං කථෙසි'' කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා, යනාදින් මාතෘකාව තබා කරන ලද ඉතා විස්තාර දේශනාවකි. එය තෙමසක් මුළුල්ලෙහි නොකඩවා දේසනා කරන ලද්දේය.

ඒ කාලය තුලම නිර්මිත බුදුරුවක් මවා මෙතෙක් ධර්මය දෙසනා කරත්වා යන අධිෂ්ඨානයද කොට මිනිස් ලොවට වඩින සේක. මිනිස් ලොවදී දන්වැළඳීම් ආදිය කොට උපස්ථානයට වඩින ලද සැරියුත් මහ රහතන් වහන්සේට දෙව් ලොවදී කරන ලද විස්තාර දෙසනාව සංක්ෂේපයෙන් හකුළුවා වදරන සේක. එය ඉතා ගෞරවයෙන් ධාරණය කරගෙන ගොස් සැරියුත් මහරහතන් වහන්සේගේ අතවැසි සද්ධිවිහාරික ශිෂ්‍ය පිරිය වන 500 ක් භික්ෂූන් වහන්සේලාට විස්තර කොට එදිනෙදට උගන්වන සේක. එම දේසනාව නාති විස්තාර නාති සංක්ෂේප දෙසනාවකි.

බුදුරජාණන් වහන්සේ දෙව්ලොව කරන ලද දෙසනාව අවසන් වීම සමග මේ 500 ක් භික්ෂූන් වහන්සේලා අභිධම්මික

මගරහත් භාවයට පත්වූවෝය. දෙව්ලොව හැර මිනිස් ලොවද ආභිධම්මික රහතන් වහන්සේලා 501 ක් නමක් වූවෝය. ඉන් සිප නමක් ප්‍රථම සංගායනාවටද සහභාගී වූවෝය.

අභිධම්ම පිටකයෙහි පළමු වැන්න ධම්ම සංගණී ප්‍රකරණ යයි. එය චිත්තෝත්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ඛෙප කණ්ඩය, අට්ඨ කථා කාණ්ඩයයි සතරාකාර වේ. පළමුව චිත්තෝත්පාද කාණ්ඩය වදාළසේක. එය කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තර යයි සතර වැදෑරුම් වේ. එය මාතිකාය පදභාජන යයි දෙවැදෑරුම් වේ. මාතිකාවද අභි-ධම්ම මාතිකා සුත්තන්ත මාතිකායයි දෙවැදෑරුම් වේ. මෙහි විස්තර ස්වරූප පෙන්වන්නේ අභිධම්ම මාතිකාවෙහිය.

අභිධම්ම මාතිකාවට ප්‍රථම අභිධර්මාර්ථ සංග්‍රහය ආදී පොත කින් චිත්ත චෛතසික ආදී සතරපරමාර්ථ ධර්මයන්ගේ ස්වරූප-යන්ද සම්ප්‍රයෝග නය, සංග්‍රහ නය ආදි විභාගයන් ද, රූප ධර්ම යන්ද විස්තර වශයෙන් දතයුතුය. එම පොත අභිධර්ම නමැති භාණ්ඩාගාරයට ඇතුළු වීමට තිබෙන දොරටුවක් වැනිය. එය පොඩි දරුවන්ගේ හෝඩි පොත හා සමාන වේ. හෝඩි පොතෙන් අකුරු හැඳිනීම කරන්නාක් මෙන් අභිධර්මාර්ථ සංග්‍රහය නාම රූප ධර්ම නිසි පරිදි හඳුන්වා දෙති. එය හොඳකාර තේරුම් ගත හොත් මාතිකාව තනියම හෝ තේරුම් ගතහැකි වේ.

ත්‍රිපිටක ධර්ම පරීක්‍ෂණයට පෙනීසිටි ස්වාමීන් වහන්සේලාගේ ප්‍රශ්නයක් හේතුකොට මේ පොත සකස් වූ බැවි කෘත ගුණ පූර්වකව සිහිපත් කරමු.

''නෝනලා කොහොමද මේවා ඉගන ගත්තේ'' යයි ඇසීම මහත් සංවේග උපද වන්නක් විය. අපේ ආචාර්‍යයන් වහන් සේගේ දෙපා වැඳ ආරාධනා කළේ ත්‍රික 22 හෝ ලියවා ගැනීම ටයි. එය ලියාගෙන එන ලෙස මා වෙතම පැවැරුනි, එයයි හේතුව. මේ පින්කම කර ගැනීමේ ඒ පින එම ස්වාමීන් වහන්සේලාටද නිවන් පිණිසම හේතුවේවා!

නාමරූප ධර්ම තේරුම් ගැනීම එදිනෙද ජීවිතයටද බලවත් උපකාරයකි. තමා තුල හටගන්නා ලෝභ ද්වේශාදී අනර්ථකාරී ධර්ම ගැන හරිහැටි තේරුමක් නො මැති වුවහොත් ද්වේශ මෝහ ආදීන්ට යටත්වී මෙන් පලිගැනීම් වැනි දරුණු ක්‍රියා පවා කිරිමට පෙලඹෙති. මේ වායේ භයානක කම නො දැනීම

මහරහත් භාවයට පත්වූවෝය. දෙව්ලොව හැර මිනිස් ලොවද ආභිධම්මික රහතන් වහන්සේලා 501 ක් නමක් වූවෝය. ඉන් සිප නමක් ප්‍රථම සංගායනාවටද සහභාගී වූවෝය.

අභිධම්ම පිටකයෙහි පළමු වැන්න ධම්ම සංගණී ප්‍රකරණ යයි. එය චිත්තෝත්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ඛෙප කණ්ඩය, අට්ඨ කථා කාණ්ඩයයි සතරාකාර වේ. පළමුව චිත්තෝත්පාද කාණ්ඩය වදාළ සේක. එය කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තර යයි සතර වැදැරුම් වේ. එය මාතිකාය පදභාජන යයි දෙවැදැරුම් වේ. මාතිකාවද අභිධම්ම මාතිකා සුත්තන්ත මාතිකායයි දෙවැදැරුම් වේ. මෙහි විස්තර ස්වරූප පෙන්වන්නේ අභිධම්ම මාතිකාවෙහිය.

අභිධම්ම මාතිකාවට ප්‍රථම අභිධර්මාර්ථ සංග්‍රහය ආදී පොත කින් චිත්ත චෛතසික ආදී සතරපරමාර්ථ ධර්මයන්ගේ ස්වරූපයන්ද සම්ප්‍රයෝග නය, සංග්‍රහ නය ආදි විභාගයන් ද, රූප ධර්ම යන්ද විස්තර වශයෙන් දතයුතුය. එම පොත අභිධර්ම නමැති භාණ්ඩාගාරයට ඇතුළු වීමට තිබෙන දොරටුවක් වැනිය. එය පොඩි දරුවන්ගේ හෝඩි පොත හා සමාන වේ. හෝඩි පොතෙන් අකුරු හැඳිනීම කරන්නාක් මෙන් අභිධර්මාර්ථ සංග්‍රහය නාම රූප ධර්ම නිසි පරිදි හඳුන්වා දෙති. එය හොඳකාර තේරුම් ගත හොත් මාතිකාව තනියම හෝ තේරුම් ගතහැකි වේ.

ත්‍රිපිටක ධර්ම පරීක්ෂණයට පෙනීසිටි ස්වාමීන් වහන්සේලාගේ ප්‍රශ්නයක් හේතුකොට මේ පොත සකස් වූ බැව් කෘත ගුණ පූර්වකව සිහිපත් කරමු.

''නෝනලා කොහොමද මේවා ඉගන ගත්තේ'' යයි ඇසීම මහත් සංවේග උපද වන්නක් විය. අපේ ආචාර්යයන් වහන්සේගේ දෙපා වැඳ ආරාධනා කළේ ත්‍රික 22 හෝ ලියවා ගැනීම ටයි. එය ලියාගෙන එන ලෙස මා වෙතම පැවැරුනි, එයයි හේතුව. මේ පින්කම කර ගැනීමේ ඒ පින එම ස්වාමීන් වහන්සේලාටද නිවන් පිණිසම හේතුවේවා!

නාමරූප ධර්ම තේරුම් ගැනීම එදිනෙද ජීවිතයටද බලවත් උපකාරයකි. තමා තුල හටගන්නා ලෝභ ද්වේශාදි අනර්ථකාරී ධර්ම ගැන හරිහැටි තේරුමක් නො මැති වුවහොත් ද්වේශ මෝහ ආදීන්ට යටත්වී මෙන් පලිගැනීම් වැනි දරුණු ක්‍රියා පවා කිරීමට පෙලඹෙති. මේ වායේ භයානක කම නො දැනීම

නිසා තමාට සිදුවන අනර්ථය නො පෙනෙයි. ධර්මය තේරුම් ගතහොත් තමාට යහපතක් සලසාගත හැකි වේ. බුදු දහම මෙලොව පරලොව දෙකටම යහපතක්ම සලසා දෙන්නේය.

මේ පොත සකස් වූයේද පළමු ත්‍රික දෙවිස්ස අවසන් වුන මුත් දැනුදු පොත් උවමනා අය සිටින බැවින් මේ වාරයේ අභිධම්ම මාතිකා සියල්ලටම ස්වරූප ලියා ඇත. එය ආදරයෙන් ගෞරවයෙන් ඉගනගනිත්වා. අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන් වහන්සේගේ අවවාද පරිදි අභිධම්ම මාතිකා සියල්ලටම ස්වරූප ලියා අත්කරගත් පින ඒ අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන් වහන්සේට අයිති වේවා.

මෙසේ අභිධම්ම මාතිකා සියල්ලට පොතපතේද උපකාර ඇතිව අප ඉගන ගත් පරිදි ස්වරූප ලියා සකස් කොට එහි වැරදි තැන් නිවරදි කරගැනීම සඳහා අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ වෙත ගෙන ගොස් දෙපාවැඳ නමස්කර කොට මෙය කියා සැලකර සිටියෙමි. ඉතා කරුණාවෙන් එය භාරගෙන සකස් කර වටිනා ප්‍රස්තාවනාවක්ද ලියා දුන්සේක. දැනට 88 වන වියෙහි පසුවන ව යාවෘද්ධ මැණියන් කෙරෙහි දක්වනලද අනුකම්පාව නිසාම මෙය නිමාවට පත්කර ගත හැකි විය.

මේ පොත සකස් කිරීමෙන් හා සෑම ආකාරයකින්ම අප විසින් රැස්කරගන්නා ලද පින අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේට නිරෝගී භාවය හා දීර්ඝායුශ්‍රී සම්පත් ලැබීමටද හේතුවේවා. සමෘග් දෘෂ්ටික දෙවිදේවතා සමූහයා ගේ ආරක්‍ෂාව නිති සැලසේවා. නිර්වානාව බෝධයටද හේතුවේවා එසේම මාගේ ත්‍රිවිධ ද්වාරයෙන් ප්‍රමාද දෝෂයකින් වරදක් සිදුවී ඇතොත් එයටද සමාව ලැබේවා.

අභිධම්ම මාතිකාව වාචෝද්ගත කොට (කට පාඩමෙන්) ඉගන ගන්නා පොතකි. එය ඉගෙන දිනපතා භාවිතා කරන්නේ නම් චූල්ලසෝතාපන්න භාවයට ද, ගතිනියත බවටද පැමිණේ. ත්‍රිහේතුක පටිසන්ධියකුවීමටද, සුඛා පටිපද ඛිප්පාභිඥ බවටද පැමිණීමේ ආනිශංසද ඇති බැවින් ඉතා ආදරයෙන් ගෞරවයෙන් ඉගනගනිත්වා යනු මාගේ ප්‍රාර්ථනාවයි.

සැමටම තෙරුවන් සරණයි.

මීට, සම්පාදිකා

# පුණ්‍යානුමෝදනාව යි.

ධර්‍මදානමය පින්කම් මේ පොත ලිවීමෙන්ද, මීට ඉහත මාතිකා ත්‍රික දෙවිස්ස ලියා පළකිරීමෙන් රැස්කර ගන්නා ලද පුණ්‍ය සම්භාරයද ත්‍රිපිටක ධර්මය ඉගනීමෙන් සහ ඉගැන්වීමෙන්ද ධර්මය ඉගැන්වීමට සිය නිවස ඉඩ සලසා දීමෙන්ද ධර්මය ඉගන ගන්නා පින්වතුන්ට පහසුකම් සහ පොත පත සපයා දීමෙන්ද, මේ ආදී වශයෙන් ධර්‍මදානමය වශයෙන් පින් රැස් කර ගතිමි.

බුඩ ජයන්ති කාලයේ බුරුම රටින් ලංකාවට වඩිනා ලද කම්මට්ඨානාචාර්යය අතිගරු ඌ සුජාත ස්වාමීන් වහන්සේ වෙතින් විපස්සනා භාවනා පුහුණු වීමෙන් සහ ලංකාවේ වැඩ සිටි කාලය තුල දන්දීම් බණ ඇසීම්, කඨින පින්කම් ආදිය සිද්ධ කිරීමෙන්ද බොහෝ පින් රැස්කර ගතිමි.

අපගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ වන පරමාර්ථ ධර්‍ම සභාවේ සහ ශ්‍රී සුමංගල ගුණානුස් මරණ සභාවේද ආදී කර්තෘවරයෙක් වන අභිධම්මාචාර්‍ය්‍ය අනගාරික බී. ආර්. ඩයස් මහතාටද අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන් වහන්සේටද, අපගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ වන දෙමටගොඩ මහාවිසුඩාරාමාධි පතිවූද, ස්වේජින් නිකායේ මහානායක ස්වාමීන් වහන්සේවූද, ත්‍රිපිටක විද්‍යාලයා ධිපතිවූද, අතිපූජ්‍ය දෙවිනුවර ඥානාවාස මහා නායක ස්වාමීන් වහන්සේට ගිලන් උපස්ථාන කිරීමෙන් හා ආදහන පින්කම්, පින් පැමිණ වීමේ පින්කම් ආදිය කිරීමෙන්ද, මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි අධිපතිවූද, ශ්‍රී ඥනාරාම ධර්මායතනයෙහි අධිපති වූද කම්මට්ඨානාචාර්‍ය්‍ය අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන් වහන්සේ වෙත කඨින පූජා කිරීමෙන්ද, මීතිරිගල ශ්‍රී ඥානාරාම ධර්‍මායතනයෙහි සියලු පින්කම් සහ මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන් වහන්සේ වෙනු වෙන් තුන් මාසයේ දෙන ලද මහා දනයට සහභාගීවීමෙන්ද බුඩදාස මහතාගේ දෙශනා වලින් සකස්කළ බෞඩ කල්‍යාණ මිත්‍ර සංගමයෙන් පළකරන ලද ධර්ම පුස්තකයන්ට සහාය වීමෙන්ද, එම සංගමය ආරම්භ කොට මෑතක් වනතුරු පවත්වා ගන යාමට සහ සියලු පින්කම් සඳහා නිවස ඉඩදී සහාය වීමෙන්ද මේ ආදී වශයෙන් කුඩා කල සිට මේ දක්වා කරන ලද සියලු ආකාරයෙන් රැස්කර ගන්නා ලද පුණ්‍යය කර්‍මයන්ගේ පුණ්‍ය ඵලයක් ඇත්තේද,

ඒ සියලු ආකාරයෙන් රැස්කරගන්නා ලද පින් අනුමෝදන් කරවමු. මාගේ දයාබර මෑණියන් වහන්සේට සහ පියාණන් වහන්සේටද, මාගේ ස්වාමියාණන් වහන්සේටද. එම මව්පිය දෙදෙනා වහන්සේලාටද, මාගේ දයාබර බෑනණුවන් වන අභි- ධර්මාචාර්ය ඒ. ඩී. එම්. බුඩදාස මහතාටද, කුරේ ප්ලේස්හි විසූ ඥාති සොහොයුරු දෙදෙනාටද, මියගිය සොහොයුරු ඥතිමිත්‍රාදී සැමටද,

මේ පොත මුද්‍රණය කරවා දෙනලද මාගේ ඥාති පුත්‍ර ආතර් සමරසේකර සහ නන්දසීලි සමරසේකර දියනියටද,

ඒ දෙපොලගේ මියගිය මව්පිය දෙදෙනා වහන්සේලාටද සහ සොහොයුරන් තුන් දෙනාටද, දූ දරු ආදීන් ඇතුළු මාගේ සැපදුක් නිතර සොයා බලා කටයුතු කරන සැම දෙනාටද මේ පොත සකස් කිරීමේදී මට උපකාරීවූ ධර්මසේකර පෙරේරා මහතාටද බෞඩ කල්‍යාණ මිත්‍ර සංගමයේ සැමටද, මා විසින් රැස් කරගන්නා ලද පින අනුමෝදන් කරමු. අනුමෝදන්වේවා!

ශාසනාරක්ෂක සියලු සම්‍යග් දෘෂ්ටික දෙවි දෙවතා සමූහයා ඇතුළු සියලු සත්ව සමූහයාවෙත මේ පින අනුමෝදන් කරමු. අනුමෝදන් වේවා.

මේ පොත ලිවීමෙන් සහ සෑම ලෙසකින්ම මාගේ හිත, කය, වචනය යන තිදෙරින් ප්‍රමාද දෝෂයකින් රත්නත්‍රය කෙරෙහි වරදක් සිදුවූයේ නම් එයටද රත්නත්‍රය කෙරෙන් සමාව ලැබේවා සාධු, සාධු, සාධු,

සියලු දෙනාටම තෙරුවන් සරණින් යහපතක්ම වේවා!

මීට,

මෙත්සිතැති

සීලවතී පීරිස්

ඒ සියලු ආකාරයෙන් රැස්කරගන්නා ලද පින් අනුමෝදන් කරවමු. මාගේ දයාබර මෑණියන් වහන්සේට සහ පියාණන් වහන්සේටද, මාගේ ස්වාමියාණන් වහන්සේටද. එම මව්පිය දෙදෙනා වහන්සේලාටද, මාගේ දයාබර බෑනණුවන් වන අභි-ධර්මාචාර්ය ඒ. ඩී. එම්. බුඩදාස මහතාටද, කුරේ ප්ලේස්හි විසූ ඥාති සොහොයුරු දෙදෙනාටද, මියගිය සොහොයුරු ඥතිමිත්‍රාදී සැමටද,

මේ පොත මුද්‍රණය කරවා දෙනලද මාගේ සඳුනි පුත්‍ර ආතර් සමරසේකර සහ නන්දසීලි සමරසේකර දියනියටද,

ඒ දෙපොලගේ මියගිය මව්පිය දෙදෙනා වහන්සේලාටද සහ සොහොයුරන් තුන් දෙනාටද, දූ දරු ආදීන් ඇතුළු මාගේ සැපදුක් නිතර සොයා බලා කටයුතු කරන සැම දෙනාටද මේ පොත සකස් කිරීමේදී මට උපකාරීවූ ධර්මසේකර පෙරේරා මහතාටද බෞඩ කලයාණ මිත්‍ර සංගමයේ සැමටද, මා විසින් රැස් කරගන්නා ලද පින අනුමෝදන් කරමු. අනුමෝදන්වේවා!

ශාසනාරක්ෂක සියලු සම්‍යග් දෘෂ්ටික දෙවි දෙවතා සමූහයා ඇතුළු සියලු සත්ව සමූහයාවෙත මේ පින අනුමෝදන් කරමු. අනුමෝදන් වේවා.

මේ පොත ලිවීමෙන් සහ සැම ලෙසකින්ම මාගේ හිත, කය, වචනය යන තිදෙරින් ප්‍රමාද දෝෂයකින් රත්නත්‍රය කෙරෙහි වරදක් සිදුවූයේ නම් එයටද රත්නත්‍රය කෙරන් සමාව ලැබේවා සාධු, සාධු, සාධු,

සියලු දෙනාටම තෙරුවන් සරණින් යහපතක්ම වේවා!

මීට,

මෙත්සිතැති

සීලවතී පීරිස්

# ශුද්ධි පත්‍රය

| වැරදි | පිටුව | පේළිය | නිවැරදි |
|---|---|---|---|
| පරිත්ත රම්මණා | 2 | 13 | පරිත්තා රම්මණා |
| ගන්ඟ | 6 | 15 | ගන්ථ |
| විප්පයුත්ත | 8 | 11 | විප්පයුත්තා |
| අනුඣ්පාද | 16 | 2 | අනුප්පාදෙ |
| ග්‍රාවක | 16 | 5 | ශ්‍රාවක |
| මහග්ගත සිත් 24 | 18 | 15 | මහග්ගත සිත් 27 |
| සත්දෙන සත්වරක් | 19 | 9 | සත්දෙන සතරවරක් |
| දීමෙ | 22 | 8 | දීම |
| එක්වරක්ද ඉතිරි | 22 | 28 | එක්වරක්ද සත්දෙන සතර වරක්ද |
| ජොට්ඨබ්බ | 24 | 30 | ඵොට්ඨබ්බ |
| චක්ඛු විඤ්ඤාණා ඝාණ විඤ්ඤාණ ධාතු | 24 | 31 | චක්ඛු විඤ්ඤාණ ධාතු සොත විඤ්ඤාණ ධාතු |
| ඉතිරි සිත් 24 | 25 | 3 | ඉතිරි සිත් 43 |
| ඒවාසමග | 26 | 9 | ඒ හා සමග |
| පඤ්චද්වාර සිත | 30 | 27 | පඤ්චද්වාරා වජ්ජන සිත |
| උපාදිණ්ණා | 34 | 2 | උපාදිණ්ණ |
| ලෞකික විපාක 33 | 34 | 18 | ලෞකික විපාක 32 |
| ප්‍රාසාද රූපය | 35 | 2 | ප්‍රසාද රූපය චක්ඛායතන නම් |
| චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්. ඝාණ ප්‍රසාද | 40 | 17 | සොත ප්‍රසාද රූපය සොතායතන නම් ඝාණ ප්‍රසාද |
| මනායතන | 45 | 29 | ධම්මායතන |
| චෛතසික 25 ලැබෙති | 51 | 19 | චෛතසික තුන සමග චෛතසික 25 ලැබෙති |
| ආයනතන | 53 | 9 | ආයතන |
| කුසල් සිත් එකොළොසය | 54 | 33 | කුසල්සිත් සතළොසය |
| පන්තිස | 55 | 11 | සත්තිස |
| එකොළොසය | 61 | 6 | සතළොසය |
| සූතිස 24 | 61 | 16 | සූතිස 34 |
| තෙතිසය 37 | 75 | 2 | තෙතිසය 33 |

| | | | |
|---|---|---|---|
| තෙතිස 32 | 75 | 24 | තෙතිස 33 |
| නාම ආදිලබ්ධ | 76 | 5 | ආදි ලබ්ධ නාම |
| පන්තිස් | 76 | 6 | සමතිස් |
| නියතං | 81 | 3 | නියතා |
| ධාතුව ශාංශයෙන් 27 | 92 | 13 | ධාතු වශයෙන් සතළොස් වැදෑරුම් |
| චෛතසික 5 | 96 | 4 | චෛතසික 51 |
| තදලම්බනාද | 97 | 13 | තදලම්බන 11 ද |
| ඒ සමූහය | 109 | 15 | ඒ ධර්ම සමූහය |
| ත්‍රකනම්වේ ඉතිරි ත්‍රක | 110 | 28 | ත්‍රිකනම්වේ ඉතිරි ත්‍රික |
| ස්කන්ධ 4 ධාතු 8 | 119 | 5 | ස්කන්ධ 4 ආයතන 2 ධාතු 8 |
| ආනාසවා | 122 | 4 | අනාසවා |
| විප්පයුත්ත | 122 | 23 | විප්පයුත්ත |
| ආසංයෝජනීය | 127 | 3 | අසංයෝජනීය |
| විප්පයුත්තා | 129 | 20 | විප්පයුත්තා |
| අසංයෝජනයාපි | 129 | 20 | අසංයොජනීයාපි |
| ලෞකික සිත් 6 | 129 | 25 | ලෞකික සිත් 69 |
| ආගන්ථනීයා | 131 | 9 | අගන්ථනීයා |
| සත්‍ය 12 | 132 | 24 | සත්‍ය 2 |
| විපපයුත්තා | 133 | | විප්පයුත්තා |
| ඕසාචේව සම්මා | 136 | 12 | ඕසා චේව ධම්මා |
| අකුසල් සිත් සහ ලෝභ | 137 | 13 | අකුසල් සිත් 11 සහ ඕඝ ධර්ම හැර චෛතසික 14 ලැබෙති |
| චෛතසික 43 මොහ ද්වේෂ 4 | 138 | | චෛතසික 49 ද රූප 28 ලැබෙති |
| නිවරණව | 144 | 26 | නීවරණ |
| ආයතන 2 | 149 | 8 | ආයතන 12 |
| ධාතු 2 | 151 | 6 | ධාතු 7 |
| චිත්තධම්ම | 151 | 6 | චිත්ත ධම්මා |
| ධාතු 1 | 151 | 9 | ධාතු 11 |
| මේතසිකා | 157 | 17 | චේතසිකා |
| ආ චේතසිකා | 151 | 78 | අචේතසිකා |

| | | | |
|---|---|---|---|
| සත්‍ය 1 | 154 | 15 | සත්‍ය 2 |
| චිත්ත සමුට්ඨාන සහභූ සමුට්ඨාන | 156 | 19 | චිත්ත සංසට්ඨ සමුට්ඨාන |
| චිත්ත සංසය්ඨසමුට්ඨානා පරිවත්ති | 156 | 20 | චිත්ත සංසට්ඨ සමුට්-ඨානානු පරිවත්ති |
| සංසට්ඨා | 156 | 22 | සංසට්ඨ |
| අජ්ඣත්ති | 157 | 23 | අජ්ඣත්තික |
| දුකයට | 158 | 18 | දුකය |
| උපාදන උපාද සම්පයුත්ත | 162 | 1 | උපාදන උපාදන සම්පයුත්ත |
| සංකිලිට්ඨක | 166 | 21 | සංකිලිට්ඨක |
| චෛතසික 77 | 167 | 24 | චෛතසික 17 |
| ක්‍රියා සිත් 30 | 170 | 28 | ක්‍රියා සිත් 20 |
| පහාතබ්බා | 171 | 1 | පහාතබ්බ |
| සත්‍ය | 180 | 13 | සත්‍ය 2 |
| නිට්ඨතා | 181 | 10 | නිට්ඨිතා |

# පටුන

පිටුව


| | | | |
|---|---|---|---|
| | ප්‍රස්තාවනා | | iii |
| | සම්පාදිකාවගෙන් | | vii |
| | පුණ්‍යානුමෝදනාව | | xi |
| | තික මාතිකා (දෙවිස්ස),පාළි | | 1 |
| | දුක මාතිකා (සියය) පාළි | | 4 |
| | සුත්තන්ත මාතිකා (දෙසාලිස) පාළි | | 13 |
| | සබ්බත්තික මාතිකාව | | 17 |
| 1. | කුසල ත්‍රිකය | | 22 |
| 2. | වෙදනා ත්‍රිකය | ,, | 22 |
| 3. | විපාක ත්‍රිකය | ,, | 30 |
| 4. | උපාදිණ්ණ ,, | ,, | 34 |
| 5. | සංකිලිට්ඨ ,, | ,, | 39 |
| 6. | විතක්ක ,, | ,, | 43 |
| 7. | ප්‍රීති ,, | ,, | 47 |
| 8. | දස්සන ,, | ,, | 51 |
| 9. | දස්සන හේතු,, | ,, | 56 |
| 10. | ආචයගාමි ,, | ,, | 60 |
| 11. | සෙක්ඛ ,, | ,, | 64 |
| 12. | පරිත්ත ,, | ,, | 68 |
| 13. | පරිත්තාරම්මණ ,, | ,, | 72 |
| 14. | හීන ,, | ,, | 77 |
| 15. | මිච්ඡත්ත ,, | ,, | 81 |
| 16. | මග්ගාරම්මණ | ,, | 85 |
| 17. | උප්පන්න ,, | ,, | 89 |
| 18. | අතීත ,, | ,, | 93 |
| 19. | අතීතාරම්මණ , | ,, | 97 |
| 20. | අජ්ඣත්ත ,, | ,, | 101 |
| 21. | අජ්ඣත්තාරම්මණ | ,, | 104 |
| 22. | සනිදස්සන ,, | ,, | 108 |


## දුක මාතිකාව

### හේතු ගොච්ඡකය


| | | |
|---|---|---|
| 1. | හේතු දුකය | 111 |
| 2. | සහේතුක දුකය | 112 |
| 3. | හේතු සම්පයුත්ත දුකය | 113 |

4. හේතුචේව සහේතුක දුකය 114

5. හේතු හේතු සම්පයුත්ත දුකය 114

6. න හේතු සහේතුක දුකය 115

චූල්ලන්තර දුකය

7. සප්පච්චය දුකය 116

8. සංඛත දුකය 116

9. සනිදස්සන දුකය 117

10. සප්පටිඝ දුකය 118

11. රූපී දුකය 118

12. ලෝකිය දුකය 119

13. කෙන විඤ්ඤෙය්‍යා දුකය 120

ආසව ගොච්ඡකය

14. ආසව දුකය 121

15. සාසව දුකය 122

16. ආසව සම්පයුත්ත දුකය 122

17. ආසව සාසව දුකය 123

18. ආසව ආසව සම්පයුත්ත දුකය 124

19. ආසව විප්පයුත්තබොපන දුකය 125

සංයෝජන ගොච්ඡකය

20. සංයෝජන දුකය 126

21. සංයෝජනීය දුකය 127

22. සංයෝජන සම්පයුත්ත දුකය 128

23. සංයෝජනාචේව සංයෝජනීය දුකය 128

24. සංයෝජනීචේව සංයෝජන සම්පයුත්ත දුකය 128

25. සංයෝජන විප්පයුත්ත බෝපන දුකය 129

ගන්ථ ගොච්ඡකය

26. ගන්ථ දුකය 130

27. ගන්ථනීය දුකය 131

28. ගන්ථචේව සම්පයුත්ත දුකය 131

29. ගන්ථචේව ගන්ථනීය දුකය 132

30. ගන්ථචේව ගන්ථ සම්පයුත්ත දුකය 133

31. ගන්ථ විප්පයුත්ත දුකය 133

ඕඝ ගොච්ඡකය

32. ඕඝ දුකය 133

33. ඕඝනීය දුකය 135

34. ඕඝ සම්පයුත්ත දුකය 135
35. ඕඝා චේව ඕඝනීය දුකය 136
36. ඕඝාචේව ඕඝ සම්පයුත්ත දුකය 137
37. ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය 137

යෝග ගොච්ඡකය

38. යෝග දුකය 138
39. යෝගනීය දුකය 139
40. යෝග සම්පයුත්ත දුකය 139
41. යෝගාචේව යෝගනීය දුකය 140
42. යෝගචේව යෝග සම්පයුත්ත දුකය 141
43. යෝග විප්පයුත්ත යෝගනිය දුකය 141

නීවරණ ගොච්ඡකය

44. නීවරණ දුකය 142
45. නීවරණීය දුකය 143
46. නිවරණ සම්පයුත්ත දුකය 144
47. නීවරණාචේව නීවරණීය දුකය 144
48. නීවරණාචේව නීවරණ සම්පයුත්ත දුකය 145
49. නීවරණ විප්පයුත්ත නීවරණ දුකය 146

පරාමාස ගොච්ඡය

50. පරාමාස දුකය 146
51. පරාමට්ඨ දුකය 147
52. පරාමාස සම්පයුත්ත දුකය 148
53. පරාමාස පරාමට්ඨ දුකය 148
54. පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය 149

මහන්තර දුකය

55. සාරම්මණ දුකය 150
56. චිත්තා දුකය 151
57. චේතසික දුකය 151
58. චිත්ත සම්පයුත්ත දුකය 152
59. චිත්ත සංසට්ඨ දුකය 152
60. චිත්ත සමුට්ඨාන දුකය 153
61. චිත්ත සහභූ දුකය 154
62. චිත්තානු පරිවත්ති දුකය 154
63. චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය 155
64. චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකය 156

65. චිත්ත සංසට්ඨා සමුට්ඨානා පරිවත්ති දුකය 156
66. අජ්ඣත්තික දුකය 157
67. උපාද දුකය 158
68. උපාදින්න දුකය 158

උපාදන ගොච්ඡකය

69. උපාදන දුකය 159
70. උපාදනීය දුකය 160
71. උපාදන සම්පයුත්ත දුකය 160
72. උපාදනාචේව උපාදනීය 161
73. උපාදනාචේව උපාදන සම්පයුත්ත දුකය 162
74. උපාදන විප්පයුත්ත උපාදනීය දුකය 162

කිලෙස ගොච්ඡකය

75. කිලේස දුකය 163
76. සංකිලේසික දුකය 164
77. සංකිලිට්ඨ දුකය 164
78. කිලෙස සම්පයුත්ත දුකය 165
79. කිලෙසාචේව සංකිලෙසික දුකය 166
80. කිලෙසාචේව සංකිලිට්ඨ දුකය 166
81. කිලෙසාචේව කිලෙස සම්පයුත්ත දුකය 167
82. කිලෙස විප්පයුත්ත සංකිලෙසික දුකය 168

පිට්ඨි දුකය

83. දස්සනේන පහාතබ්බ දුකය 168
84. භාවනාය පහාතබ්බ දුකය 169
85. දස්සනේන පහාතබ්බ හේතු දුකය 170
86. භාවනාය පහාතබ්බා හේතු දුකය 171
87. සවිතක්ක දුකය 172
88. සවිචාර දුකය 173
89. සප්පීතික දුකය 173
90. පීති දුකය 173
91. සුඛ සහගත දුකය 174
92. උපෙක්ඛා දුකය 175
93. කාමාවචර දුකය 175
94. රූපාවචර දුකය 176
95. අරූපාවචර දුකය 177
96. පරියාපන්න දුකය 177
97. නීය්‍යානික දුකය 178
98. නියත දුකය 179
99. සඋත්තර දුකය 180
100. සරණ දුකය 180

දුකමාතිකා නිට්ඨිතා

# අභිධම්ම මාතිකා

## තිකමාතිකා (දෙවිස්ස) පාළි

පිටුව සිට

20 - 22) 1. කුසලා ධම්මා,
අකුසලා ධම්මා,
අව්‍යාකතා ධම්මා,

23 - 26) 2. සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා,
දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා,
අදුක්ඛම සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා.

26 - 28) 3. විපාකා ධම්මා,
විපාක ධම්ම ධම්මා.
නෙව විපාක න විපාක ධම්ම ධම්මා.

28 - 31) 4. උපාදින්නුපාදනියා ධම්මා,
අනුපාදින්නුපාදනියා ධම්මා,
අනුපාදින්න අනුපාදනියා ධම්මා.

32 - 33) 5. සංකිලිට්ඨ සංකිලෙසිකා ධම්මා,
අසංකිලිට්ඨ සංකිලෙසිකා ධම්මා,
අසංකිලිට්ඨ අසංකිලෙසිකා ධම්මා.

34 - 37) 6. සවිතක්ක සවිචාරා ධම්මා,
අවිතක්ක විචාර මත්තා ධම්මා,
අවිතක්ක අවිචාරා ධම්මා.

37 - 39) 7. පීති සහගතා ධම්මා,
සුඛ සහගතා ධම්මා,
උපෙක්ඛා සහගතා ධම්මා.

40 - 42) 8. දස්සනෙන පහාතබ්බා ධම්මා,
භාවනාය පහාතබ්බා ධම්මා,
නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා.

42 – 45) 9. දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා,
භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා,
නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා.

46 - 47 10. ආචය ගාමිනො ධම්මා,
අපචය ගාමිනො ධම්මා,
නෙවාචය ගාමිනො න අපචය ගාමිනො ධම්මා.

47 - 49) 11. සෙක්ඛා ධම්මා,
අසෙක්ඛා ධම්මා,
නෙව සෙක්ඛා නා සෙක්ඛා ධම්මා.

49 - 50) 12. පරිත්තා ධම්මා,
මහග්ගතා ධම්මා,
අප්පමාණා ධම්මා.

50 - 53) 13. පරිත්තරම්මණා ධම්මා,
මහග්ගතාරම්මණා ධම්මා,
අප්පමාණාරම්මණා ධම්මා.

53 - 55) 14. හීනා ධම්මා,
මජ්ඣිමා ධම්මා,
පණීතා ධම්මා.

55 - 57) 15. මිච්ඡත්ත නියතා ධම්මා,
සම්මත්ත නියතා ධම්මා,
අනියතා ධම්මා.

58 - 61) 16. මග්ගාරම්මණා ධම්මා,
මග්ග හෙතුකා ධම්මා,
මග්ගාධිපතිනො ධම්මා.

61 - 64) 17. උප්පන්නා ධම්මා,
අනුප්පන්නා ධම්මා,
උප්පාදිනො ධම්මා.

64 - 67) 18. අතීතා ධම්මා,
අනාගතා ධම්මා,
පච්චුප්පන්නා ධම්මා.

67 - 69) 19. අතීතාරම්මණා ධම්මා,
අනාගතාරම්මණා ධම්මා,
පච්චුප්පන්නාරම්මණා ධම්මා,

69 - 71) 20. අජ්ඣත්තා ධම්මා,
බහිද්ධා ධම්මා,
අජ්ඣත්ත බහිද්ධා ධම්මා.

71 - 74) 21. අජ්ඣත්තාරම්මණා ධම්මා,
බහිද්ධාරම්මණා ධම්මා,
අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා.

74 - 76) 22. සනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන අප්පටිඝා ධම්මා.

තික මාතිකා නිට්ඨිතා

# දුක මාතිකා (සියය) පාළි

පිටුව

77 1 - 1. හෙතු ධම්මා,
න හෙතු ධම්මා,

78 3 - 2. සහෙතුකා ධම්මා,
අහෙතුකා ධම්මා

78 3 - 3. හෙතු සම්පයුත්තා ධම්මා
හෙතු විප්පයුත්තා ධම්මා

79 4 - 4. හෙතු චෙව ධම්මා සහෙතුකා ච
සහෙතුකා චෙව ධම්මා න ච හෙතු

79 5 - 5. හෙතු චෙව ධම්මා හෙතු සම්පයුත්තා ච
හෙතු සම්පයුත්තා චෙව ධම්මා න ච හෙතු

79 6 - 6. න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි
න හෙතු ඛො පන ධම්මා අහෙතුකාපි.

හෙතු ගොච්ඡකං.

80 7 - 1. සප්පච්චයා ධම්මා
අප්පච්චයා ධම්මා

81 8 - 2. සංඛතා ධම්මා
අසංඛතා ධම්මා

81 9 - 3. සනිදස්සනා ධම්මා
අනිදස්සනා ධම්මා

81 10 - 4. සප්පටිඝා ධම්මා
අප්පටිඝා ධම්මා

81 11 - 5. රූපිනො ධම්මා
82 අරූපිනො ධම්මා

83 12 - 6. ලොකියා ධම්මා
ලොකුත්තරා ධම්මා

84 13 - 7. කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා
කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා.

චූල්ලන්තර දුකං

85 14 - 1. ආසවා ධම්මා,
නො ආසවා ධම්මා,

85 15 - 2. සාසවා ධම්මා
අනාසවා ධම්මා,

86 16 - 3. ආසව සම්පයුත්තා ධම්මා,
ආසව විප්පයුත්තා ධම්මා,

87 17 - 4. ආසවා චෙව ධම්මා සාසවා ච,
සාසවා චෙව ධම්මා නො ච ආසවා,

87 18 - 5. ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තා ච,
ආසව සම්පයුත්තා චෙව ධම්මා නොච ආසවා,

87 19 - 6. ආසව විප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි,
ආසව විප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපි,

ආසව ගොච්ඡකං.

88 20 - 1. සඤ්ඤොජනා ධම්මා,
නො සඤ්ඤොජනා ධම්මා,

89 21 - 2. සඤ්ඤොජනීයා ධම්මා,
අසඤ්ඤොජනීයා ධම්මා,

90 22 - 3. සඤ්ඤොජන සම්පයුත්තා ධම්මා,
සඤ්ඤොජන විප්පයුත්තා ධම්මා,

90 24 - 4. සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජනීයා ච,
සඤ්ඤොජනීයා චෙව ධම්මා නො ච
සඤ්ඤොජනා,

90 25 - 5. සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජන
සම්පයුත්තා ච,

සඤ්ඤොජන සම්පයුත්තා චෙව ධම්මා නොච
සඤ්ඤොජනා,

91 25 - 6. සඤ්ඤොජන විප්පයුත්තා ඛො පන ධම්මා සඤ්ඤොජනියා පි,
සඤ්ඤොජන විප්පයුත්තා ඛො පන ධම්මා අසඤ්ඤොජනියා පි.

සඤ්ඤොජන ගොච්ඡකං.

91 26 - 1. ගන්ථා ධම්මා,
නො ගන්ථා ධම්මා,

91 27 - 2. ගන්ථනියා ධම්මා,
අගන්ථනියා ධම්මා,

92 28 - 3. ගන්ථ සම්පයුත්තා ධම්මා,
ගන්ථ විප්පයුත්තා ධම්මා,

92 29 - 4. ගන්ථා චෙ ව ධම්මා ගන්ථනියා ච,
ගන්ථනියා චෙ ව ධම්මා නොච ගන්ථා,

93 30 - 5. ගන්ථා චෙව ධම්මා ගන්ථ සම්පයුත්තා ච,
ගන්ථ සම්පයුත්තා චෙව ධම්මා නොච ගන්ථා,

93 31 - 6. ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියාපි,
ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියාපි,

ගන්ථ ගොච්ඡකං.

9 32 - 1. ඔඝා ධම්මා,
නො ඔඝා ධම්මා,

94 33 - 2. ඔඝනියා ධම්මා,
අනොඝනියා ධම්මා,

95 34 - 3. ඔඝ සම්පයුත්තා ධම්මා,
ඔඝ විප්පයුත්තා ධම්මා,

95 35 - 4. ඔඝා චෙව ධම්මා ඔඝනියා ච,
ඔඝනියා චෙව ධම්මා නො ච ඔඝා,

95 36-5. ඔඝා චෙව ධම්මා ඔඝ සම්පයුත්තා ච,
ඔඝ සම්පයුත්තා චෙව ධම්මා නො ච ඔඝා,

96 37-6. ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනියා පි,
ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා අනොඝනියා පි.

ඔඝ ගොච්ඡකං.

97 38-1. යොගා ධම්මා,
නො යොගා ධම්මා,

97 39-2. යොගනියා ධම්මා,
අයොගනියා ධම්මා,

98 40-3. යොග සම්පයුත්තා ධම්මා,
යොග විප්පයුත්තා ධම්මා,

98 41-4. යොගා චෙව ධම්මා යොගනියා ච,
යොගනියා චෙව ධම්මා නො ච යොගා,

99 42-5. යොගා චෙව ධම්මා යොග සම්පයුත්තා ච,
යොග සම්පයුත්තා චෙව ධම්මා නො ච යොගා,

99 43-6. යොග විප්පයුත්තා ඛො පන ධම්මා යොගනියා පි,
යොග විප්පයුත්තා ඛො පන ධම්මා අයොගනියා පි,

යොග ගොච්ඡකං.

100 44-1 නීවරණා ධම්මා,
නො නීවරණා ධම්මා,

100 45-2. නීවරණියා ධම්මා,
අනීවරණියා ධම්මා,

101 46-3. නීවරණ සම්පයුත්තා ධම්මා
නීවරණ විප්පයුත්තා ධම්මා

102 47-4. නීවරණා චෙව ධම්මා නීවරණියා ච,
නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා,

102 48-5. නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්තා ච,
නීවරණ සම්පයුත්තා චෙව ධම්මා නොච නීවරණා.

102 49-6. නීවරණ විප්පයුත්තා ඛො පන ධම්මා නීවරණියාපි,
නීවරණ විප්පයුත්තා ඛො පන ධම්මා අනීවරණියාපි,

නීවරණ ගොච්ඡකං.

103 50-1. පරාමාසා ධම්මා,
නො පරාමාසා ධම්මා.

103 51-2. පරාමට්ඨා ධම්මා,
අපරාමට්ඨා ධම්මා.

104 52-3. පරාමාස සම්පයුත්තා ධම්මා,
පරාමාස විප්පයුත්ත ධම්මා,

104 53-4. පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච,
පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා.

105 54-5. පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි,
පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි,

පරාමාස ගොච්ඡකං.

105 55-1. සාරම්මණා ධම්මා,
අනාරම්මණා ධම්මා,

106 56-2. චිත්තා ධම්මා,
නො චිත්තා ධම්මා,

106 57-3. චෙතසිකා ධම්මා,
අචෙතසිකා ධම්මා,

106 58-4. චිත්ත සම්පයුත්තා ධම්මා,
චිත්ත විප්පයුත්තා ධම්මා,

107 59-5. චිත්ත සංසට්ඨා ධම්මා.
චිත්ත විසංසට්ඨා ධම්මා,

107 60-6. චිත්ත සමුට්ඨානා ධම්මා,
නො චිත්ත සමුට්ඨානා ධම්මා,

108 61- 7. චිත්තා සහභුනො ධම්මා,
නො චිත්ත සහභුනො ධම්මා,

108 62- 8. චිත්තානුපරිවත්තිනො ධම්මා,
නො චිත්තානුපරිවත්තිනො ධම්මා,

109 63- 9. චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා,
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා,

110 64-10. චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා,
නො චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා,

110 65-11. චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනො ධම්මා,
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනො ධම්මා

110 66-12. අජ්ඣත්තිකා ධම්මා,
බාහිරා ධම්මා,

111 67-13. උපාදා ධම්මා,
නො උපාදා ධම්මා,

111 68-14. උපාදින්නා ධම්මා,
අනුපාදින්නා ධම්මා.

මහන්තර දුකං.

112 69- 1. උපාදානා ධම්මා,
නො උපාදානා ධම්මා,

112 70-02. උපාදානියා ධම්මා,
අනුපාදානියා ධම්මා,

113 71-03. උපාදාන සම්පයුත්තා ධම්මා,
උපාදාන විප්පයුත්තා ධම්මා,

113 72-04. උපාදාන චෙව ධම්මා උපාදානියා ච,
උපාදානියා චෙව ධම්මා නො ච උපාදානා,

133 73-05. උපාදානා චෙව ධම්මා උපාදාන සම්පයුත්තා ච,
උපාදාන සම්පයුත්තා චෙව ධම්මා නොච උපාදානා,

114 74-06. උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා උපාදනියා පි,
උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා අනුපාදනියා පි,

උපාදන ගොච්ඡකං.

114 75- 1. කිලෙසා ධම්මා,
නො කිලෙසා ධම්මා,

115 76- 2. සංකිලෙසිකා ධම්මා,
අසංකිලෙසිකා ධම්මා,

115 77- 3. සංකිලිට්ඨා ධම්මා,
අසංකිලිට්ඨා ධම්මා,

116 78- 4. කිලෙස සම්පයුත්තා ධම්මා,
කිලෙස විප්පයුත්තා ධම්මා,

116 69- 5. කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච,
සංකිලෙසිකා චෙව ධම්මා නො ච කිලෙසා,

117 80- 6. කිලෙසා චෙව ධම්මා සංකිලිට්ඨා ච.
සංකිලිට්ඨා චෙව ධම්මා නො ච කිලෙසා,

117 81- 7. කිලෙසා චෙව ධම්මා කිලෙස සම්පයුත්තා ච,
කිලෙස සම්පයුත්තා චෙව ධම්මා නොච කිලෙසා,

117 82- 8. කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා සංකිලෙසිකාපි,
කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා
අසංකිලෙසිකා පි

කිලෙස ගොච්ඡකං.

118 83- 1. දස්සනෙන පහාතබ්බා ධම්මා,
න දස්සනෙන පහාතබ්බා ධම්මා,

118 84- 2. භාවනාය පහාතබ්බා ධම්මා,
න භාවනාය පහාතබ්බා ධම්මා,

119 85- 3. දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා,
න දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා,

120 86- 4. භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා,
න භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා,

120 87- 5. සවිතක්කා ධම්මා,
අවිතක්කා ධම්මා,

121 88- 6. සවිචාරා ධම්මා,
අවිචාරා ධම්මා,

121 89- 7. සප්පීතිකා ධම්මා,
අප්පීතිකා ධම්මා,

121 90- 8. පීති සහගතා ධම්මා,
න පීති සහගතා ධම්මා.

122 91- 9. සුඛ සහගතා ධම්මා,
න සුඛ සහගතා ධම්මා,

122 92-10. උපෙක්ඛා සහගතා ධම්මා,
න උපෙක්ඛා සහගතා ධම්මා,

123 93-11. කාමාවචරා ධම්මා,
න කාමාවචරා ධම්මා,

123 94-12. රූපාවචරා ධම්මා,
න රූපාවචරා ධම්මා,

124 95 13. අරූපාවචරා ධම්මා,
න අරූපාවචරා ධම්මා.

124 96-14. පරියාපන්නා ධම්මා,
අපරියාපන්නා ධම්මා,

124 97-15. නියයානිකා ධම්මා,
අනියයානිකා ධම්මා,

125 98-16. නියතා ධම්මා,
අනියතා ධම්මා,

126 99-17. සඋත්තරා ධම්මා,
අනුත්තරා ධම්මා,

126 100-18 සරණා ධම්මා,
අරණා ධම්මා.

පිට්ඨී දුකං

දුක මාතිකා නිට්ඨිතා

අභිධම්ම මාතිකා නිට්ඨිතා.

# සුත්තන්ත මාතිකා (දෙසාලිස) පාළි

1. විජ්ජාභාගිනො ධම්මා,
   අවිජ්ජාභාගිනො ධම්මා,
2. විජ්ජූපමා ධම්මා,
   වජිරූපමා ධම්මා,
3. බාලා ධම්මා,
   පණ්ඩිතා ධම්මා,
4. කණ්හා ධම්මා,
   සුක්කා ධම්මා
5. තපනීයා ධම්මා,
   අතපනීයා ධම්මා,
6. අධිවචනා ධම්මා,
   අධිවචනපථා ධම්මා,
7. නිරුත්ති ධම්මා,
   නිරුත්තිපථා ධම්මා,
8. පඤ්ඤත්ති ධම්මා,
   පඤ්ඤත්තිපථා ධම්මා,
9. නාමඤ්ච,
   රූපඤ්ච,
10. අවිජ්ජා ච,
    භව තණ්හා ච,
11. භව දිට්ඨි ච,
    විභව දිට්ඨි ච,
12. සස්සත දිට්ඨි ච,
    උච්ඡෙද දිට්ඨි ච,
13. අන්තවා දිට්ඨි ච,
    අනන්තවා දිට්ඨි ච,

14. පුබ්බන්තානු දිට්ඨී ච,
අපරන්තානු දිට්ඨී ච,

15. අහිරිකඤ්ච.
අනොත්තප්පඤ්ච,

16. හිරි ච.
ඔත්තප්පඤ්ච,

17. දොව චස්සතා ච,
පාපමිත්තතා ච.

18. සොවචස්සතා ච,
කල්‍යාණමිත්තතා ච,

19. ආපත්ති කුසලතා ච,
ආපත්ති වුට්ඨාන කුසලතා ච,

20. සමාපත්ති කුසලතා ච,
සමාපත්ති වුට්ඨාන කුසලතා ච,

21. ධාතු කුසලතා ච.
මනසිකාර කුසලතා ච,

22. ආයතන කුසලතා ච,
පටිච්චසමුප්පාද කුසලතා ච,

23. ඨාන කුසලතා ච,
අට්ඨාන කුසලතා ච,

24. අජ්ජවො ච,
මද්දවො ච,

25. ඛන්ති ච,
සොරච්චඤ්ච,

26. සාඛල්‍යඤ්ච,
පටිසන්ථාරො ච,

27. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච,
භොජනෙ අමත්තඤ්ඤුතා ච,

28. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච,
භොජනෙ මත්තඤ්ඤුතා ච.

29. මුට්ඨය සච්චඤ්ච,
අසම්පජඤ්ඤඤ්ච.

30. සති ච,
සම්පජඤ්ඤඤ්ච.

31. පටිසංඛාන බලඤ්ච,
භාවනා බලඤ්ච.

32. සමථො ච,
විපස්සනා ච.

33. සමථ නිමිත්තඤ්ච;
පග්ගාහ නිමිත්තඤ්ච,

34. පග්ගාහො ච.
අවික්ඛෙපො ච,

35. සීල විපත්ති ච,
දිට්ඨි විපත්ති ච,

36. සීල සම්පදා ච,
දිට්ඨි සම්පදා ච,

37. සීල විසුද්ධි ච.
දිට්ඨි විසුද්ධි ච,

38. දිට්ඨි විසුද්ධි ඛො පන,
යථා දිට්ඨිස්ස ච පධානං,

39. සංවෙගො ච සංවෙජනියෙසු ඨානෙසු,
සංවිග්ගස්ස ච යොනිසො පධානං,

40. අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු,
අප්පටිවානිතා ච පධානස්මිං,

41. විජ්ජා ච,
විමුත්ති ච,

42. ඛයෙ ඤාණං
අනුප්පාදෙ ඤාණන්ති.

සුත්තන්ත මාතිකා

මාතිකා නිට්ඨිතා.

ධර්ම සේනාපති අග්‍ර ශ්‍රාවක සාරිපුත්‍ර මහ රහතන් වහන්සේ විසින් දේශනා කරන ලද සුත්තන්ත මාතිකා පාළිය යි.

# සබ්බත්ථික මාතිකාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් අභිධර්ම දේශනාවෙහි පරමාර්ථ ධර්ම සතරක් වශයෙන් වදාළසේක. එය සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණයද යන සතරයි. සම්මුති සත්‍ය වශයෙන් ප්‍රඥප්තියද වදාළසේක. එහි ස්වරූපාර්ථ යෝනම්, ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ. ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වේ.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 රූපස්කන්ධ නම්. චෛතසික දෙපනස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි සමපණස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. සිත් 89 විඥානස්කන්ධ නම්. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වේ. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වෙති.

ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ෂුප්‍රසාද රූපය චක්ඛායතන නම්, සෝතප්‍රසාදරූපය සෝතායතන නම්, ඝාණප්‍රසාදරූපය ඝාණා යතන නම්, ජිව්හාප්‍රසාදරූපය ජිව්හායතන නම්, කායප්‍රසාද රූපය කායායතන නම්. වර්ණරූපය රූපායතන නම්, ශබ්දරූපය ශබ්දයතන නම්, ගන්ධ රූපය ගන්ධායතන නම්, රස රූපය රසායතන නම්, පඨවි තේජෝ වායෝ යන භූතරූප තුන ඵොට්ඨබ්බායතන නම්, සිත් 89 මනායතන නම්, චෛතසික 52 ආපෝධාතු, ඉත්ථින්ද්‍රිය රූප, පුරිසින්ද්‍රිය රූප, හදයරූප, ජීවිත රූප, පරිච්ඡේද රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්තිරූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතාරූප, අනිච්චතාරූප යන සුඛුම රූප 16 හා නිර්වාණය යන මේ ධර්ම සමූහය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 අතුරෙන් චක්ෂුප්‍රසාද රූපය චක්ඛුධාතු නම්, සෝත ප්‍රසාද රූපය සෝතධාතු නම්, ඝාණප්‍රසාද රූපය ඝාණධාතු නම්, ජිව්හාප්‍රසාද රූපය ජිව්හා ධාතු නම්, කාය ප්‍රසාද රූපය කායධාතු නම්, රූප අරමුණ රූපධාතු නම්, ශබ්ද අරමුණ ශබ්ද ධාතු නම්, ගන්ධ අරමුණ ගන්ධ ධාතු නම්, රස අරමුණ රස ධාතු නම්, පඨවි තේජෝ වායෝ යන භූත රූප තුන ඵොට්ඨබ්බ ධාතු නම්, චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්, සෝත විඤ්ඤාණ දෙසිත සෝත විඤ්ඤාණ ධාතු නම්, ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණ ධාතු නම්, ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතු නම්, කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ධාතු නම්. පඤ්චද්වාරාවජ්ජන සිත හා සම්පටිච්ඡන දෙසිත මනොධාතු නම්, අකුසල් සිත් 12 ද, මනොද්වාරාවජ්ජන සිත හා සන්තීරණ සිත් 3 ද, හසිතුප්පාද සිතද, යන ඉතිරි අහේතුක සිත් 5 ද, කාමසෝභන සිත් 24 ද, මහද්ගත සිත් 24 ද, ලෝකෝත්තර සිත් 8 ද යන සිත් 76 මනොවිඥාන ධාතු නම්. චෛතසික 52 ය සුඛුම රූප 16 ද, නිර්වාණයද ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

ආයඝී සත්‍යවශයෙන් සිවු වැදෑරුම් වේ. සත්‍ය වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 හා ලෞකික සිත් 81 ද, ඒ සමග යෙදෙන ලෝභය හැර චෛතසික 51 ද, දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්, නිර්වාණය නිරෝධ සත්‍ය නම්, ලෝකෝත්තර මාර්ග සිත් 4 හි යෙදෙන සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ගාංග අට මාර්ග සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් සිවුවැදෑරුම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද විසිනමය හා ඵල චිත්තෝත්පාද සත්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මේ දක්වූයේසංක්ෂේප ක්‍රමයට ස්වරූපාඛ්‍යයන් වේ.

ඊට අනතුරුව විස්තාර ක්‍රමයට ස්වරූප දක්වීමේ දී ලෝකෝත්තර සිත්වලදී පමණක් වෙනසක් ඇත්තේය. ලෝකෝත්තර සිත්හි ප්‍රථම ධ්‍යානික ලෝකෝත්තර සිත්වලදී

මෙහි පහත දැක්වෙන ක්‍රමය බලා ගැනීමෙන් එය පැහැදිලි වන්නේය. ප්‍රථම ධ්‍යානික ලෝකෝත්තර සිත් 8 හි පමණක් සෝවාන් ආදී මාර්ගඵල සිත්හි මාර්ගාඞ්ග 8 ම ලැබෙන්නේ යයිද, දුතිය ධ්‍යානය ලැබීමේදී සම්මාසංකප්ප මාර්ගාංගය වන විතක්කය දුතියධ්‍යාන සිතෙහි නැතිකළ බැවින් (භාවනා බලයෙන්) සම්මා සංකප්ප මාර්ගාංගය දුතිය, තතිය, චතුත්ථ, පංචම, ධ්‍යානාදීන් මාර්ග ඵල සිත්වල නොලැබෙන්නේය. වෙනස එයයි. ප්‍රථම ධ්‍යාන සෝවාන් මාර්ගාංගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සත්වරක්ද, ප්‍රථමධ්‍යාන සකෘදගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද ප්‍රථම ධ්‍යාන අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද ප්‍රථමධ්‍යාන අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත්දෙන සතරවරක්ද ලැබෙති. විස්තාර ක්‍රමයට ප්‍රථම ධ්‍යානයෙන් පසු මාර්ගාඞ්ග සතක් පමණක් ලැබෙති.

මාර්ග චිත්තෝත්පාද 29 ක් වූයේ මාර්ගාඞ්ග අට මාර්ග සත්‍යය වශයෙන් ගත් බැවින් මාර්ගාඞ්ග හැර ඉතිරි ධර්මවන මාර්ග චිත්තෝත්පාද 29 හා ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර් මුක්තවේ. ඉතිරි ධර්ම මාර්ග සත්‍යයට හෝ වෙන සත්‍යයකට හෝ ඒ ධර්ම සමූහය අයත් නොවේ. ඵල සිත්හි මාර්ග කෘත්‍යයක් නැත්තේය. ධර්මනියාමය අනුව එසේ වන්නේය. චිත්තෝත්පාද යනු චෛතසික ධර්ම සහිත සිතට චිත්තෝත්පාදයක් යයි ධර්මයෙහි භාවිත වේ. මෙම සබ්බත්තික මාතිකාව මනාව පුරුදු කරගන්නේනම්, ඉතාමත් ප්‍රයෝජන වන්නේය.

විස්තාර ක්‍රමයට ලෝකෝත්තර සිත් සියල්ල 67 ක් වේ.

| ධ්‍යාන ලාභී උතුමන්ට මාර්ග ඵල සිත් ලැබෙන අයුරු මෙහි පෙන්වා ඇත. | | ධ්‍යාන සිත් | සෝවාන් මාර්ග සිත් | සෝවාන් ඵල සිත් | සකෘදාගාමි මාර්ග සිත් | සකෘදාගාමි ඵලසිත් | අනාගාමි මාර්ගසිත් | අනාගාමි ඵලසිත් | අර්හත් මාර්ගසිත් | අර්හත් ඵලසිත් | | ලෝකෝත්තර සිත් සියල්ල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථම ධ්‍යාන | සිත් | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | = | 8 |
| ද්‍විතිය ධ්‍යාන | ,, | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | = | 8 |
| තතිය ධ්‍යාන | ,, | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | = | 8 |
| චතුත්ථ ධ්‍යාන | ,, | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | = | 8 |
| පඤ්චම ධ්‍යාන | ,, | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | = | 8 |
| | | 15 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | = | 40 |

රූපාවචර ධ්‍යාන සිත් 15 සහ අරූපාවචර සිත් 12 සමග මහද්ගත ලෝකෝත්තර සිත් සියල්ල 67 ක් වේ.

| පරමාර්ථ ධර්ම | සිත් | චෛතසික | රූප | නිබ්බාණ | | |
|---|---|---|---|---|---|---|
| සංක්ෂේප ක්‍රමයට – | 89, | 52, | 28, | 1, | – | 170 |
| විස්තාර ක්‍රමයට – | 121, | 52, | 28, | 1, | - | 202 |

සබ්බත්තික මාතිකා නිට්ඨිතා.

# කුසල ත්‍රිකය

කුසලා ධම්මා
අකුසලා ධම්මා
අබ්‍යාකතා ධම්මා යනුවෙනි

ත්‍රික මාතිකා දෙවිස්ස අතුරෙන් කුසල ත්‍රිකය පළමුකොට වදාළසේක. කෙසේ වදාළ සේක් ද යත්? කුසලා ධම්මා යනාදී වශයෙනි. එහි ස්වරූපාර්ථයෝ නම්, කුසලා ධම්මා, අනවද්‍ය ඉෂ්ට විපාක දීමේ ලක්ෂණ කොට ඇත්තා වූ, ධම්මා, සත්ව නොවන ජීවනොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්ම සමූහය නම්, කුසල් සිත් 21 ය, ඒවා සමග යෙදෙන චෛතසික 38 ය, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්, ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 38 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික 36 සංස්කාර ස්කන්ධ නම්. කුසල් සිත් 21 විඤ්ඤාණස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේය.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? කුසල් සිත් 21 මනායතන නම්, චෛතසික 38 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

ධාතු වශයෙන් දෙවැදෑරුම වන්නේ කෙසේද යත්? කුසල් සිත් 21 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 38 ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම වන්නේය.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික කුසල් සිත් 17 සහ එහි යෙදෙන චෛතසික 38 දුක්ඛ සත්‍ය නම්, ප්‍රථමධ්‍යානයෙන් යුත් සොවාන් මාර්ග සිතෙහි මාර්ගාඞ්ග අටම යෙදෙන බැවින් අටදෙන එක් වරක්ද, ඉතිරි

ධ්‍යානලාභී උතුමන්ගේ ධ්‍යාන සිත්වල විතක්කය නැති බැවින් සම්මා සංකප්ප මාර්ගාඞ්ගය හැර මාර්ගාඞ්ග සතක් ලැබෙති. ඒ ආකාරයට, සකෘදගාමි මාර්ගාඞ්ගයන්ද අට දෙන එක්වරක් සත්දෙන සතරවරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයන්ද අටදෙන එක් වරක් සත්දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ගයන්ද අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද ලැබෙති. ධ්‍යාන සහිත මාර්ග ඵල ලාභී ආර්යයන් වහන්සේලාට මාර්ගඵල සිත් ලැබෙන ආකාරය මෙසේ විස්තර වන්නේය. මාර්ගාඞ්ග අට මාර්ග සත්‍යය වන බැවින් මාර්ගාඞ්ග හැර ඉතිරි චෛතසික විසිඅට සහ සිත සත්‍ය වශයෙන් නොගන්නා බැවින් ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ 29 සහ ඵල චිත්තෝත්පාදයෝ 37 සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

2. අකුසලා ධම්මා - යන දුතිය පාදයාගේ ස්වරූපාර්ථයෝ නම්, සාවද්‍ය අනිෂ්ට විපාක දීම් ලක්‍ෂණ කොට ඇත්තාවූ, ධම්මා සත්ව නොවන ජීවයක් නොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්ම සමූහය නම්, අකුසල් සිත් 12 ද, ඒ සමග යෙදෙන චෛතසික 27 ය, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්, ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 27 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි, ඉතිරි චෛතසික 25 සංස්කාරස්කන්ධ නමි, අකුසල් සිත් 12 විඤ්ඤාණස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේය.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 මනායතන නමි. චෛතසික 27 ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 මනො විඤ්ඤාණ ධාතු නමි. චෛතසික 27 ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 හා ලෝභය හැර චෛතසික 26 දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්, මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

3. අබ්‍යාකතා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම - කුසලා කුසල වශයෙන් නොවදරා අන්‍ය ස්වභාවයකින් වදළාවූ, ධම්මා සත්ව නොවන ජීව නොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්ම සමූහය නම - විපාක සිත් 36 ය, කිරිය සිත් 20 ය, ඒ සමග යෙදෙන චෛතසික 38 ය, රූප 28 ය, නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්, ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්, ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 රූපස්කන්ධ නම්, චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික පනස සංස්කාරස්කන්ධ නම්, සිත් සියල්ල විඤ්ඤාණ ස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේය.

ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, යන 10 ද, සිත් සියල්ල මනායතනය මේ චෛතසික 38 සහ සුඛුමරූප 16 ද නිර්වාණයද ධම්මායතන නම් වන්නේය.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛුධාතු නම්, සෝත ප්‍රසාදරූපය සෝත ධාතු නම්, ඝාණ ප්‍රසාදරූපය ඝාණධාතු නම්, ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතු නම්, කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්. රූප අරමුණ රූපධාතු නම්. ශබ්ද අරමුණ ශබ්දධාතු නම්. ගන්ධ අරමුණ ගන්ධධාතු නම්. රස අරමුණ රසධාතු නම්. ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බධාතු නම්. චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණධාතු නම්. ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණධාතු නම්. ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ

ධාතු නම්. කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ධාතු නම්. සම්පටිච්ඡන දෙසිත හා පඤ්චද්වාරාවජ්ජන සිත මනොධාතු නම්. ඉතිරි සිත් 24 මනොවිඤ්ඤාණ ධාතු නම්, චෛතසික 38 හා සුඛුම රූප 16 ද, නිර්වාණයද ධම්මධාතු නම්, මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේය.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 ද, ලෞකික විපාක සිත් 32 ද, ක්‍රියා සිත් 20 ද, චෛතසික 35 ද, දුක්ඛ සත්‍ය නම්, නිර්වාණය නිරෝධ සත්‍ය නම්, ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ සත්‍ය වශයෙන් දෙවදෑරුම් වන්නේය.

මෙසේ පරමාර්ථ ධර්‍මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. එම ත්‍රික දේසනාව අතුරෙන් පළමුකොට දේසනා කරන ලද ත්‍රිකයට පරමාර්ථ ධර්‍ම සියල්ල ඇතුලත් කොට වදළසේක. කුසලයෙන් ආස්වාදයද, අකුසලයෙන් ආදීනවයද, අව්‍යාකතයෙන් නිස්සරණයද යනාදීවූ ආස්වාද ආදීනව නිස්සරණයන් පළමුකොට වදළසේක. නුවණැත්තන් විසින් කුසලයෙහි පිහිටා අකුසල් දුරුකොට නිවන් ලබා ගැනීමේ නයක්‍රමයද සලකා කුසල ත්‍රිකය වදරන ලද්දේය. මෙම ත්‍රිකය ප්‍රතිපත්ති ක්‍රමයද අනුව වදරන ලද්දේය.

ලෝකෝත්තර සිත්හි දක්වෙන සතර නාමස්කන්ධයන් තණ්හා දිට්ඨි දෙකට අයත් උපාදනයන්ට අරමුණු නොවන හෙයින් උපාදනස්කන්ධ වශයෙන් නොගනී. පඤ්චස්කන්ධය වශයෙන් ගන්නා ධර්‍ම පමණක් තණ්හා දිට්ඨි දෙකට අයත් උපාදන සංඛ්‍යාත කෙලෙසුන්ගෙන් අරමුණු කළහැකි බැවින් උපාදනස්කන්ධ යන නාමයෙන් ගනු ලැබේ.

මෙසේ මේ ධර්‍මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. සියලු පරමාර්ථ ධර්‍ම ඇතුළත් වන හෙයින් නිප්පදෙස ත්‍රික නම් වන්නේය.

කුසල ත්‍රිකය නිමි.

## 2. වේදනා ත්‍රිකය

කුසල ත්‍රිකයට අනතුරුව වේදනා ත්‍රිකය වදළසේක.

සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා
දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා
අදුක්ඛම සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම් – සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා, සැප වේදනාව හා සම්ප්‍රයුක්තවූ, ධම්මා සත්ව නොවන ජීව නොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම් – සුඛසහගත සිත් 63 ද, ඒවා සමග යෙදෙන වේදනා දෝසඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර චෛතසික 46 ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුන් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් තුන්වැදෑරුම්, සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? චෛතසික 46 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික 44 සංස්කාරස්කන්ධ නම්, සිත් 63 විඤ්ඤාණස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 63 මනායතන නම්, චෛතසික 46 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? සුඛ සහගත කාය විඤ්ඤාණ සිත කාය විඤ්ඤාණ ධාතු නම්, ඉතිරි සුඛ සහගත සිත් 62 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 46 ධම්මධාතු නම්, මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික සුඛ සහගත සිත් 31 සහ ඒ සමග යෙදෙන ලෝභය හැර චෛතසික 45 දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍යනම්,

සතර මාර්ග සුඛ සහගත සිත් 16 සමග යෙදුන සම්මාදිට්ඨි ආදී සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන තුන් වරක්ද, සකදාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වර ද සත්දෙන තුන්වරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත් දෙන තුන් වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත්දෙන තුන්වරක්ද, මාර්ග සත්‍ය නමි. ඉතිරි මාර්ග චිත්තෝත් පාදයෝ 28 හා ඵල චිත්තෝත්පාදයෝ 36 ද යන මේ ධර්ම සමූහය සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑ රුම් වේ. මෙහි සුඛ වේදනාවෙන් යුත් ධ්‍යාන මාර්ග ඵල පමණක් ගනු ලැබේ.

2. දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා යන දුතියපාදයාගේ ස්වරූපාර්ථයෝ නම්– දුක්ඛ සහගත සිත් 3 ද වේදනා ප්‍රීති ලෝභ දිට්ඨි මාන විචිකිච්ඡා හැර ඉතිරි චෛතසික 21 ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතුවශයෙන් තෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? දුක්ඛ සහගත සිත් 3 සමග යෙදෙන චෛතසික 21 අතුරෙන් සංඥාව සංඥා ස්කන්ධ නමි. ඉතිරි චෛතසික 20 සංස්කාර ස්කන්ධ නමි. දුක්ඛ සහගත සිත් 3 විඥානස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? දුක්ඛ සහගත සිත් 3 මනායතන නමි. එහි යෙදෙන චෛතසික 21 ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑ රුම් වේ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? දුක්ඛ සහගත කාය විඤ්ඤාණ සිත කාය විඤ්ඤාණ ධාතු නමි. දෞර්මනස් සිත් 2 මනොවිඤ්ඤාණ ධාතු නමි. එහි යෙදෙන චෛතසික 21 ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේද යත්? මෙහි යෙදෙන සිත් 3 හා චෛතසික 21 දුක්ඛ සත්‍ය නමි. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3. අදුක්ඛම සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්, උපෙක්ඛා සහගත සිත් 55 ද, වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ඡ පීති යන චෛතසික හැර ඉතිරි චෛතසික 46 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් සත් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම වන්නේ කෙසේද යත්? උපෙක්ඛා වේදනාවෙන් යුත් චෛතසික 46 අතුරෙන් සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික 45 සංස්කාරස්කන්ධ නම්. සිත් 55 විඥ්ඥාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? උපෙක්ඛා සහගත සිත් 55 මනායතන නම්. චෛතසික 46 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් සත්වැදෑරුම වන්නේ කෙසේද යත්? උපෙක්ඛා සහගත චක්ඛුවිඥ්ඥාණ දෙසිත චක්ඛුවිඥ්ඥාණ ධාතු නම්. සෝතවිඥ්ඥාණ දෙසිත සෝත විඥ්ඥාණ ධාතු නම්. ඝාණ විඥ්ඥාණ දෙසිත ඝාණ විඥ්ඥාණ ධාතු නම්. ජිව්හා විඥ්ඥාණ දෙසිත ජිව්හා විඥ්ඥාණ ධාතු නම්. සම්පටිච්ඡන දෙසිත හා පඤ්චද්වාරා වජ්ජන සිත මනො ධාතු නම්. ඉතිරි උපෙක්ඛා සහගත සිත් 44 මනොවිඥ්ඥාණ ධාතු නම්. වේදනා පීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර ඉතිරි චෛතසික 46 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් සත්වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? උපෙක්ඛා සහගත ලෞකික සිත් 47 සහ ලෝභය හැර චෛතසික 45 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. උපෙක්ඛා සහගත සතර මාර්ග සම්ප්‍රයුක්ත සිත් 4 ද එහි යෙදෙන සෝවාන් මාර්ගාඞ්ගයෝ සත්දෙනය, සකෘදගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙනය, අනාගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙනය, අර්හත් මාර්ගාඞ්ගයෝ සත්දෙනය යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය

නම් වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද 28 හා ඵල චිත්තෝත්පාද 35 සත්‍ය විනිර්මුක්ත වේ.

මෙසේ මේ ශබ්දවලි තොමෝ පරමාර්ථ ධර්‍මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නමි. පද තුනෙන්ම ලබන ලද නම් ඇති හෙයින් සර්ව ලබ්ධ නාම ත්‍රික නමි. මෙහි සුඛ වේදනාවෝ 63 ය, දුක්ඛ වේදනාවෝ තිදෙන ය, උපෙක්ඛා වේදනාවෝ 55 ය, රූප 28 ය, නිර්වාණය යන මේ ධර්‍ම සමූහය මේ ත්‍රිකයෙන් බැහැරවන හෙයින් සප්පදෙස ත්‍රික නම් වන්නේය.

වේදනා ත්‍රිකය නිමි.

# 3. විපාක ත්‍රිකය

වේදනා ත්‍රිකයට අනතුරුව විපාක ත්‍රිකය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්?

විපාකා ධම්මා
විපාක ධම්ම ධම්මා
නෙවවිපාක න විපාක ධම්ම ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - විපාකා ධම්මා යනු ඔවුනොවුන්ට විරුද්ධ වූ කුසලාකුසලයන්ගේ විපාකවූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්, කාම විපාක සිත් 23 ය. මහද්ගත විපාක සිත් 9 ය. ලෝකෝත්තර විපාක සිත් 4 ය. ඒවා හා යෙදෙන චෛතසික 38 ය. යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධවශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතුවශයෙන් අටවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික අට තිස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික සතිස සංස්කාර ස්කන්ධ නම්. විපාක සිත් 36 විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? විපාක සිත් 36 මනායතන නම්. චෛතසික 38 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටවැදෑරුම් වන්නේ කෙසේදයත්? විපාක සිත් 36 අතුරෙන් චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්. සෝත විඤ්ඤාණ දෙසිත සෝත විඤ්ඤාණ ධාතු නම්. ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණ ධාතු නම්. ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතු නම්. කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණධාතු නම්. සම්පටිච්ඡන දෙසිත හා පඤ්චද්වාරා සිත

මනො ධාතු නම්. ඉතිරි විපාක සිත් 24 මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික 38 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික විපාක සිත් දෙතිස හා එහි යෙදෙන චෛතසික 35 ද දුක්ඛ සත්‍ය නම්. ලෝකෝත්තර විපාක සිත් 4 හා චෛතසික 36 ද සත්‍ය විනිර්මුක්ත වේ.

2. විපාක ධම්ම ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපයෝ නම් – විපාක ධම්ම ධම්මා, විපාක උපදවන ස්වභාව ඇත්තාවූ සත්ව නොවන ජීව නොවන ස්වභාවධර්මයෝ ඇත්තාහ, අකුසල් සිත් 12 ද, කුසල් සිත් 21 ය, එහි යෙදෙන චෛතසික 52 ය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, සත්‍ය 3 ද වේ.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි, සංඥාව සංඥා ස්කන්ධ යයි, ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධයයි. අකුසල් සිත් 12 හා කුසල් සිත් 21 ක විඤ්ඤාණ ස්කන්ධ යයි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 සහ කුසල් සිත් 21 මනායතන නම්. එහි යෙදෙන චෛතසික 52 ධම්මායතන නම්.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 හා කුසල් සිත් 21 මනො විඤ්ඤාණ ධාතු නම්. එහි යෙදෙන චෛතසික 52 ධම්ම ධාතු නම්.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 හා ලෞකික කුසල් සිත් 17 ද, ලෝභය හැර චෛතසික 51 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මාර්ග සිත් 4 හි යෙදෙන සෝවාන් මාර්ගාඞ්ග අටදෙන එක් වරක්ද, සක්දෙන සතරවරක්ද, සකෘදාගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත්දෙන සතරවරක්ද, අනාගාමී මාර්ගාඞ්ගයෝ

අටදෙන එක් වරක්ද සත්දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත්දෙන සතරවරක්ද වේ. ඒ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් නෙවැදෑරුම් වේ.

3. නෙව විපාක න විපාක ධම්ම ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම් - නෙව විපාක න විපාක ධම්ම ධම්මා කුසලා කුසලයන්ගේ විපාකද නොවූ විපාක උපදවන ස්වභාවයද නැත්තාවූ ධම්මා සත්ව නොවන ජීවනොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. කිරිය සිත් 20 ද, එහි යෙදෙන චෛතසික 35 ද, රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් තෙලෙස් වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය රූපස්කන්ධ යයි. චෛතසික 35 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි. සංඥාව සංඥා ස්කන්ධ යයි. ඉතිරි චෛතසික 33 සංස්කාර ස්කන්ධ යයි. කිරිය සිත් 20 විඥ්ඥාණ ස්කන්ධ යයි. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්. සෝත ප්‍රසාද රූපය සෝතායතන නම්. ඝාණ ප්‍රසාද රූපය ඝාණා යතන නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතන නම්. කාය ප්‍රසාද රූපය කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. ශබ්ද අරමුණ ශබ්දයතන නම්. ගන්ධ අරමුණ ගන්ධායතන නම්. රස අරමුණ රසායතන නම්. පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බායතන නම්. කිරිය සිත් 20 ද, සුඛුම රූප 16 ද, චෛසික 35 ද, නිර්වාණ යද ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් 12 වැදෑරුම්වේ.

ධාතු වශයෙන් තෙළෙස්වැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛුධාතු නම්. සෝත ප්‍රසාද රූපය සෝතාධාතු නම්. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතු නම්.

ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතු නම්, කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්, රූප අරමුණ රූපධාතු නම්, ශබ්ද අරමුණ ශබ්ද ධාතු නම්, ගන්ධ අරමුණ ගන්ධ ධාතු නම්, රස අරමුණ රස ධාතු නම්, ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බ ධාතු නම්, පඤ්චද්වාරා වජ්ජන සිත මනො ධාතු නම්, ඉතිරි සිත් 19 මනොවිඤ්ඤාණ ධාතු නම්, සුඛුම රූප 16 ද චෛතසික 35 ද නිර්‍වාණයද ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙළෙස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 හා කිරිය සිත් 20 ද චෛතසික 35 ද, දුක්ඛ සත්‍ය නම්, නිර්‍වාණය නිරෝධ සත්‍ය නම්, මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. මේ ශබ්දවලි තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම්. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් කොට වදළ හෙයින් නිප්පදේස ත්‍රික නම් වේ.

විපාක ත්‍රිකය නිමි.

## 4 උපාදින්න ත්‍රිකය.

විපාක ත්‍රිකයට අනතුරුව උපාදින්නා ත්‍රිකය වදළසේක.

උපාදින්නු පාදනියා ධම්මා

අනුපාදින්නු පාදනියා ධම්මා

අනුපාදින්නු අනුපාදනියා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - උපදින්නු පාදනියා ධම්මා, අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් යුත් කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් ගන්නා ලද්දවූද, උපාදනියා, උපාදනයන්ට හිතවූද, ධම්මා, සත්ව නොවන ජීව නොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම් ලෞකික විපාක 32 ද එහි යෙදෙන චෛතසික 35 ද, කර්මජ රූප 20 ද යන මේ ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් 11 වැදෑරුම්, ධාතු වශයෙන් 17 වැදෑරුම්, සත්‍ය වශයෙන් 1 වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? කර්මජ රූප 20 රූපස්කන්ධයයි, චෛතසික 35 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්, ඉතිරි චෛතසික 33 සංස්කාර ස්කන්ධ නම්, ලෞකික විපාක 33 විඥ්ඥාණ ස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? ශබ්දයතනය හැර චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්, සෝත ප්‍රසාද රූපය සෝතායතන නම්, ඝාණ ප්‍රසාද රූපය ඝාණායතන නම්, ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතන නම්, කාය ප්‍රසාද රූපය කායායතන නම්, රූප අරමුණ රූපායතන නම්, ගන්ධ අරමුණ ගන්ධායතන නම්, රස අරමුණ රසායතන නම්, ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බායතන නම්, ලෞකික විපාක සිත් 32 මනායතන නම්, චෛතසික 35 ද සුඛුම රූප 9 ද, ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වේ.

ධාතු වශයෙන් සතළොස් 17 වැදෑරුම් වන්නේ කෙසේද යත් ? විසි(20)කර්මජ රූප අතුරෙන් චක්ඛු ප්‍රාසාදරූපය චක්ඛුධාතු නම්. සෝතප්‍රසාදරූපය සෝතධාතු නම්. ඝාණප්‍රසාද රූපය ඝාණධාතු නම්. ජිව්හාප්‍රසාද රූපය ජිව්හාධාතු නම්. කායප්‍රසාද රූපය කායධාතු නම්. රූප අරමුණ රූපධාතු නම්. ගන්ධ අරමුණ ගන්ධ ධාතු නම්. රස අරමුණ රසධාතු නම්. ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බ ධාතු නම්, චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්, සෝතවිඤ්ඤාණ දෙසිත සෝත විඤ්ඤාණ ධාතුනම්, ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුනම්, ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණධාතු නම්, කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණධාතුනම්, සම්පටිච්ඡන දෙසිත මනොධාතු නම්, ඉතිරි ලෞකික විපාක සිත් විස්ස මනොවිඤ්ඤාණ ධාතු නම්, චෛතසික පන්තිස (35) සහ සුඛුමරූප නවදෙන (9) ධම්මධාතු නම්, මෙසේ ධාතුවශයෙන් සතළොස් (17) වැදෑරුම් වේ.

සත්‍යවශයෙන් එක්වැදෑරුම්වන්නේ කෙසේද යත් ? ලෞකික විපාකසිත් දෙතිස (32) හා චෛතසික පන්තිස (35) විසි (20) කර්මජ රූපය දුක්ඛ සත්‍ය නම්. මෙසේ සත්‍යවශයෙන් එක් වැදෑරුම් වේ.

2 අනුපාදින්නුපාදනියා ධම්මා - අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් විසින් තමාගේ ඵලභාවයෙන් නොගන්නා ලද්දවූ එහෙත් උපාදනයන්ට හිතවූ ධම්මා, අකුසල් සිත් (12) ලෞකික කුසල්සිත් සතළොසය (17) කිරියසිත් විස්ස (20) එහි යෙදෙන චෛතසික දෙපනසය (52) චිත්තජ රූප සතළොසය (17) උතුජරූප පසළොසය (15) ආහරජරූප තුදුසය (14) යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්, ආයතන වශයෙන් සත්වැදෑරුම්, ධාතු වශයෙන් අටවැදෑරුම්, සත්‍යවශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේදයත්? චිත්තජරූප සතළොසය, උතුජරූප පසළොසය, ආහාරජරූප තුදුසය යන තිජරූප සියල්ල රූපස්කන්ධයයි. චෛතසික දෙපනස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නාම්, සංඥාව

සංඥස්කන්ධ නම්, ඉතිරි චෛතසික සමපනස සංස්කාරස්කන්ධ නම්, අකුසල් සිත් දොළස සහ ලෞකික කුසල්සිත් සතළොස. කිරියසිත් විස්ස විඥ්ඥාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වේ.

ආයතන වශයෙන් සත්වැදෑරුම්වන්නේ කෙසේදයත්? චිත්තජරූප සතළොසද උතුජරූප පසළොසද ආහාරජරූප තුදුසද, යන තිජරූපයන් අතුරෙන් රූප අරමුණ රූපායතන නම්, ශබ්ද අරමුණ ශබ්දයතන නම්, ගන්ධඅරමුණ ගන්ධායතන නම්, රසඅරමුණ රසායතන නම්, ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බායතන නම්, අකුසල්සිත් දොළස හා ලෞකික කුසල් සිත් සතළොස කිරියසිත් විස්ස යන මේ ධර්ම සමූහය මනායතන නම්, චෛතසික දෙපනස හා ආපොධාතු ආහාරරූප පරිච්ඡෙදරූප, කායවිඤ්ඤත්තිරූප, වචීවිඤ්ඤත්තිරූප ලහුතා රූප මුදුතාරූප, කම්මඤ්ඤතාරූප, උපචය සන්තති ජරතා අනිච්චතා යන සුඛුමරූප දෙළස ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් සත්වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටවැදෑරුම් වන්නේ කෙසේදයත්? තිජ රූපයන් අතුරෙන් රූප අරමුණ රූපධාතු නම්, ශබ්දඅරමුණ ශබ්ද ධාතු නම්, ගන්ධඅරමුණ ගන්ධධාතු නම්, රසඅරමුණ රසධාතු නම්, ඵොට්ඨබ්බඅරමුණ ඵොට්ඨබ්බ ධාතු නම්, පඤ්චද්වාරාවජ්ජණ සිත මනොධාතු නම්. අකුසල් සිත් දොළස(12) ලෞකික කුසල්සිත් සතළොසය (17) ඉතිරි කිරියසිත් එකුන්විස්සද (19) යන මේ ධර්ම සමූහය මනොවිඤ්ඤණ ධාතු නම්, චෛතසික දෙපනස (52) හා සුඛුමරූප දෙළස (12) යන මේ ධර්ම සමූහය ධම්මධාතු නම්, මෙසේ ධාතු වශයෙන් අටවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? අකුසල් සිත් දොළස (12) ලෞකික කුසල්සිත් සතළොස (17) කිරියසිත් විස්ස (20) ලෝභය හැර චෛතසික එක්පනස (51) තිජරූප යන මේ ධර්ම සමූහය දුක්ඛසත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

3 අනුපාදින්න්‍ණු අනුපාදනියාධම්මා - අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණාදෘෂ්ටීන්ගෙන් ලංකොට නොගත්නාලද්දවූ, උපාදනයන්ට අරමුණු නොවූද සත්ව නොවන ජීවයක් නොවන ස්වභාව ධර්මයෝ ඇත්තාහුය, ඒ ධර්‍මයෝ නම්-ලෝකෝත්තර සිත් අටය (8) එහි යෙදෙන චෛතසික සතිසය (36) නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේදයත්? චෛතසික සතිස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නමී, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික සූතිස(34) සංස්කාර ස්කන්ධ නම්, ලෝකෝත්තර සිත් අට විඤ්ඤාණස්කන්ධ නම්, නිර්වාණය ස්කන්ධ විනිර්මුක්තවේ. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෝකෝත්තර සිත් අට මනායතනනම්, චෛතසික සතිස හා නිර්වාණය ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් අට (8) මනොවිඤ්ඤාණධාතු නම්, චෛතසික සතිස (36) සහ නිර්වාණය ධම්ම ධාතු නම්, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? මාර්ග සිත් සතරෙහි යෙදෙන සෝවාන් මාර්ගාඩ්ගයෝ අටදෙන එක් වාරක්ද, සත්දෙන සතරවරක්ද සකදගාමිමාර්ගාඩ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද, අනාගාමිමාර්ගාඩ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද, අර්හත්මාර්ගාඩ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්දයි මෙසේ මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම් වේ. නිර්වාණය නිරෝධසත්‍ය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) හා ඵලචිත්තෝත්පාද සත්තිස (37) සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්යසත්‍යවශයෙන්

දෙවැදෑරුම් වේ. මෙසේ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධනාම ත්‍රිකනම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් මෙහි ඇතුලත්වන හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

උපාදිණ්ණ ත්‍රිකය නිමි.

## 5. සඞ්කිලිට්ඨ ත්‍රිකය.

උපාදින්ණ ත්‍රිකයට අනතුරුව සංකිලිට්ඨ ත්‍රිකය වදළසේක.

සඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා
අසඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා
අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසිකා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - සඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා, කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දවූද, සඞ්කිලෙසිකා, කෙලෙසුන්ට හිතවූද, ධම්මා, සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ අකුසල් සිත් 12 ය. චෛතසික 27 ය යන මෙ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති.

ස්කන්ධ වශයෙන් 4 ක් වන්නේ කෙසේද යත්? චෛතසික 27 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි, සංඥව සංඥ ස්කන්ධ ය යි, ඉතිරි චෛතසික 25 සංස්කාර ස්කන්ධ ය යි, අකුසල් සිත් 12 ය විඤ්ඤාණ ස්කන්ධ යයි, මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් 12 මනායතන නම්, චෛතසික 27 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 27 ධම්ම ධාතු නම්, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් 12 ද චෛතසික ලෝභය හැර 26 ද, දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්, මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 අසඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා-අසඞ්කිලිට්ඨ-කෙලෙසුන්ගෙන් නොකෙලෙසෙන ලද්දවූද, සඞ්කිලෙසිකා, කෙලෙසුන්ට අරමුණු වන්නාවූද, ධම්මා සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම්, ලෞකික කුසල් සිත් 17 ද, ලෞකික විපාක සිත් 32 ද, කිරිය සිත් 20 ද, ඒ සමග යෙදෙන චෛතසික 38 ද, රූප 28 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්, ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්, ධාතු වශයෙන් අටලොස් වැදෑරුම්, සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 රූපස්කන්ධයයි, චෛතසික 38 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධයයි, සංඥාව සංඥාස්කන්ධයයි, ඉතිරි චෛතසික 36 ද සංස්කාරස්කන්ධයයි, ලෞකික කුසල් සිත් 17 ද ලෞකික විපාක සිත් 32 ද, කිරිය සිත් 20 ද, යන මෙ ධර්ම සමූහය විඤ්ඤාණස්කන්ධ යයි, මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්, ඝාණ ප්‍රසාද රූපය ඝාණායතන නම්, ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතන නම්, කාය ප්‍රසාද රූපය කායායතන නම්, රූප අරමුණ රූපායතන නම්, ශබ්ද අරමුණ ශබ්දයතන නම්, ගන්ධ අරමුණ ගන්ධායතන නම්, රස අරමුණ රසායතන නම්, පොට්ඨබ්බාරම්මණය ඵොට්ඨබ්බායතන නම්, සිත් 69 මනායතන නම්, චෛතසික 38 සහ සුඛුම රූප 16 ද ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටලොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛුධාතු නම්, සෝත ප්‍රසාද රූපය සෝත ධාතු නම්, ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතු නම්, ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතු නම්, කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්. රූපාරම්මණය රූප ධාතු නම්, ශබ්දරම්මණය ශබ්ද ධාතු නම්. ගන්ධාරම්මණය ගන්ධ ධාතු නම්, රසාරම්මණය

රස ධාතු නම්, ඵොට්ඨබ්බාරම්මණය ඵොට්ඨබ්බ ධාතු නම්, චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛු විඤ්ඤාණ ධාතු නම්, සෝත විඤ්ඤාණ දෙසිත සෝත විඤ්ඤාණ ධාතු නම්, ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණ ධාතු නම්, ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතු නම්, කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ධාතු නම්, පඤ්චද්වාරා වජ්ජන සිත හා සම්පටිච්ඡන දෙසිත මනො ධාතු නම්, ඉතිරි සිත් 56 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 38 සහ සුඛුම රූප 16 ධම්ම ධාතු නම්, මෙසේ ධාතු වශයෙන් අටළොස්වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් අකුසල් සිත් 12 ද, ලෞකික කුසල් සිත් 17 ද, කිරිය සිත් 20 ද, ලෞකික විපාක සිත් 32 ද යන ලෞකික සිත් 81 ද චෛතසික 52 ද රූප 28 ද යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍ය නම්.

3 අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසිකා ධම්මා, අසඞ්කිලිට්ඨ, කෙලෙසුන් විසින් නො කෙලෙසෙන ලද්දවූද, අසඞ්කිලෙසිකා, කෙලෙසුන්ට හිත නොවූද, (අරමුණු නොවන්නාවූද) ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම් - ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද නිර්වාණය ද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද වේ.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික සතිස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ වේ, සංඥාව සංඥා ස්කන්ධ වේ, ඉතිරි චෛතසික 34 සංස්කාර ස්කන්ධ වේ. ලෝකෝත්තර සිත් 8 විඤ්ඤාණ ස්කන්ධ වේ, මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් 8 මනායතන නම්, චෛතසික 36 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් 8 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 36 ධම්ම ධාතු නම්, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග සිත් 4 හි යෙදෙන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද, සත්දෙන සතර වරක්ද, සකෘදාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද, සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක්ද සත්දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද, සත්දෙන සතර වරක්ද, මාර්ග සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස හා ඵල චිත්තෝත්පාද සත්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. මෙසේ මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම්, සියලු පරමාර්ථ ධර්මයන් ඇතුලත් කොට වදළ හෙයින් නිප්පදේස ත්‍රික නම් වේ.

මේ ත්‍රිකයෙහි සංකිලිට්ඨ යනු ලෝභ දෝස මෝහ මාන දිට්ඨි ථීන උඬච්ච අහිරික අනොත්තප්ප යන දස කෙලෙසුන් කරන කොට ගෙන කිලිට්වූ අකුසල් 12 සහ චෛතසික 27 ද, අසංකිලිට්ඨ යනු කුසල් සිත් 21 සහ විපාක සිත් 36 ද, ක්‍රියාසිත් 20 ද චෛතසික 38 ද නිර්වාණයද ලැබෙති. සංකිලෙසික යනු කෙලෙසුන්ට අරමුණු වන ලෞකික ධර්ම සියල්ලය. අසංකිලෙසික යනු කෙලෙසුන්ට අරමුණු නොවන ලෝකෝත්තර ධර්මයෝය. සංකිලිට්ඨ ත්‍රිකයට අයත් ධර්මයෝය.

සංකිලිට්ඨ ත්‍රිකය නිමි.

## 6 විතක්ක ත්‍රිකය

සඞ්කිලිට්ඨ ත්‍රිකයට අනතුරුව විතක්ක ත්‍රිකය වදාළ සේක.

සවිතක්ක සවිචාරා ධම්මා
අවිතක්ක විචාර මත්තා ධම්මා
අවිතක්ක අවිචාරා ධම්මා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම් - සවිතක්ක සවිචාරා ධම්මා, සවිතක්ක, විතක්ක සහිත ධර්මයෝය, සවිචාරා විචාර සහිත වූ ධම්මා, සත්ව නොවන ජීව නොවන ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම් - විතක්ක විචාර සහිත සිත් 55 ද විතක්ක විචාර දෙක හැර චෛතසික 50 ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් 4 ද, ආයතන 2 ද, ධාතු 3 ද, සත්‍ය 3 ද වේ.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 50 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්, ඉතිරි චෛතසික 48 සංස්කාර ස්කන්ධ නම්, විතක්ක විචාර සහිත සිත් 55 විඤ්ඤාණ ස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සවිතක්ක සවිචාර සිත් 55 මනායතන නම්, චෛතසික 50 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මනො ධාතු ත්‍රිකය මනො ධාතු නම්, ඉතිරි සිත් 52 මනො විඤ්ඤාණ ධාතු නම්, චෛතසික 50 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික සවිතක්ක සවිචාර සිත් සත් සාළිසය (47) ලෝභය හැර චෛතසික එකුන්පනස (49) දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි සම්මා වාචා ආදී සෝවාන් මාර්ගාඞ්ගයෝ සත්දෙනය,

සකදගාමි මාර්ගාඞගයෝ සත්දෙනය, අනාගාමි මාර්ගාඞගයෝ සත්දෙනය අර්හත් මාර්ගාඞගයෝ සත්දෙනය, යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ගචිත්තෝත්පාදයෝ අටවිසි දෙන හා ඵල චිත්තෝත්පාද සතිස් දෙන සත්‍ය විනිර්මුක්ත වේ.

2 අවිතක්ක විචාරමත්තා ධම්මා යන දුතියපාදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- දුතියධ්‍යාන සිත් එකොළොසය එහි යෙදෙන විතක්ක විචාර හැර සතිස් (36) චෛතසිකයෝය සවිතක්ක සවිචාර සිත්හි යෙදුනාවූ පස්පනස් (55) විතක්කයෝද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්, ආයතන වශයෙන් දෙවැදෑරුම්, ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි සූතිස් චෛතසිකයෝ සහ පස්පනස් විතක්කයෝ සංස්කාරස්කන්ධ නම්, දුතියධ්‍යාන සිත් එකොළොස විඤ්ඤාණස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? දුතිධ්‍යාන සිත් එකොළොස මනායතන නම්, සතිස් චෛතසිකයෝ සහ පස් පනස් විතක්කයෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදරුම් වන්නේ කෙසේද යත්? දුතිය-ධ්‍යාන සිත් එකොළොස මනොවිඤ්ඤාණ ධාතු නම්, සතිස් චෛතසික හා පස්පනස් විතක්කයෝ ධම්මධාතු නම්, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික දුතියධ්‍යාන සිත්තුන හා එහි යෙදෙන විචාරය හැර චෛතසික තෙතිස හා ලෞකික සිත්හි විතක්කයෝ සත්සාළිස දුක්ඛසත්‍ය නම්. සතරමාර්ග දුතියධ්‍යාන සිත් සමග යෙදුනාවූ (සම්මාසංකප්පය හැර) සෝවාන් මාර්ගාඞගයෝ සත්දෙනය,

සකදගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙනය, අනාගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙනය, අර්හත් මාර්ගාඞ්ගයෝ සත්දෙනය, ප්‍රථමධ්‍යාන සම්මා සංකප්ප සිවුදෙනය, යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම්, ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙනය ඵල චිත්තෝත්පාදයෝ පන්තිස්දෙනය ප්‍රථමධ්‍යාන විතක්කයෝ සිවුදෙනය යන මේ ධර්මයෝ සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

3 අවිතක්ක අවිචාරාධම්මා යන තතිය පාදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අවිතක්ක අවිචාර සිත් පස්පනසය එහි යෙදෙන සතිස් චෛතසිකයෝ හා දුතියධ්‍යාන සිත් එකොළොසෙහි යෙදුනාවූ විචාරයෝ එකොළොස් දෙනය (ඒ විචාර 11 විතක්කය සමග නොයෙදේ) අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්, ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්, ධාතු වශයෙන් සතළොස් වැදෑරුම්, සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය රූපස්කන්ධ නම්, සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි සූතිස් චෛතසිකයන් හා විචාරයෝ එකොළොස් දෙන සංස්කාර ස්කන්ධ නම්, අවිතක්ක අවිචාර සිත් පස්පනස විඥ්ඥාණස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වේ. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වේ.

ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන යන දසයද, අවිතක්ක අවිචාර සිත් පස්පනස මනායතනද, සතිස් චෛතසිකයන් හා විචාර චෛතසික එකොළොසද සූක්‍ෂුමරූප සොළසද නිර්වාණයද යන මේ ධර්මයෝ මනායතන නම්.

ධාතු වශයෙන් සතළොස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛුධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කායධාතු, රූපධාතු, ශබ්දධාතු, ගන්ධ ධාතු, රසධාතු, ඵොට්ඨබ්බ ධාතු යන

දසයද, චක්ඛුවිඤ්ඤාණ ධාතු සොත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු සහ ඉතිරි සිත් පන්සාළිස මනො විඤ්ඤාණ ධාතු වේ. සතිස් චෛතසික සහ ද්‍රුතියධ්‍යාන විචාර එකොළොසද, සුඛුම රූප එකොළොසද, නිර්වාණයද ධම්මධාතු නම් වේ. ධාතු වශයෙන් සතළොස්වැදැරුම් මේ. (මනොධාතු හැර)

සත්‍ය වශයෙන් තෙවැදැරුම් වන්නේ කෙසේද යත්? ලෞකික අවිතක්ක අවිචාර සිත් එක්තිස හා චෛතසික සතිස, ලෞකික ද්‍රුතියධ්‍යාන විචාරයෝ තිදෙන හා රූප විසිඅට දුක්ඛ සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. සතරමාර්ග අවි-තක්ක අවිචාර සමග යෙදුනාවූ සෝවාන් මාර්ගාඞ්ග සත්දෙන ආදී වූ මාර්ගාඞ්ග සමූහය මාර්ග සත්‍ය නම්, ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිස්ස හා ඵල චිත්තෝත්පාද පන්තිස් දෙනද ලෝකෝත්තර ද්‍රුතියධ්‍යාන විචාරයෝ අටදෙනද සත්‍ය විනිර් මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රිකනම්. සවිතක්ක සවිචාර සිත් පස්පනස සමග යෙදුන විචාර චෛතසික පස්පනස ඇතුලත් නොවන හෙයින් සප්පදෙසත්‍රික නම්.

මෙහි සවිතක්ක යන්නෙන් විතක්ක සමග යෙදෙන චිත්ත චෛතසික ලැබෙති. සවිචාර පදය එක්වූ විට විචාරය අත්හරින ලදී. ප්‍රථම පදයෙහි විතක්ක විචාර දෙකම අත්හරිනලදී. දෙවන පදයෙහි සවිතක්ක සිත් පස්පනසෙහි ඇති විතක්ක සමග තවත් විතක්කයක් නොයෙදෙන බැවින්, ඒ විතක්ක පස්පනස අවිතක්ක වන්නේය. ඒ සමග විචාරය ඇති බැවින් අවිතක්ක විචාරමාත්‍රයක් ඇතැයි ගත් හෙයින්, අවිතක්ක විචාරමත්තා යන පදයට ඒ විතක්කයෝ ඇතුලත් වෙති. ද්‍රුතියධ්‍යාන සිත් 11 හි යෙදුන විචාරය සමග තවත් විචාරයක් නොයෙදෙන නිසා ඒ විචාරයෝ අවිචාරයහ, භාවනා බලයෙන් පහවූ විතක්කයෝ අවිතක්ක වූහ. (මේ දක්වා පරමාර්ථ ධර්ම සියල්ල ගැනම ස්වරූප පැහැදිලි වූ බැවින් ඉදිරියට ස්වරූප බෙදීම පහසු වන්නේය.)

**විතක්ක ත්‍රිකය නිමි.**

# 1 පීති ත්‍රිකය

විතක්ක ත්‍රිකයට අනතුරුව පීති ත්‍රිකය වදාළසේක. කෙසේ වදාළ සේක්ද යත්?

පීති සහගත ධම්මා
සුඛ සහගත ධම්මා
උපෙක්ඛා සහගත ධම්මා, යනුවෙනි.

පීති ත්‍රිකයෙහි ස්වරූපාර්ථයෝ නම්:- පීති සහගතා ප්‍රීතිය සමග යෙදුනා වූ, ධම්මා, සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්‍ම සමූහයක් ඇත්තාහුය. සුඛ සහගතා, මානසික සුඛ වේදනාව හා යෙදුනා වූ ධම්මා, සත්ව නොවූ ජීවයක් නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. උපෙක්ඛා සහගතා, මැදහත් වේදනාවෙන් යුක්ත වූ (උපෙක්ඛාවෙන්) ධම්මා, සත්ව නොවූ ජීවයක් නොවූ ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහුය.

1 පීති සහගතා ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- පීති සහගත එක්පනස් (51) චිත්තයද පීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්චා විචිකිච්ඡා වර්ජිත සසාළිස් (46) චෛතසික යත් ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? සසාළිස් චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥව සංඥ ස්කන්ධ නම්. ඉතිරි චෛතසික සූසාළිස සංස්කාර ස්කන්ධ නම්. පීති සහගත සිත් එක්පනස (51) විඤ්ඤණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? පීති සහගත සිත් එක්පනස මනායතන නම්. චෛතසික සසාළිස ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? පීති සහගත සිත් එක්පනස මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික සසාළිස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික පීති සහගත සිත් සත්විස්ස (27) හා ලෝභය හැර චෛතසික පන්සාළිස දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. පීති සහගත සෝවාන් ආදී මාර්ග සිත් සමග යෙදුනාවූ මාර්ගාඞ්ග අටදෙන මාර්ග සත්‍ය නම්. ඉතිරි මාගී චිත්තෝත්පාද සතිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

2 සුඛ සහගත ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- සුඛ සහගත (63) තෙසැට චිත්තයද ඒ හා සමග යෙදෙන චෛතසික සුඛ වේදනාව සහ දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර සසාළිස් චෛතසිකයන් ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් තෙවැදෑරුම් වේ. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සුඛ වේදනා සමග යෙදෙන ධර්ම ස්වරූප වශයෙන් ගැනීමේදී වේදනාව බැහැර වේ. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික පන්සාළිස සංස්කාරස්කන්ධ නම්. සිත් තෙසැට විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් තෙසැට දෙන මනායතන නම්. චෛතසික සසාළිස ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත් ? සුඛ සහගත කාය විඤ්ඤාණ සිත කාය විඤ්ඤාණ ධාතු නම්. ඉතිරි සිත් දෙසැට දෙන මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික සසාළිස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සුඛ සහගත ලෞකික සිත් එක්තිස හා ලෝභය හැර චෛතසික තෙසාළිස දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සුඛ සහගත සෝවාන් මාර්ගාදී මාර්ග සිත් සමග යෙදෙන මාර්ගාඞ්ග අටදෙන මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෙෝ අටවිසි දෙන හා ඵල චිත්තෝත්පාද සතිස් දෙන සත්‍ය විනිර්-මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

3 උපෙක්ඛා සහගතා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- උපෙක්ඛා සහගත සිත් පස් පනස (55) ඒ සමග යෙදෙන වේදනා පීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික සසාළිසය (46) යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් සත් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? වේදනාව හැර, සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික පන්සාළිස සංස්කාර ස්කන්ධ නම්. සිත් පස් පනස විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වේ.

ආයතන .වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? උපෙක්ඛා සහගත සිත් පස්පනස මනායතන නම්. චෛතසික සසාළිස ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙ-වැදෑරුම් වේ.

ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු මනොධාතු යන පස හා ඉතිරි උපෙක්ඛා සහගත සිත් දෙසාළිස මනෝ විඤ්ඤාණ ධාතු නම් වේ. එහි යෙදෙන චෛතසික සසාළිස ධම්ම ධතු නම්. මෙසේ ධාතු වශයෙන් සත් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? උපෙක්ඛා සහගත ලෞකික සිත් සත් සාළිස හා ලෝභය හැර චෛතසික පන්සාළිස දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය

නමි. සතර මාර්ග සම්ප්‍රයුක්ත උපෙක්ඛා සහගත සිත් අටෙහි යෙදෙන සෝවාන් මාර්ගාදී මාර්ගාඞ්ගයෝ සත්දෙන මාර්ග සත්‍ය නමි. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ සවිසි දෙන හා ඵල චිත්තෝත්පාදයෝ තෙතිස් දෙන සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ.

ද්වේෂමූල දෙසිත දුක්ඛ සහගත කාය විඤ්ඤාණ සිත හා එහි යෙදෙන දෙවිසි චෛතසිකයන් සහ ප්‍රීති චෛතසික එක් පනස සුඛ වේදනා තෙසැටදෙනද, උපෙක්ඛා වේදනා පස්පනසද, අටවිසි රූපය සහ නිර්වාණයද යන මෙතෙක් ධර්මයෝ මේ ත්‍රිකයට ඇතුළත් නොවන හෙයින් සප්පදෙස ත්‍රික නම් වේ.

ප්‍රීති ත්‍රිකය නිමි.

# 8. දස්සන ත්‍රිකය

පීති ත්‍රිකයට අනතුරුව දස්සන ත්‍රිකය වදාළසේක, කෙසේ වදාළසේක්ද යත්?

දස්සනෙන පහාතබ්බා ධම්මා
භාවනාය පහාතබ්බා ධම්මා
නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා යනුවෙනි,

දස්සන ත්‍රිකයෙහි ස්වරූපාර්ථයෝ නම්:- දස්සනෙන, සෝවාන් මගින් පහාතබ්බා, පහකටයුතුවූ ධම්මා, සත්වනොවූ ජීව නොවූ ස්වභාවධර්මයෝ ඇත්තාහුය, භාවනාය - මතු මාර්ගත්‍රයෙන්, පහාතබ්බා, පහකටයුතුවූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාවධර්මයෝ ඇත්තාහුය. නෙව දස්සනෙන, සෝවාන් මගින් පහ නොකළ හැකිවූද, න භාවනාය, මතු මාර්‍ග ත්‍රයෙන්, පහාතබ්බා, නො පහකළ යුතුවූද, ධම්මා, සත්වනොවූ, ජීවනොවූ ස්වභාවධර්මයෝ ඇත්තාහුය.

දස්සනෙන පහාතබ්බා ධම්මා යන පළමු පදයේ ස්වරූපාර්‍ථ යෝ නම්:- සෝවාන් මගින් පහකරනු ලබන දිට්ඨිගත සම්ප- යුත්ත සිත් සතරය (4) විචිකිච්ඡා සහගත සිතය යන අකුසල් සිත් පහද (5) එහි යෙදෙන චෛතසික දෙවිසිදෙනද (22) දෝස මූලයෙහි යෙදෙන ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන චෛතසික පස්විස්ස (25) ලැබෙති. සෝවාන් මගින් තුනී කරනු ලබන අපායගාමී ශක්තියෙන් යුත් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි සහ දෝසමූල දෙසිතෙහිද යෙදෙන චෛතසික දෙවිස්සෙහිද, (22) (දිට්ඨි විචිකිච්ඡා, ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර) අපායගාමී ශක්තිය පහකරනු ලැබේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? සත්විසි චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි. ඉතිරි චෛතසික පස්විස්ස

සංස්කාරස්කන්ධ නම්. අකුසල් සිත් එකොළොස විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් එකොළොස මනායතන නම්. සත්විසි චෛතසික යෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් එකොළොස මනොවිඤ්ඤාණ ධාතු නම්. චෛතසික සත්විස්ස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුල් සිත් එකොළොස හා ලෝභය හැර ඉතිරි චෛතසික සවිසිදෙන දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 භාවනාය පහාතබ්බා ධම්මා යන දුතිය පදයේ ස්වරූපාර්ථයෝ නම්:- සකදගාමි මාර්ගයෙන් තුනීකරනු ලබන ඖලාරික දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය (4) දෝසමූල සිත් දෙකය (2) අනාගාමි මාර්ගයෙන් තුනී කරනු ලබන දිට්ඨිවිප්ප යුත්ත සිත් සතරෙහි (4) යෙදුන කාමරාගය සහ නිරවශේෂ වශයෙන් පහකරනු ලබන ද්වේෂමූල සිත් දෙකද (2) ද්වේෂමූලයෙහි යෙදෙන චෛතසික එකුන්විස්සද (19) යන මේ ධර්ම සමූහය අනාගාමි මාර්ගයෙන් පහකරනු ලැබෙති. අර්හත් මාර්ගයෙන් රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිද්‍යාවන් සමග යෙදුනාවූ දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර හා උද්ධච්ච සහගත සිතද එහි යෙදෙන දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන චෛතසික සය හැර ඉතිරි චෛතසික විසිඑක සහ ඉහතකී සිත් පහද යන මේ ධර්ම සමූහය අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් පහකරනු ලැබේ.

ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර ඉතිරි චෛතසික දෙවිස්ස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික විස්ස සංස්කාර ස්කන්ධ නම්. අකුසල් සිත් සත විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත මනායතන නම්. චෛතසික දෙවිස්ස ධම්මා යතන නම්. මෙසේ ආයතතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත මනො විඤ්ඤාණ ධාතු නම්. දෙවිසි චෛතසික යෝ ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත (7) සහ ලෝභය හැර චෛතසික එක්විස්ස (21) දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

3 නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- කුසල් සිත් එක් විස්සය (21) විපාක සිත් සතිසය (36) කිරිය සිත් විස්සය (20) ඒ සමග යෙදෙන චෛතසික අටතිසය (38) අටවිසි රූපයෝය, නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් (5) වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් (12) වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. (18) සත්‍ය වශයෙන් තෙ (3) වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික සතිස සංස්කාර ස්කන්ධ නම්. අටවිසි රූපය රූපස්කන්ධ නම්. කුසල් සිත් එක්විස්සද විපාක සිත් සතිසද, කිරිය සිත් විස්සද විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස්වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්. සෝත ප්‍රසාදරූපය සෝතායතන නම්. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතන නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතන නම්. කාය ප්‍රසාද රූපය කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. ශබ්ද අරමුණ ශබ්දයතන නම්. ගන්ධ අරමුණ ගන්ධායතන නම්. රස අරමුණ රසායතන නම්. පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බා යතන නම්. කුසල් සිත් එක්විස්ස, විපාක සිත් සතිසය, විසි ක්‍රියා සිත්ද මනායතන නම්. ආපෝ ධාතු ඉත්‍ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, පරිච්ඡෙද රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා රූප, උපචය, සන්තති, ජරතා, අනිච්චතා රූප යන සුඛුම රූප සොළසද චෛතසික අටතිසය, නිර්වාණයය යන මේ ධර්ම සමූහය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපයන් අතුරෙන් චක්ඛුප්‍රසාද රූපය චක්ඛුධාතු නම්. සෝතප්‍රසාද රූපය සෝතධාතු නම්. ඝාණප්‍රසාදරූපය ඝාණධාතු නම්. ජිව්හාප්‍රසාද රූපය ජිව්හාධාතු නම්. කායප්‍රසාදරූපය කාය ධාතු නම්. රූප අරමුණ රූපධාතු නම්. ශබ්ද අරමුණ ශබ්දධාතු නම්. ගන්ධ අරමුණ ගන්ධ ධාතු නම්. රස අරමුණ රසධාතු නම්. පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බ ධාතු නම්. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්. සොතවිඤ්ඤාණ දෙසිත සෝත විඤ්ඤාණ ධාතු නම්. ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණ ධාතු නම්. ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතු නම්. කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ධාතු නම්. සම්පටිච්ඡන දෙසිත හා පඤ්චද්වාරා වජ්ජනසිත මනොධාතු නම්. ඉතිරි විපාක සූවිස්ස හා කිරියසිත් දහනවය මනොවිඤ්ඤාණධාතු නම්. චෛතසික අටතිසය සුඛුමරූප සොළසය නිර්වාණය යන මේ ධර්ම සමූහය ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික කුසල් සිත් එකළොසය, ලෞකික විපාක සිත්

සිත් දෙතිසය, ක්‍රියා සිත් විස්සය, ඒ සමග යෙදෙන චෛතසික අටතිසය, අටවිසිරූපය යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍ය නම් වේ. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වේ. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි ආදි සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද, සකෘදාගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද, අනාගාමී මාර්ගාඞ්ග යෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන සතරවරක්ද, යන මෙතෙක් ධර්මයෝ මාර්ග සත්‍ය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස හා ඵල චිත්තෝත්පාදයෝ පන්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් නෙවැදෑරුම් වේ. මේ ත්‍රිකය මුල් පදයෙන් ලබනලද නාම ඇති හෙයින් ආදි ලබ්ධනාම ත්‍රික නම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

දස්සන ත්‍රිකය නිමි.

# 9. දස්සන හේතු ත්‍රිකය

දස්සන ත්‍රිකයට අනතුරුව දස්සන හේතු ත්‍රිකය වදාළසේක. කෙසේ වදාළ සේක්ද යත්?

දස්සනෙන පහාතබ්බ හේතුකා ධම්මා
භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා
නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා යනුවෙනි.

1 දස්සන හේතු ත්‍රිකයෙහි ස්වරූපාර්ථයෝ නම්:- සෝවාන් මගින් පහකටයුතු හේතු ඇති ධර්මයෝද, දෙවන පදයෙන් මතු මාර්ගත්‍රයෙන් පහකටයුතු හේතු ඇති ධර්මයෝද, තෙවන පදයෙන් සෝවාන් මගින් පහකටයුතු හේතු නැත්තාවූද, මතු මාර්ගත්‍රයෙන් පහකටයුතු හේතු නැත්තාවූද ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

දස්සනෙන පහාතබ්බ හේතුකා ධම්මා යන පළමු පදයේ ස්වරූපාර්ථයෝ නම්:- සෝවාන් මගින් නිරවශේෂ වශයෙන් පහකටයුතු හේතු සහිත දිට්ඨිගත සම්පයුත්ත සිත් සතරය (4) විචිකිච්ඡා සහගත සිතය (1) යන සිත් පහද (5) එහි යෙදෙන චෛතසික විසිඑක (21) හා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන තුනද, යන චෛතසික සූවිස්ස ලැබෙති. (විචිකිච්ඡා සිතෙහි යෙදෙන අවස්ථාවෙහි වූ මෝහය හැර)

සෝවාන් මගින් තුනීකටයුතු වූ අපාය ගාමිණීශක්තිය ඇත්තා වූ දිට්ඨි ගත විප්පයුත්ත සිත් සතර හා (4) ද්වේෂමූල දෙසිතද (2) දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර දෙවිසි 22 චෛතසිකය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? සත්විසි චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික පස්විස්ස සංස්කාරස්කන්ධ නම්. අකුසල් සිත් එකොළොස විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික සත්විස්ස ධම්මායතන නම්. අකුසල් සිත් එකොළොස මනායතන නම්.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? අකුසල් සිත් එකොළොස මනොවිඤ්ඤාණ ධාතු නම්. චෛතසික සත් විස්ස ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් එකොළොස සහ ලෝභය හැර චෛතසික සවිස්ස දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා යන ද්‍රිතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- සකදාගාමි මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් පහකටයුතු ඖදරික දිට්ඨි විප්පයුත්ත සිත් සතරය 4, ද්වේෂමූල දෙසිතය 2, අනාගාමි මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් පහකටයුතු ද්වේෂමූල දෙසිතය 2, කාමරාගයෙන් යුක් අවස්ථාවෙහි වූ දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය 4, අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් පහකටයුතු වූ රූපරාග අරූප රාග මාන උද්ධච්ච අවිද්‍යා සහගත අවස්ථාවෙහි වූ දිට්ඨිවිප්ප යුත්ත සිත් සතරය 4 උද්ධච්ච සහගත සිතද ඒ සිත් සමග යෙදුනා වූ චෛතසික විසිදෙකද, සියලුම අකුසල ශක්තීන්ද අර්හත් මාර්ගයෙන් පහකරනු ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික සමවිස්ස සංස්කාරස්කන්ධ නම්. අකුසල් සිත් සත විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත මනායතන නම්. චෛතසික දෙවිස්ස ධම්මා යතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික දෙවිස්ස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් සත හා ලෝභය හැර චෛතසික එක් විස්ස දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

3 නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- සෝවාන් මගින් හා මතු මාර්ග තුනෙන් පහකටයුතු හේතු නැත්තාවූ ස්වභාවධර්මයෝ ඇත්තාහුය. සතර මාර්ගයන් ගෙන්ම පහකටයුතු නොවන්නාවූ ස්වභාව ධර්මයෝ මේ පදයට ඇතුළත් වේ. එහි ස්වරූපාර්ථයෝ නම්:- කුසල් සිත් එක් විස්ස(21)විපාක සිත් සතිසය(36)ක්‍රියාසිත් විස්සය (20) ඒ සමග යෙදෙන චෛතසික අටතිසය 38 රූප අටවිස්සය (28) නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය රූපස්කන්ධ නම්. වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික සතිස සංස්කාර ස්කන්ධ නම්. සිත් සත්සැත්තෑව විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, ධම්මායතන යන ආයතන දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු සහ චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතු, ධම්ම ධාතු යන මේ ධර්ම සමූහය අටළොස් ධාතු නම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික කුසල් සිත් සතළොස ලෞකික විපාක සිත් දෙතිසය, ක්‍රියා සිත් විස්ස ඒ සමග යෙදෙන චෛතසික අටතිස අටවිසි රූපය යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍ය නමි. ලෝභය මේ පදයට අයත් නොවේ. නිර්වාණය නිරෝධ සත්‍ය නමි. සතර මාර්ග සම්ප්‍රයුක්ත සෝවාන් මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත් දෙන සතර වරක්ද, සකදාගාමි මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද මාර්ග සත්‍ය නමි. ඉතිරි මාර්ග චිත්තෝත් පාදයෝ එකුන්තිස සහ ඵල චිත්තෝත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නමි. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. මෝහමූල දෙසිතෙහි යෙදුන මෝහය තතිය පදයෙහි ගන්නා ලද්දේය. ප්‍රථම පදයෙන් විචිකිච්ඡා සිතෙහි යෙදුන මෝහය හා දුතිය පදයෙන් උද්ධච්ච සහගත සිතෙහි මෝහය බැහැර කරණ ලද්දේය. එහි තවත් හේතු ධර්මයක් නොමැති බැවින් ඒ මෝහයෝ දෙදෙන අහේතුක විය. ත්‍රික මුක්ත විය. මෙය නිප්පදෙස ත්‍රිකයකි.

දස්සන හේතු ත්‍රිකය නිමි.

## 10. ආචය ගාමි ත්‍රිකය.

දස්සන හේතු ත්‍රිකයට අනතුරුව ආචය ගාමී ත්‍රිකය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්?

ආචය ගාමිනො ධම්මා
අපචය ගාමිනො ධම්මා
නෙවාචය ගාමිනො න ආපචය ගාමිනො ධම්මා
යනුවෙනි.

ආචයගාමී ත්‍රිකයෙහි ස්වරූපාර්ථයෝ නම්:- ආචය ගාමිනො කර්‍ම ක්ලේශයන් විසින් රැස්කරනු ලබන්නා වූ හෙවත් චුති පටිසන්ධීන් ලබා දෙන්නා වූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්‍මයෝ ඇත්තාහුය. අපචයගාමිනො නිර්‍වාණය ලබාදෙන්නා වූ, ධම්මා සත්වනොවූ ජීව නොවූ ස්වභාවධර්‍මයෝ ඇත්තාහුය. නෙවාචය ගාමිනො, චුතිපටිසන්ධි ලබා නොදෙන්නාවූද, න අපචය ගාමිනො නිර්‍වාණය ලබා නොදෙන්නා වූද, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්‍මයෝ ඇත්තාහුය.

1 ආචය ගාමිනො ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අකුසල් සිත් දොළසය (12) ලෞකික කුසල් සිත් සතළොසය (17) ඒ සමග යෙදෙන චෛතසික දෙපනසය (52) යන මේ ධර්‍ම සමූහය ලැබෙති. සිවුවැදෑරුම් ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතුවශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික දෙපනස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥා ස්කන්ධ නමි. ඉතිරි චෛතසික සම්පනස සංස්කාර ස්කන්ධ නමි. සිත් එකුන් තිස විඥ්ඥාණ ස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් එකුන්තිස මනායතන නමි. චෛතසික දෙපනස ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් එකුන් තිස මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික දෙපනස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් දොළස සහ එහි යෙදෙන ලෝභය හැර චෛතසික එකොළොසය, ලෞකික කුසල් සිත් සතළොසය 17 එහි යෙදෙන චෛතසික අටතිසය යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 අපචය ගාමිනො ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්- මාර්ගසිත් සතර 4 හා ඒ සමග යෙදෙන චෛතසික සතිස (36) ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? සතරමාර්ග සම්ප්‍රයුක්ත වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික සූතිස 24 සංස්කාර ස්කන්ධ නම්. මාර්ග සිත් සතර විඤ්ඤාණ ස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග සිත් සතර මනායතන නම්. චෛතසික සතිස 36 ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග සිත් සතර මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික සතිස (36) ධම්මා ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑම් වේ.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේද යත්? සෝතාපත්ති මාර්ගාඞ්ග අටදෙනා එක් වරක්ද, සත් දෙන සතර වරක්ද, සකෘදගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතර වරක්ද, අනාගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සතර වරක්ද, අර්හත් මාර්ගඞ්ගයෝ අටදෙන එක්වරක් සත්

දෙන සතර වරක්ද, මාර්ග සත්‍ය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 නෙවාචය ගාමිනො න අපචය ගාමිනො ධම්මා - යන ත්‍රිය පදයාගේ සවරූපාර්ථය. නම්- විපාක සිත් සතිස (36) ය, ක්‍රියාසිත් විස්සද (20)ඒ සමග යෙදෙන චෛතසික අටතිස (38) රූප අටවිස්සය(28) නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ. සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

ස්කන්ධ වශයෙන්, අටවිසි රූපය රූපස්කන්ධ නම්, වේදනාව වේදනා ස්කන්ධ නම්, සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික සතිස 36 සංස්කාර ස්කන්ධ නම්, විපාක සිත් සතිස 36 හා ක්‍රියාසිත් විස්සද 20 විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතයතන ඝාණායතන, ජිව්හායතන, කායායතන යන පසද, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන රසායතන, පොට්ඨබ්බායතන, මනායතන, ධම්මායතන යන ආයතන දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කායධාතු යන පසද, රූපධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු, යන පසද, මනොධාතු, සහ චක්ඛුවිඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු යන විඤ්ඤාණ ධාතු පසද, ඉතිරි විපාක සිත් සූවිස්ස (24) සහ ක්‍රියා සිත් එකුන් විස්සද (19) මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික අටතිස (38) හා සුඛුමරූප සොළස (16) ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

ආයතන, ධාතු ආදිය පළමු ත්‍රිකයන්හි එන පරිදි වාක්‍ය ගලපා ක්‍රියයුතු බව සැළකුම මැනවි.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය සහ ලෞකික විපාක සිත් දෙතිස (32) ද විසි ක්‍රියා චිත්තයන්ද, ඒ සමග යෙදෙන ඉතිරි චෛතසික පන්තිසද දුක්ඛ සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. ලෝකෝත්තර විපාක සිත් සතර හා එහි යෙදෙන චෛතසික සතිස සත්‍ය විනිර් මුක්ත වේ. මේ ශබ්දවලිතොමෝ පදතුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්වේ. මුල්පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රිකනම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

ආචය ගාමි ත්‍රිකය නිමි.

# 11 සෙක්ඛ ත්‍රිකය

ආචය ගාමී ත්‍රිකයට අනතුරුව සෙක්ඛ ත්‍රිකය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්?

සෙක්ඛා ධම්මා
අසෙක්ඛා ධම්මා
නෙව සෙක්ඛා නා සෙක්ඛා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- සෙක්ඛා ත්‍රිවිධ ශික්ෂාවෙහි හික් මෙන්නාවූ (ශීල, සමාධි, ප්‍රඥා) සප්ත විධ ශෛක්ෂයන්ට (අර්හත් ඵලස්ථයින් හැර) අයත්වූ ධම්මා - සත්වයෙක් නොවූ, ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය, අසෙක්ඛා අශෛක්ෂයින්ට හෙවත් ත්‍රිවිධ ශික්ෂාවෙහි (ශීල, සමාධි, ප්‍රඥා) නිහික්මී අවසන්වූ අර්හත් ඵලයට පත් උතුමන්ට අයත්වූ ධම්ම සත්වයෙක් නොවූ ජීවයක් නොවූ, ස්වභාව ධර්මයෝ ඇත්තහුය

නෙව සෙක්ඛා නා සෙක්ඛා - ශෛක්ෂයින්ට අයත් නොවූද අශෛක්ෂයින්ට අයත් නොවූද ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

1 සෙක්ඛා ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අර්හත් ඵලය හැර ඉතිරි ලෝකෝත්තර සිත් සතය [7] ඒ සමග යෙදෙන සතිස් [36] චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෝකෝත්තර සිත් සත [7] සමග යෙදෙන වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛත සික සූතිස [34] සංස්කාර ස්කන්ධ නම්. ලෝකෝත්තර සිත් සත [7] විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෝකෝත්තර සිත් සත [7] මනායතන නම්. චෛතසික සතිස (36) ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෝකෝත්තර සිත් සත [7] මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික සතිස (36) ධම්ම ධාතු නම්.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේදයත්? මෙහි මාර්ග සිත් සතර සමග යෙදෙන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද, සත් දෙන සතර වරක්ද, සකෘදගාමි මර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතරවරක් ද මාර්ග සත්‍ය නම් වේ. ඉතිරි චෛතසික අටවිසි දෙන හා මාර්ගසිත් සතරද, ඵලචිත්තෝත්පාද තුන සතිස් චෛතසික සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

2 අසෙක්ඛා ධම්මා - යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අර්හත් ඵල චිත්තය හා ඒ සමග යෙදෙන චෛතසික සතිස ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ. ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ. ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ. සත්‍ය විනිර්මුක්තවේ. අර්හත් ඵල වශයෙන් ලැබෙන එකම චිත්තෝත්පාදයාගේ ස්වරූපාර්ථ වශයෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික සූතිස සංස්කාර ස්කන්ධ නම්. සිත විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ. ආයතන වශයෙන් අර්හත් ඵල සිත මනායතන නම්. චෛතසික සතිස ධම්මායතන නම්. ධාතු වශයෙන් අර්හත් ඵල සිත මනො විඤ්ඤාණ ධාතු නම්. සතිස් චෛතසිකයෝ ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ. සත්‍ය වශයෙන් මෙහි දැක්විය නො හැක. ඵලසිත සත්‍ය යන්ට අයත් නොවේ. ඵලචිත්තෝත් පාද සත්තිස සත්‍ය විනිර් මුක්ත වේ.

3 නෙව සෙක්ඛා නා සෙක්ඛා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- ලෞකික සිත් එක් අසූවය (81) ඒ හා සමග යෙදෙන චෛතසික දෙපනසය (52) රූප අට විස්සය (28) නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? අටවිසි රූපය රූපස්කන්ධ නම්. වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්, ඉතිරි චෛතසික සමපණස සංස්-කාර ස්කන්ධ නම්, සිත් අසූ එක (81) විඥ්ඥාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිරමුක්ත වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන පොට්ඨබ්බායතන යන ආයතන දසයද, සිත් අසූ එක මනා යතන නම්. චෛතසික දෙපනස හා සුඛුම රූප සොළස හා නිර්වාණය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු, චක්ඛු විඥ්ඥාණ ධාතු, සෝත විඥ්ඥාණ ධාතු, ඝාණ විඥ්ඥාණ ධාතු, ජිව්හා විඥ්ඥාණ ධාතු, කාය විඥ්ඥාණ ධාතු සහ මනො ධාතු ත්‍රිකයද, මනො විඥ්ඥාණ සිත් හැට අට මනො විඥ්ඥාණ ධාතු නම් වේ. ඒ සිත් සමග යෙදෙන චෛතසික දෙපනස (52) සහ සුඛුම රූප සොළස හා නිර්වාණය ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෞකික සිත් අසූ එක (81) හා ඒ හා සමග යෙදෙන ලෝභය හැර චෛතසික එක් පනස (51) ද රූප අටවිස්සද (28) දුක්ඛ

සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්, නිර්වාණය නිරෝධ සත්‍ය නම්, මෙසේ ආය්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ. මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ බැවින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. ලෝකෝත්තර සිත් මේ ත්‍රිකයෙන් බැහැර කළ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

සෙක්ඛ ත්‍රිකය නිමි.

# 12 පරිත්ත ත්‍රිකය

සෙක්ඛ ත්‍රිකයට අනතුරුව පරිත්ත ත්‍රිකය වදළසේක, කෙසේ වදළසේක්ද යත්?

පරිත්තා ධම්මා
මහග්ගතා ධම්මා
අප්පමාණා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:– පරිත්තා අල්ප අනුභාව ඇත්තාවූ ධම්මා, සත්වයෙක් නොවූ ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. මහග්ගතා - කාම ධර්මයන්ට වඩා උසස් බවට මහත් බවට පමුණුවන්නාවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. අප්පමාණා, අති උතුම් ප්‍රමාණ කළ නොහැකි නිර්වාණයට පමුණුවන්නාවූ ධම්මා සත්ව නොවූ, ජීවයක් නොවූ, ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

1 පරිත්තා ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම් කාමාවචර සිත් සිවු පනසය[54] ඒ සමග යෙදෙන චෛත සික දෙපනසය [52] අටවිසි රූපය [28] යන මේ ස්වභාව ධර්ම යෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අට ළොස් වැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි [28] රූපය රූපස්කන්ධ නම්. වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥාස්කන්ධ නම්. ඉතිරි චෛතසික සම පනස [50] සංස්කාර ස්කන්ධ නම්. සිත් සිවු පනස විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායා යතන, යන පසද, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසා යතන, පොට්ඨබ්බායතන යන පසද, සිත් සිවු පනස මනා

යතන ද වේ. චෛතසික 52 සහ සුඛුම රූප සොළොස ධම්මා යතන වේ. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු, යන ධාතු, දසයද, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතුද වේ. චෛතසික දෙපනස සහ සුඛුම රූප සොළස ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ. (පළමු පරිදි වාක්‍ය ගලපා කියයුතු බව කරුණාවෙන් සැළකුව මැනවි)

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? කාමාවචර සිත් සිවු පනසද [54] ලෝභය හැර චෛතසික එක් පනසද [51] අටවිසි රූපයද දුක්ඛ සත්‍ය නමි. ලෝභය සමුදය සත්‍ය නමි. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 මහග්ගතා ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්: මහග්ගත සිත් සත් විස්සය [27] ඒ සමග යෙදෙන චෛතසික පන්තිසය [35] යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්, ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? පන්තිස් චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි, ඉතිරි චෛතසික තෙතිස [33] සංස්කාර ස්කන්ධ නමි, මහග්ගත සිත් සත් විසි දෙන [27] විඤ්ඤාණ ස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්ගත සිත් සත් විසි දෙන මනායතන නමි. පන්තිස් චෛතසිකයෝ ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්-ගත සිත් සත් විසිදෙන මනො විඤ්ඤාණ ධාතු නමි. පන්තිස් චෛතසිකයෝ ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්ගත සිත් සත් විසි දෙන සහ පන්තිස් චෛතසිකයෝ දුක්ඛ සත්‍ය නමි. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 අප්පමාණා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්: ලෝකෝත්තර සිත් අට (8) සහ ඒ සමග යෙදෙන චෛතසික සතිස (36) සහ නිර්වාණය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුමි. ධාතු වශයෙන් දෙවැදෑරුමි. සත්‍ය වශයෙන් දෙවැදෑරුමි.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික සතිස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි. ඉතිරි චෛතසික සූතිස (34) සංස්කාර ස්කන්ධ නමි. ලෝකෝත්තර සිත් අට (8) විඤ්ඤාණ ස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නෙ කෙසේද යත්? ලෝකෝත්තර සිත් අට මනායතන නමි. එහි යෙදෙන සතිස් චෛතසිකයෝ හා නිර්වාණය ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් අට මනො විඤ්ඤාණ ධාතු නමි. සතිස් චෛතසිකයන් හා නිර්වාණය ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නෙ කෙසේදයත්? නිර්වා-ණය නිරෝධ සත්‍ය නම් වේ. සතර මාර්ග සම්ප්‍රයුක්ත මාර්ගා-ඞ්ගයෝ අටදෙන මාර්ග සත්‍ය නම් වේ. මාර්ග චිත්තෝත්පාදයෝ එකුන් තිස හා ඵලචිත්තෝත්පාදයෝ සත් තිස සත්‍ය

විනිර් මුක්තවේ. මේසේ ආයඝී සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. මේ ශබ්දවලි තොමෝ පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. සියලු පාරමාර්ථ ධර්ම ඇතුළත් කළ හෙයින් නිප්ප දෙස ත්‍රික නම් වේ.

පරිත්ත ත්‍රිකය නිමි.

# 13 පරිත්තාරම්මණ ත්‍රිකය

පරිත්ත ත්‍රිකයට අනතුරුව පරිත්තාරම්මණ ත්‍රිකය වදාළ සේක. කෙසේ වදාළ සේක්දයත්?

පරිත්තාරම්මණා ධම්මා
මහග්ගතාරම්මණා ධම්මා
අප්පමාණා රම්මණා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම: පරිත්තාරම්මණා, කාමාවචර ධර්මයන් අරමුණු කොට ඇත්තාවූ ධම්මා-සත්වයෙක් නොවූ, ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. මහග්ගතා රම්මණා මහග්ගත ධර්මයන් අරමුණු කොට ඇත්තාවූ, ධම්මා-සත්වයෙක් නොවූ ජීවයක් නොවූ ස්වභාව ධර්ම සමූහයෝ ඇත්තාහුය. අප්පමාණා රම්මණා නිර්වාණය අරමුණ කරන්නාවූ ස්වභාව ධර්ම සමූහයෝ ඇත්තාහුය.

1 පරිත්තාරම්මණා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- කාම ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ කාම විපාක සිත් තෙවිසි දෙනද පඤ්චද්වාරා වජ්ජන සිත හා හසිතුප්පාදයද, ඒ සමග යෙදෙන චෛතසික තෙතිසද (33) දවේ.

කාම ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ හසිතුප්පාදය හැර කාම ජවන් අටවිස්සද (28) අකුසල් දොළසද (12) මහා කුසල් අටය (8) මහා කිරිය අටය 8 මනොද්වාරා වජ්ජනයද, අභිඥා කෘත්‍යවත් පඤ්චම ධ්‍යාන කුසල් සිත හා ක්‍රියා සිතද, ඒ සමග යෙදෙන කරුණා මුදිතා හැර චෛතසික **සම පනසද** යන මේ ස්වභාව ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේයදත්? කරුණා මුදිතා යන චෛතසික දෙක හැර සමපනස් චෛත

සිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික අට සාළිස (48) සංස්කාර ස්කන්ධ නම්. ඒකාන්ත අනේකාන්ත වශයෙන් ගන්නා සිත් පනස් සය (56) විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ඒකාන්ත, අනේකාන්ත වශයෙන් ගන්නා සිත් පනස් සය(56) මනායතන නම්. එහි යෙදෙන කරුණා මුදිතා හැර චෛතසික සමපනස (50) ධම්මා යතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නේ කෙසේදයත්? මේ පදයට ඇතුළත් සිත් පනස් සය [56]අතුරෙන් චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛු විඤ්ඤාණ ධාතු නම්. සෝත විඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතු නම්. ඝාණ විඤ්ඤාණ දෙසිත ඝාණ විඤ්ඤාණ ධාතු නම්. ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතුනම්. කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ධාතු නම්. පඤ්චද්වාරා වජ්ජනය සහ සම්පටිච්ඡන දෙසිත මනොධාතු නම්. ඉතිරි සිත් තෙසාළිස [43] මනෝ විඤ්ඤාණ ධාතු, නම්. චෛතසික සමපනස [50] ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අට [8] වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? සිත් පනස් සය 56 සහ ලෝභය හැර ඉතිරි චෛතසික එකුන් පනස [49] ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 මහග්ගතාරම්මණා ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- මහග්ගත ධර්ම ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ, විඥානඤ්චායතන, නෙවසඤ්ඤානා සඤ්ඤ යතන සිත් සයය, ඒ සමග යෙදෙන චෛතසික තිසද වේ. මහග්ගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ හසිතුප්පාද සිත හැර කාම ජවන් අටවිස්සය [28] මනොද්වාරා වජ්ජන සිත හා අභිඥා දෙසිතද ඒ සමග යෙදෙන විරති අප්පමඤ්ඤා හැර

චෛතසික සත් සාළිසය, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ. ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ. ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ. සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්ගත ධර්මයන් ඒකාන්ත වශයෙන් හා අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මහග්ගත සිත් 6 හා කාම ජවන් අට විසි දෙන සහ අභිඥා දෙසිතද ඒහා යෙදෙන චෛතසික සත් සාළිස [47] අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික පන් සාළිස [45] සංස්කාර ස්කන්ධ නම්. සිත් සියල්ල [සතිස 36] විඥ්ඥාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම වන්නේ කෙසේදයත්? මහග්ගත ධර්ම අරමුණු කරන සිත් සතිස් දෙන [36] මනායතන නම්. එහි යෙදෙන චෛතසික සත් සාළිස [47] ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්ගත ධර්ම ඒකාන්ත අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ සිත් සතිස් දෙන 36 මනොවිඥ්ඥාණ ධාතු නම් වේ. ඒ හා සමග යෙදෙන චෛතසික සත් සාළිස 47 ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මහග්ගත ධර්මයන් අරමුණු කරන සිත් සතිස 36 හා ලෝභය හැර චෛතසික සසාළිස 46 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 අප්පමාණාරම්මණා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අප්‍රමාණ්‍ය ධර්මයන් නිර්වාණය ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ ලෝකෝත්තර සිත් අටය (8) ඒ සමග යෙදෙන චෛතසික සතිසය (36) අප්‍රමාණ්‍ය ධර්යන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ. මහා කුසල් මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුත්ත සිත් අටය [8] මනොද්වාරා වජ්ජන

සිතය, අභිඥා දෙසිතය ඒ සමග යෙදෙන විරති 3 අපපමඤ්ඤ 2 හැර චෛතසික තෙතිසය (37) යන මේ ධර්ම සමූහය ලැබෙති ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? අප්‍රමාණ්‍ය ධර්මය වූ නිර්වාණය අරමුණු කරන්නාවූ ඒකාන්ත අනේකාන්ත සිත් සියල්ල එකුන් විස්සකි. (19) ඒ හා යෙදෙන චෛතසික සතිසකි. (36) ඒ ධර්ම අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි. ඉතිරි චෛතසික සූතිස සංස්කාර ස්කන්ධ නමි. සිත් එකුන් විස්ස (19) විඤ්ඤාණ සකන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

අයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අප්‍රමාණ්‍ය ධර්මයන් අරමුණු කරන්නාවූ සිත් එකුන් විස්ස (19) මනායතන නමි. චෛතසික සතිස ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? අප්‍රමාණ්‍ය ධර්මයන් අරමුණු කරන්නාවූ සිත් එකුන් විසස (19) මනො විඤ්ඤාණ ධාතු නමි. ඒ හා සමග යෙදෙන චෛතසික සතිස (36) ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? ලෞකික සිත් එකොළොස (11) හා ඒසමග යෙදෙන චෛතසික තෙතිස (32) දුක්ඛ සත්‍ය නමි. ලෝකෝත්තර ධර්මයන් ඒ කාන්තයෙන් අරමුණු කරන්නාවූ මාර්ග සිත් සතරෙහි යෙදෙන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, සකෘදගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද මාර්ග සත්‍ය නමි. ඉතිරි මාර්ග චිත් තෝත් පාදයෝ එකුන් තිස (29) හා ඵල චිත්තෝත්පාදයෝ

සත් තිස සත්‍ය විනිර් මුක්ත වේ. මෙසේ ආයර්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් නාමආදිලබ්ධත්‍රිකනම් වේ. ප්‍රඥප්ති ධර්මයන් අරමුණු කරන්නා වූ රූපාරූප එක්විසි චිත්තයන් හා තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය අට විසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයට අතුළත් නොවූ හෙයින් සප්ප දෙස ත්‍රික නම් වේ.

පරිත්තාරම්මණ ත්‍රිකය නිමි

# 14 හීන ත්‍රිකය

පරිත්තාරම්මණ ත්‍රිකයට අනතුරුව හීන ත්‍රිකය වදළසේක. කෙසේ වදළසේක්ද යත්?

හීනා ධම්මා
මජ්ඣිමා ධම්මා
පණීතා ධම්මා යනු වෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- හීනා, ලාමකවූද, සිත කිලුටු කරන්නාවූද, ධම්මා, සත්ව නොවූ ජීවයක් නොවූ, ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. මජ්ඣිමා, මධ්‍යම වූ සත්ව නොවූ ජීවයක් නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය, පණීතා, ප්‍රණීතවූ උතුම්වූ සත්ව නොවූ පුද්ගල නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය.

1 හීනා ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අකුසල් සිත් දොළසද, ඒ සමග යෙදෙන චෛතසික සත් විස්ස (27) ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. අයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේදයත්? අකුසල් සිත් සමග යෙදෙන චෛතසික සත් විස්ස (27) අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික පස් විසි දෙක සංස්කාර ස්කන්ධ නම්. අකුසල් සිත් දොළස (12) විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් දොළස මනායතන නම්. චෛතසික සත්විසි දෙන ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? අකුසල් සිත් දොළස මනො විඤ්ඤාණ ධාතු නමි. චෛතසික සත් විසි දෙන ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? අකුසල් සිත් දොළස සහ එහි යෙදෙන චෛතසික අතුරෙන් ලෝභය හැර ඉතිරි චෛතසික සවිසි දෙන දුක්ඛ සත්‍ය නමි. ලෝභය සමුදය සත්‍ය නමි. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 මජ්ඣිමා ධම්මා යන ද්‍රුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- ලෞකික කුසල් සිත් සතළොස (17) හා ලෞකික විපාක සිත් දෙතිසද (32) කිරිය සිත් විස්සද, ඒ සමග යෙදෙන චෛතසික අටතිසද රූප අටවිස්සද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්, ධාතු වශයෙන් අටලොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය රූපස්කන්ධ නමි. චෛතසික අටතිස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥාස්කන්ධ නමි. ඉතිරි චෛතසික සතිස සංස්කාර ස්කන්ධ නමි, ලෞකික කුසල විපාක ක්‍රියා සිත් [69] ය විඤ්ඤාණ ස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අට විසි රූපය අතුරෙන්, චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, යන 10 ද සිත් එකුන් හැත්තෑව [69] මනායතනයද, චෛතසික අටතිස හා සුඛුම රූප සොළස ධම්මායතනයද වේ. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට ලොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? අටවිසි රූපය අතුරෙන්, චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණධාතු, ජිව්හා ධාතු කාය ධාතු, රූප ධාතු, ශබ්දධාතු, ගන්ධ ධාතු, රසධාතු

පොට්ඨබ්බ ධාතු, යන දසයද 10 චක්ඛුවිඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණා දි විඤ්ඤාණ ධාතු පසද, මනො ධාතුවද, ඉතිරි සිත් සියල්ල මනො විඤ්ඤාණ ධාතුවද වේ. ඒ හා යෙදෙන චෛතසික අටතිස හා සුඛුම රූප සොළසද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික කුසල් සිත් සතළොසද, විපාක සිත් දෙතිස (32) කිරිය සිත් විස්සද (28) එහි යෙදෙන අටතිස් (38) චෛතසිකයන්ද, අට විසි (28) රූපයද, යන මේ සියල්ල දුක්ඛ සත්‍ය නමි. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 පණීතා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- ලෝකෝත්තර සිත් අට (8) ය. එහි යෙදෙන සතිස් (36) චෛතසිකයෝය. නිර්වාණයද, යන මේ ධර්මයෝ ලැබෙති. ඒ ධර්‍මී සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් සමග යෙදෙන චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥා ස්කන්ධ නමි. ඉතිරි චෛතසික සූතිස (34) සංස්කාර ස්කන්ධ නමි. ලෝකෝත්තර සිත් අට (8) විඤ්ඤාණ ස්කන්ධ නමි, නිර්වාණය ස්කන්ධ සංගහයෙන් විනිර් මුක්තයි මෙසෙ සකන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝකෝත්තර සිත් අට (8) මනායතන නමි, චෛතසික සතිස 36 හා නිර්වාණය ධම්මායතන නමි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝ- කෝත්තර සිත් අට (8) මනො විඤ්ඤාණ ධාතු නමි. චෛතසික සතිස (36) හා නිර්වාණය ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? නිර්වාණය නිරෝධ සත්‍ය නමි. සතර මාර්ග සම්ප්‍රයුක්ත සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, සකෘදගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද. අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද මාර්ගසත්‍ය නමි. ඉතිරි මාර්ග චිත්තෝත් පාදයෝ එකුන් තිස හා ඵල චිත්තෝත් පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

හීන ත්‍රිකය නිමි.

# 15 මිච්ඡත්ත ත්‍රිකය

හීන ත්‍රිකයට අනතුරුව මිච්ඡත්ත ත්‍රිකය වදළසේක, කෙසේ වදළ සේක්ද යත් ?

මිච්ඡත්ත නියතං ධම්මා
සම්මත්ත නියතා ධම්මා
අනියතා ධම්මා - යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- මිච්ඡත්ත නියතා විපරීත ස්වභාව ඇති බැවින් චුතියට අනතුරුව විපාකදීම නියත කොට ඇත්තාවූ, ධම්මා, සත්වයෙක් නොවූ ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය, සම්මත්ත නියතා - අවිපරීත ස්වභාව ඇති බැවින් තමාගේ පැවැත්මට අනතුරුව විපාකදීම ස්වභාව කොට ඇත්තාවූ, ධම්මා, සත්වනොවූ, ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. අනියතා - විපරීත ස්වභාවයෙන් හෝ අවිපරීත ස්වභාවයෙන් හෝ අනේකාන්තවූ, ධම්මා සත්වයෙක් නොවූ, ජීවයක් නොවූ, ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

1 මිච්ඡත්ත නියතා ධම්මා යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම්- නියත මිථ්‍යා දිට්ඨි කර්ම වශයෙන් ඇත්තාවූ දිට්ඨිගත සම්පයුක්ත චිත්තවීථි සතරෙහි ඇත්තාවූ සත්වන ජවන චේතනාවෝය, මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර එක් විසි (21) චෛතසිකය ලැබෙති, මාතුඝාතනාදි ආනන්තරිය අකුසල කර්ම වශයෙන් පවත්නා දෝස මූලික චිත්ත වීථීන්හි පවත්නා සත්වන ජවන චේතනාවෝය. පීති, ලෝභ, මාන දිට්ඨි, විචිකිච්ඡා හැර චෛතසික දෙවිසි දෙනය (22) යන මේ ධර්මයෝ ලැබෙති, ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්, ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝභ මූල දිට්ඨිගත සම්පයුක්ත සහ ද්වේෂ මූල චිත්තයන්හි

යෙදුනාවූ, මාන, විචිකිච්ඡා හැර චෛතසික පස් විස්ස (25) අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික තෙවිස්ස (23) සංස්කාර ස්කන්ධ නම්, අකුසල් සිත් සය (6) විඥ්ඥාණස්කන්ධ නම්, මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්, අකුසල් සිත් සය මනායතන නම්, එහි යෙදෙන චෛතසික පස්විසිදෙන (25) ධම්මායතන නම්, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝභ දෝස අකුසල් සිත් සය (6) මනො විඥ්ඥාණ ධාතු නම්. චෛතසික පස් විසිදෙන (25) ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෝභ, දෝස, අකුසල් සිත් සහ ඒ සමග යෙදෙන පස් විසි චෛතසිකයන් අතුරෙන් ලෝභය හැර චෛතසික සූවිස්සද (24) දුක්ඛ සත්‍ය නම්, ලෝභය සමුදය සත්‍ය නම්, මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 සම්මත්ත නියත ධම්මා සහ ද්‍රුතිය පදයාගේ ස්වරූපා- ර්ථයෝ නම් මාර්ග සිත් සතරය (4) ඒ සමග යෙදෙන චෛතසික සතිසද 36 ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්, ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන්, එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? සතර මාර්ග සම්ප්‍රයුක්ත චෛතසික 36 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි. සංඥාව සංඥාස්කන්ධ යයි. ඉතිරි චෛත සික 34 සංස්කාර ස්කන්ධ යයි. මාර්ග සිත් 4 විඥ්ඥාණ ස්කන්ධ යයි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග සිත් 4 මනායතනයයි. චෛතසික 36 ධම්මායතන යයි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග සිත් 4 මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික 36 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් එක්වැදෑරුම් වන්නේ කෙසේද යත්? සෝවාන් මාර්ග සිත සමග යෙදෙන මාර්ගාඞ්ග අටදෙන එක් වරක් සත්දෙන සතර වරක්ද, සකදගාමි මාර්ගය සමග යෙදෙන මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, මාර්ග සත්‍ය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන් තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 අනියතා ධම්මා, නියත මිථ්‍යාදිට්ඨි ගන්නා අවස්ථාවෙහි පැවති දිට්ඨි ගත සම්පයුත්ත චිත්ත වීථීන් හි පැවති සත්වන ජවනයෝද, ආනන්තරිය සිදු කරන අවස්ථාවෙහි පැවති දෙම්නස් චිත්ත වීථීන්හි සත්වන ජවනයන්ද, සතර මාර්ග චිත්තයන්ද, යන මෙතෙක් ධර්මයන් හැර ඉතිරි සිත් 85 ද චෛතසික 52 ද. රූප 28 ද, නිර්වාණයද යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්, ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් නෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 රූපස්කන්ධ නම්. සිත් 85 සමග යෙදෙන චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 50 ස සංස්කාර ස්කන්ධ නම්. සිත් 85 විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන කායා-යතන, රූපායතන, ශබ්දයතන, ඝන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, යන ආයතන 10 ද, සිත් 85 මනායතනයද චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, නිර්වාණයද ධම්මායතනවේ. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු ධාතු. සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු යන ධාතු දසයද, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණවිඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කායවිඤ්ඤාණධාතු යන 15 ද මනො ධාතුවද, ඉතිරි සිත් දෙසැත්තෑව මනො විඤ්ඤාණ ධාතුවද වේ. දෙපනස් චෛතසිකයන් සහ සුඛුම රූප 16 ද, නිර්වාණයද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මාර්ග ඵල සිත් 8 හැර ඉතිරි සිත් 81 ද, ලෝභය හැර චෛතසික 51 ද, රූප 28 ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

මේ ශබ්දවලී නොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම්. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුලත්වන හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

මිච්ඡත්ත ත්‍රිකය නිමි.

# 16 මග්ගාරම්මණ ත්‍රිකය.

මිච්ඡත්ත ත්‍රිකයට අනතුරුව මග්ගාරම්මණ ත්‍රිකය විදුළ සේක.

16 මග්ගා රම්මණා ධම්මා

මග්ග හේතුකා ධම්මා
මග්ගාධි පතිනො ධම්මා යනුවෙනි,

ඒහි ස්වරූපාර්ථයෝ නම්:- මග්ගාරම්මණා ධම්මා, මාර්ග යම අරමුණු කොට ඇත්තාවූ ධම්මා සත්ව නොවන, ජීව නොවන ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

මග්ග හේතුකා ධම්මා:- මාර්ගයම හේතුකොට ඇත්තාවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. නොහොත් මාර්ගයෙහි සම්ප්‍රයුක්ත හේතු ඇත්තාවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

මග්ගාධිපතිනො ධම්මා - මාර්ගයම ආරම්මණාධිපතිකොට නොහොත් සහජාතාධිපතිකොට ඇත්තාවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

1 මග්ගාරම්මණා ධම්මා, යන ප්‍රථම පදයාගේ ස්වරූපාර්ථයෝ නම් - සෝවාන් මාර්ගය අරමුණු කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයාගේ මනොද්වාරාවජ්ජනය ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් 4 ය, අභිඥා, කුසල සිතය යන සිත් 6 ය, සකදාගාමීන්ගේ සොවාන් සකදාගාමි මාර්ග සිත් 2 අරමුණු කරන්නාවූ මනො-ද්වාරාවජ්ජනය ඥානසම්ප්‍රයුක්ත කුසල් සිත් 4 ය. අභිඥා කුසල් සිතය අනාගාමීන් වහන්සේගේ සෝවාන් සකදාගාමි අනාගාමි යන මාර්ග සිත් තුන අරමුණු කරන්නාවූ මනොද්වාරා වජ්ජනය, මහා කුසල් සිත් 4 ය, අභිඥා කුසල් සිතය, රහතන්වහන්සේගේ මාර්ග සිත් 4 ම අරමුණු කරන්නාවූ මනොද්වාරා වජ්ජනය, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් 4 අභිඥා ක්‍රියා සිතය යන සිත් 6 විරති අප්පමඤ්ඤ වජ්ජිත චෛතසික 33 ලැබෙති. ඒ ධර්ම

සමූහය ස්කන්ධ වශයෙන් 4 වැදැරුම්. ආයතන වශයෙන් දෙවැදැරුම්, ධාතු වශයෙන් දෙවැදැරුම්, සත්‍ය වශයෙන් එක් වැදැරුම්.

ස්කන්ධ වශයෙන් වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්, ඉතිරි චෛතසික සංස්කාර ස්කන්ධ නම්. සිත් 11 විඥානස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදැරුම්.

ආයතන වශයෙන් සිත් 11 මනායතන නම්. චෛතසික 33 ධර්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදැරුම්. ධාතු වශයෙන් දෙවැදැරුම් වන්නේ කෙසේද යත් සිත් 11 මනො විඥාන ධාතු නම්, චෛතසික 33 ධර්මධාතු නම්. සත්‍ය වශයෙන් දුක්ඛ සත්‍යයයි.

2 මග්ග හේතුකා ධම්මා-යන ද්‍රිතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම් - ප්‍රථම අර්ථ විකල්පයෙන් මාර්ග සිත් 4 මාර්ගාඞ්ග හැර චෛතසික 28 ලැබෙති. ද්‍රිතිය අර්ථවිකල්පයෙන් මාර්ග සිත් 4 හා අලෝභ අදෝස හැර චෛතසික 34 ලැබෙති. තතිය අර්ථ විකල්පයෙන් මාර්ග සිත් 4 හා අමෝහ වජ්ජිත 35 ලැබෙති. ප්‍රථම අර්ථවිකල්පයෙන් මාර්ගාඞ්ග 8 සමග යෙදෙන චෛතසික විසිඅට (28) ගනු ලැබේ. ද්‍රිතිය අර්ථවිකල්පයෙන් මාර්ගයෙහි පිහිටි හේතුවන අමෝහය හා සම්ප්‍රයුක්තව එකට උපදනා ධර්ම වශයෙන් මාර්ග සිත් 4 හේතු ධර්ම වන අලෝභ අදෝස යන හේතු ධර්ම දෙකත් හැර ඉතිරි චෛතසික 34 එහි ස්වරූපාර්ථ වශයෙන් ගනු ලැබේ. තතිය අර්ථවිකල්පයෙන් මාර්ග සිත් 4 හා සම්ප්‍රයුක්ත අමෝහය හැර චෛතසික 35 ගනු ලැබේ.

ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදැරුම්, ආයතන වශයෙන් දෙවැදැරුම්, ධාතු වශයෙන් දෙවැදැරුම්, සත්‍ය වශයෙන් එක් වැදැරුම්.

ස්කන්ධ වශයෙන් සිවුවැදැරුම් වන්නේ කෙසේද යත්? සතිස් චෛතසික අතුරෙන්, වේදනාව වේදනාස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්, ඉතිරි චෛතසික 34 සංස්කාර ස්කන්ධ නම්, මාර්ග සිත් 4 විඥානස්කන්ධ නම්, ආයතන

වශයෙන් මාර්ග සිත් 4 මනායතන නම්, චෛතසික 36 ධම්මා යතන නම්, මාර්ග සිත් 4 මනොවිඥාන ධාතු නම්, චෛතසික 36 ධම්ම ධාතු නම්. සත්‍ය වශයෙන් මාර්ග සිත් සමග යෙදුන සෝවාන් මාර්ගාඞ්ග 8 දෙන එක් වරක් 7 දෙන සතර වරක් සකදගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත්දෙන 4 වරක්ද අනාගාමී මාර්ගාඞ්ග 8 දෙන එක්වරක් 7 දෙන 4 වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ 8 දෙන 1 ක් වරක් 7 දෙන 4 වරක් ද මාර්ග සත්‍ය නම්, ඉතිරි මාර්ග චිත්තෝත්පාද 29 හා ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආයඞ් සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 මග්ගාධි පතිනො ධම්මා – යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම් – ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබියයුතු සෝවාන් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නාවූ සෝවාන් පුද්ගලයාගේ මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිත් 4 ය, සකදගාමී පුද්ගලයා සෝවාන් සකදගාමී මාර්ග දෙක අධිපති කොට අරමුණු කරන්නාවූ සකදගාමී පුද්ගලයාගේ ඥානසම්ප්‍රයුක්ත මහා කුසල සිත් 4 සෝවාන් සකදාගාමී අනාගාමී යන පුද්ගලයන් තම තමා ලත් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නාවූ ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත් 4 ය, සතර මාර්ගයම අරමුණු කරන්නාවූ රහතුන් වහන්සේගේ ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් 4 ය, ඒ හා යෙදෙන විරති අප්පමඤ්ඤා හැර චෛතසික 33 ය.

දුතිය අර්ථ විකල්පයෙන් විරියාධි පති ප්‍රත්‍යය ලැබෙන කල්හි විරිය වජ්ජිත චෛතසික 35 ද, වීමංසාධි පති ප්‍රත්‍යය ලැබෙන විට විමංස (ප්‍රඥාව) හැර චෛතසික 35 ද ලැබෙති. තුන්වන අර්ථ විකල්පයෙන් විරිය වීමංස දෙක ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 36 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්, සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 34 ර සංස්කාර ස්කන්ධ නම්. ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් 8 හා

මාර්ග සිත් 4 ද, විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මග්ගා රම්මණික සිත් 12 ස මනායතන නම්. චෛතසික 36 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මග්ගා රම්මණික සිත් 12 මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික 36 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? මග්ගා රම්මණික ලෞකික සිත් 8 හා චෛතසික 33 දුක්ඛ සත්‍ය නම්. සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක්ද, සකදාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක්ද, අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත් දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, මාර්ග සත්‍ය නම්. ඉතිරි මාගී චිත්තෝත් පාදයෝ 29 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආය්‍යී සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පදයෙන් නම ලබන හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම්. මාර්ගය මාර්ගය අරමුණු නොකරන අකුසල් 12 ය, මනොද්වාරාවජ්ජනය හැර අහේතුක සිත් 17 ය, ඥානසම්ප්‍රයුක්ත කුසල ක්‍රියා 8 හැර කාම සෝභන සිත් 12 ය අභිඥා 2 හැර, මහද්ගත සිත් 27 ය, ඵල සිත් 4 ය, චෛතසික 52 (අවස්ථාව ගෙන) රූප 28 ය නිර්වාණය යන මේ ධර්මයෝ මේ ත්‍රිකයෙන් බැහැර වූ හෙයින් මේ ත්‍රිකය සවිපදෙස ත්‍රික නම් වේ.

මග්ගා රම්මණ ත්‍රිකය නිමි.

# 17. උප්පන්න ත්‍රිකය.

මග්ගා රම්මණ ත්‍රිකයට අනතුරුව උප්පන්න ත්‍රිකය වදාළ සේක.

උප්පන්නා ධම්මා
අනුප්පන්නා ධම්මා
උප්පාදිනො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- උපපන්නා ධම්මා, උත්පාද, ඨිති, භංග යන ක්‍ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක්, ඇත්තාහ. ඒ ධර්මයෝ නම්:- ප්‍රත්‍යොත්පන්න කාලිකවූ සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් 12 වැදෑරුම්. ධාතු වශයෙන් 18 වැදෑරුම්. සත්‍ය වශයෙන් 3 වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 රූපස්කන්ධ නම්. චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ නම්. සිත් 89 විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් 12 වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, යන ආයතන 10 ද, සිත් සියල්ල මනායතන යද, චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් 12 වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 අතුරෙන් චක්ඛුධාතු, සෝතධාතු, ඝාණධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රසධාතු, ඵොට්ඨබ්බ ධාතු, යන ධාතු 10 ද, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු,

කාය විඤ්ඤාණ ධාතු, මනොධාතු, මනො විඤ්ඤාණ ධාතුවද, යන විඤ්ඤාණ ධාතු 7 ද, චෛතසික 52 සහ සුඛුම ද රූප 16ද, යන ධම්ම ධාතුව ද වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම වන්නේ කෙසේදයත්? රූප 28 ද, ලෝභය හැර චෛතසික 51 ද, ලෞකික සිත් 81 ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතර වරක් ආදී වශයෙන් සතර මාර්ග සම්පයුක්ත මාර්ගාඞ්ගයෝ අටදෙන මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන් තිස හා ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර් මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

2 අනුප්පන්නා ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- අනුප්පන්නා උත්පාද, ඨිති, භංග යන ක්‍ෂණ ත්‍රයට නො පැමිණියා වූ, ධම්මා, සත්වනොවන, ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ, ඒ ධර්‍මයෝ නම්- අකුසල් සිත් 12 ද කුසල් සිත් 21 ද ක්‍රියා සිත් 20 ද, ඒ සමග යෙදෙන චෛතසික 52ද, චිත්තජ රූප 17 ද, ඍතුජ රූප 15 ද, ආහාරජ රූප 13ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් සත් වැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම වන්නේ කෙසේදයත්? රූප 28 අතුරෙන් චිත්තජ රූප 17 ද, ඍතුජ රූප 15 ද, ආහාරජ රූප 13 ද යන මේ රූප සමූහය රූපස්කන්ධ නම්. චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ නම්. අකුසල් සිත් 12 හා කුසල් 21 ද කිරිය සිත් 20 ද, විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චිත්තජ රූප, ඍතුජ රූප, ආහාරජ රූප යන තිජ රූපයෝ කෙරෙහි පවත්නා රූපාරම්මණය, රූපායතන නම්. ශබ්දරම්මණය ශබ්දයතන නම්. ගන්ධාරම්මණය ගන්ධායතන

නම්. රසාරම්මණය රසායතන නම්. පොට්ඨබ්බා රම්මණය පොට්ඨබ්බායතන නම්. අකුසල් සිත් 12 ද, කුසල් සිත් 21 ද, කිරිය සිත් 20 ද යන සිත් සියල්ල මනායතන නම්. චෛතසික 52 සහ සුඛුම රූප 12 ද ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් සත් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් 8 වැදෑරුම වන්නේ කෙසේදයත්? රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු, යන 5 ද, පඤ්චද්වාරා වජ්ජන සිත මනො ධාතු, නම්. අකුසල් සිත් 12 හා කුසල් සිත් 21 ද, ඉතිරි කිරිය සිත් 19 ද, මනොවිඤ්ඤාණ ධාතු නම්. චෛතසික 52 ද, සුඛුම රූප 12 ද, ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම වන්නේ කෙසේදයත්? අකුසල් සිත් 12 ද, ලෞකික කුසල් සිත් 17 ද, ක්‍රියාසිත් 20 ද, ලෝභය හැර චෛතසික 51 ද, චිත්තජ රූප 17 ද, ඍතුජ රූප 15 ද, ආහාරජ රූප 13 ද, දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සෝවාන් මාර්ගාඞ්ග අට දෙන එක් වරක්ද, සත්දෙන සතර වරක්ද, සකදාගාමී මාර්ගාඞ්ග අටදෙන එක්වරක්ද, සත්දෙන සතර වරක්ද, අනාගාමී මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්ද, අර්හත් මාර්ගාඞ්ග අටදෙන එක්වරක් සත්දෙන සතර වරක්ද, මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ 29 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

3 උප්පාදිනො ධම්මා. යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්– උත්පාද, ඨිති, භංග යන ක්ෂණත්‍රයට පැමිණීම ස්වභාව කොට ඇත්තාවූ, ධම්මා සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ප්‍රත්‍යොත්පන්න කාලික විපාක සිත් 36 ද, එහි යෙදෙන චෛතසික 38 ද, කර්මජ රූප 20 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් ශබ්දය හැර. එකොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් ශබ්ද ධාතුව හැර 17 ද සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? කර්‍මජ රූප 20 රූප ස්කන්ධ නමි. චෛතසික ධර්‍ම අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නමි. සංඥාව සංඥා ස්කන්ධ නමි. ඉතිරි චෛතසික 36 සංස්කාර ස්කන්ධ නමි. විපාක සිත් 36 විඤ්ඤාණ ස්කන්ධ නමි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නේ කෙසේ දයත්? කර්‍මජ රූප 20 අතුරෙන් චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්ද යතන හැර ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, යන ආයතන 9 ද, විපාක සිත් 36 මනායතනයද, චෛතසික 38 සහ සුඛුම රූප 16 ද ධම්මායතනය ද වේ. මෙසේ ආයතන වශයෙන් 11 වැදෑරුම් වේ.

ධාතු වශයෙන් 27 වැදෑරුම් වන්නේ කෙසේදයත්? විසි කර්‍මජ රූපයන්හි පැවති චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, (ශබ්ද ධාතුව හැර) ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු, යන 9 ද, සම්පටිච්ඡන දෙසිත මනොධාතු ද, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හාවිඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු යන විඤ්ඤාණ ධාතු, 5 ද වේ. ඉතිරි සිත් 24 මනො විඤ්ඤාණ ධාතු ද, වේ. චෛතසික 38 හා සුඛුමරූප ද, ධම්ම ධාතු නමි. මෙසේ මේ ධර්‍මයෝ සතළොස ධාතුනම් වන්නේය.

සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේදයත්? කර්‍මජ රූප 20 ලෞකික විපාක සිත් 32 ද, ඒ සමග යෙදෙන විරති හැර චෛතසික 35 ද දුක්ඛ සත්‍ය නම් වේ. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම වේ. ඵල චිත්තෝත්පාදයෝ 37 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. නිර්වාණ පරමාර්ථය මේ ත්‍රිකයට ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස ත්‍රික නම් වේ.

උප්පන්න ත්‍රිකය නිමි

# 18 අතීත ත්‍රිකය

උපපන්න ත්‍රිකයට අනතුරුව අතීත ත්‍රිකය වදාළ සේක.

අතීතා ධම්මා

අනාගතා ධම්මා

පච්චුප්පන්නා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- අතීතා ධම්මා උත්පාදදී ක්‍ෂණ ත්‍රයට පැමිණ ඉක්ම ගියාවූ ධම්මා සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්යෝ නම්- ඉපද නිරුඬවූ සිත් 89 ද චෛතසික 52 ද රූප 28 ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙලොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? අටවිසි රූපය රූපස්කන්ධයයි. චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධයයි, සංඥාව සංඥා ස්කන්ධයයි, ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධයයි. සිත් 89 විඤ්ඤාණ ස්කන්ධයයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? අටවිසි රූපයෙහි පැවති චක්ඛායතන, සෝතායතන ඝාණායතන, ජිව්හායතන කායායතන රූපායතන ශබ්දයතන ගන්ධායතන රසායතන පොට්ඨබ්බායතන යන 10 ද සිත් 89 මනායතන වේ. චෛතසික 52 සහ සුඛුම රූප 16 ද ධම්මායතන වේ. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛු ධාතු සෝත ධාතු ඝාණ ධාතු ජිව්හා ධාතු කාය ධාතු රූප ධාතු ශබ්ද ධාතු ගන්ධ ධාතු රස ධාතු පොට්ඨබ්බ ධාතු යන 10 ද, චක්ඛු විඤ්ඤාණ ධාතු සෝත විඤ්ඤාණ ධාතු ඝාණ විඤ්ඤාණ ධාතු ජිව්හා විඤ්ඤාණ ධාතු කාය විඤ්ඤාණ ධාතු යන

5 ද, මනොධාතුවද, ඉතිරි සිත් 76 මනො විඤ්ඤාණ ධාතු ද චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 සහ ලෞකික සිත් 81 ද, ලෝභය හැර චෛතසික 51 ද, දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මාර්ගසිත් 4 හි යෙදෙන මාර්ගාඞ්ගයෝ මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්-තෝත්පාද 29 හා ඵල චිත්තෝත්පාද සත්තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

2 අනාගතා ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- මතු උපදනු ලබන්නාවූ සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශ-යෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේදයත්?රූප 28 රූපස්කන්ධ යයි. චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධයයි. සංඥාව සංඥා ස්කන්ධයයි. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධයයි. සිත් සියල්ල විඤ්ඤාණ ස්කන්ධයයි, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛායතන, සෝතායතන ඝාණායතන ජිව්හායතන කායා-යතන රූපායතන ශබ්දයතන ගන්ධායතන රසායතන පොට්-ඨබ්බායතන යන ආයතන 10 ද, සිත් සියල්ල මනායතනය ද වේ. චෛතසික 52 සහ සුඛුම රූප 6 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛු ධාතු සෝතධාතු ඝාණධාතු ජිව්හා ධාතු කායධාතු රූපධාතු ශබ්දධාතු ගන්ධධාතු රසධාතු පොට්ඨබ්බා ධාතු චක්ඛු විඤ්ඤාණධාතු සෝත විඤ්ඤාණ ධාතු ඝාණ විඤ්ඤාණ ධාතු ජිව්හා විඤ්ඤාණ ධාතු කාය විඤ්ඤාණ ධාතු මනො ධාතුව ද ඉතිරි සිත් සියල්ල මනො විඤ්ඤාණ ධාතු නම් වේ. චෛතසික

52 ද සුඛුම රූප 16 ද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 ද ලෞකික සිත් 81 ද ලෝභය හැර චෛතසික 51 ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සෝවාන් මාර්ගාඞ්ගාදී මාර්ගාඞ්ගයෝ මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාද 29 සහ ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

3 පච්චුප්පන්නා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්- ක්‍ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වර්මාන වූ සිත් 89 ද චෛතසික 52 ද රූප 28 ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 රූප ස්කන්ධයයි, චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධයයි. සංඥාව සංඥා ස්කන්ධයයි. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධයයි. සිත් 89 විඥ්ඥාණ ස්කන්ධයයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛායතන සෝතායතන ඝාණායතන ජිව්හායතන කායායතන රූපායතන ශබ්දයතන ගන්ධායතන රසායතන පොට්ඨබ්බායතන යන ආයතන 10 ද, ඉතිරි සිත් සියල්ල මනායතනයද, චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, ධම්මායතන නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරු වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේදයත්? චක්ඛු ධාතු සෝතධාතු ඝාණධාතු ජිව්හාධාතු කායධාතු රූපධාතු, ශබ්දධාතු, ගන්ධධාතු, රසධාතු, පොට්ඨබ්බධාතු යන ධාතු 10 ද, චක්ඛු විඥ්ඥාණා දී විඥ්ඥාණධාතු 5 ද, මනොධාතුවද, ඉතිරි සිත් සියල්ල මනො විඥ්ඥාණ ධාතුවද,

චෛතසික 52 සහ සුඛුම රූප 16 ද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටලොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේදයත්? රූප 28 ද, ලෞකික සිත් 81 ද, ලෝභය හැර චෛතසික 5 ද, දුක්ඛ සත්‍ය නමි. ලෝභය සමුදය සත්‍ය නමි, සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාඞගයෝ මාර්ග සත්‍ය නමි. ඉතිරි මාර්ග චිත්තෝත් පාද 29 සහ ඵල චිත්තෝත්පාද 37 සත්‍ය විනිර් මුක්ත වේ. මෙසෙ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

මේ ගබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නමි. පරමාර්ථධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස ත්‍රික නම් වේ.

අතීත ත්‍රිකය නිමි.

# 19 අතීතා රම්මණ ත්‍රිකය

අතීත ත්‍රිකයට අනතුරුව අතීතාරම්මණ ත්‍රිකය වදාළ සේක.

අතීතාරම්මණා ධම්මා
ආනාගතාරම්මණා ධම්මා
පච්චුප්පන්නා රම්මණා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- අතීතාරම්මණා ධම්මා, ඉපද නිරුඬ වූ ධර්මයන් අරමුණු කොට පවත්නා, ධම්මා සත්වනොවූ ජීවනොව ස්වභාව ධර්මයෝ ඇත්තාහ, ඒ ධර්මයෝ නම්- අතීත ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ විඤ්ඤාණඤ්චා යතන සහ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිත් 6 ද, එහි යෙදෙන චෛතසික 30 ද, අතීත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මනොද්වාරා වජ්ජිත සිතය කාම ජවන් 29 ද, තදලම්බන ද, අභිඥා සිත් 2 ද ඒ සමග යෙදෙන චෛතසික විරති අප්පමඤ්ඤා හැර 47 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්, ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? චෛතසික 47 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 45 සංස්කාර ස්කන්ධ නම්. සිත් 49 විඤ්ඤාණ ස්කන්ධ නම්, මෙසේ සකන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ඒකාන්ත අනේකාන්ත වශයෙන් අතීත ධර්මයන් අරමුණු කරන්නාවූ සිත් -49 ද මනායතන නම්. චෛතසික 47 ධම්මා යතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 49 මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික 47 ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ඒකාන්ත අනේකාන්ත වශයෙන් අතීත ධර්මයන් අරමුණු කරන්නාවූ සිත් 49 හා චෛතසික 47 අතුරෙන් ලෝභය හැර 46 ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

2 ආනාගතා රම්මණා ධම්මා, යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්: අනාගතා රම්මණ, අනාගත කාලයෙහි උපදනා ධර්මයන් අරමුණු කොට පවත්නා, ධම්මා, සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්නාහ, ඒ ධර්මයෝ නම් අනාගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ, මනොද්වාරා වජ්ජන සිතය, කාම ජවන් 29 ද, තදරම්මණ 11 ද, අභිඥා සිත් 2 ද, චෛතසික අප්පමඤ්ඤ හැර 50 ද යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? අනාගත ධර්මයන් ඒකාන්ත වශයෙන් හා අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ සිත් 43 විඤ්ඤාණ ස්කන්ධ නම්. චෛතසික පනස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 48 සංස්කාර ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 43 මනායතන නම්. චෛතසික 50 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 43 මනො විඤ්ඤාණ ධාතු නම්. චෛතසික 50 ධම්ම ධාතු නම් මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 43 සහ ලෝභය හැර චෛතසික 49 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

3 පච්චුප්පන්නා රම්මණා ධම්මා, යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:–පච්චුප්පන්නා රම්මණා-වර්තමානධර්මයන් අරමුණු කොට පවත්නා ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ප්‍රත්‍යොත්පන්න ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ දෙපස් විඤ්ඤාණ සිත් 10 ද, මනොධාතු ත්‍රිකයද, ඒ සමග යෙදෙන ඡන්ද, වීරිය, ප්‍රීති හැර, අඤ්ඤසමාන චෛතසික 10 ද, ප්‍රත්‍යොත්පන්න ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මනොද්වාරාවජ්ජනය සහ කාම ජවන් 29 ද, තදාරම්මණ 11 ද, අභිඥා සිත් 2 ද, ඒ සමග යෙදෙන චෛතසික 52 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? ඒකාන්ත අනේකාන්ත වශයෙන් ලැබෙන සිත් 56, විඤ්ඤාණ ස්කන්ධ නම්. ඒ සමග යෙදෙන චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 56 මනායතන නම්. චෛතසික 52 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනො ධාතු, යන ධාතු, 6 ද, ඉතිරි සිත් 43 මනො විඤ්ඤාණ ධාතු ද, චෛතසික 52 ධම්ම ධාතු, වද වේ. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ප්‍රත්‍යොප්පන්න ධර්මයන් අරමුණු කරන්නාවූ සිත් 56 ද ලෝභය හැර චෛතසික 51 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

මේ ශබ්දවලි තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. පරමාර්ථධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස ත්‍රික නම් වේ.

අතීතාරම්මණ ත්‍රිකය නිමි.

# 20 අජ්ඣත්ත ත්‍රිකය

අතීතා රම්මණා ත්‍රිකයට අනතුරුව අජ්ඣත්ත ත්‍රිකය වදාළ සේක.

අජ්ඣත්තා ධම්මා
බහිද්ධා ධම්මා
අජ්ඣත්ත බහිද්ධා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- අජ්ඣත්තා ධම්මා, තම සන්-තානයෙහි පවත්නාවූ, ධම්මා, සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ, ඒ ධර්මයෝ නම්- අධ්‍යාත්ම සන්තානයෙහි හටගන්නාවූ සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ පහක්ද, ආයතන දොළසක් ද, ධාතු අටළොසක්ද සත්‍ය වශයෙන් තෙවැදෑරුම් ද වේ.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 රූපස්කන්ධ යයි, චෛතසික දෙපනස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි. සංඥාව සංඥා ස්කන්ධ යයි. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ යයි. සිත් 89 විඥ්ඥාණ ස්කන්ධ යයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන කායායතන යන 5 ද, රූපායතන, ශබ්දයතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, යන 5 ද, සිත් සියල්ල මනා යතනය ද, චෛතසික 52 සහ සුඛුම රූප 16 ධම්මායතන ය ද යන ආයතන දොළස ලැබෙති.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසෙද යත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රසධාතු, පොට්ඨබ්බ ධාතු යන 10 ද, චක්ඛු විඥ්ඥාණ ධාතු, සෝත විඥ්ඥාණ ධාතු ඝාණ විඥ්ඥාණ ධාතු, ජිව්හා විඥ්ඥාණ ධාතු, කාය විඥ්ඥාණ

ධාතු යන 5 ද, මනො ධාතුව ද ඉතිරි සිත් 76 මනො විඤ්ඤාණ ධාතුව ද චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, ධම්මා ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 ද, ලෞකික සිත් 81 ද, ලෝභය හැර චෛතසික 51 ද, දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාඞ්ගයෝ 8 මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ 29 හා ඵල චිත්තෝත්පාදයෝ-37 සත්‍ය විනිර් මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

2 බහිද්ධා ධම්මා යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- බහිද්ධා, බාහිර සන්තානයෙහි පවත්නා, ධම්මා සත්ව නොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ, ඒ ධර්මයෝ නම්:- සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ලැබෙති, ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 රූපස්කන්ධ යයි. චෛතසික 52 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි. සංඥාව සංඥා ස්කන්ධ යයි. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ යයි. සිත් 89 විඤ්ඤාණ ස්කන්ධයයි මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් 12 වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛායතනාදී ආයතන 5 ද, රූපායතනාදී 5 ද, යන ආයතන 10 සමග සිත් 89 මනායතනය ද, දෙපනස් චෛතසිකයන් හා සුඛුම රූප 16 හා නිර්වාණය ධම්මායතන වේ. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වේ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, පොට්ඨබ්බ ධාතු

ආදී ධාතු 10 ද, චක්ඛු විඤ්ඤාණ ධාතු ආදී විඤ්ඤාණ ධාතු, 5 ද, මනො ධාතුව ද, ඉතිරි සිත් 76 මනො විඤ්ඤාණ ධාතුව ද වේ. දෙපනස් චෛතසිකයන් ද සුඛුම රූප 16 ද නිර්වාණය ද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූප 28 ද, ලෞකික සිත් 81 ද, ලෝභය හැර චෛතසික 51 ද, දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සෝවාන් ආදී සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාඞ්ගයෝ මාර්ග සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්, මෙසේ සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වේ.

3 අජ්ඣත්ත බහිද්ධා ධම්මා යන තතිය පදයාගේ ස්වරූ-පාර්ථයෝ නම්;- අජ්ඣත්ත සන්තානයෙහි හා බාහිර සන්තාන යෙහිද ඇතිවන ධර්යන්ද, රූප 28 ද, සිත් 89 ද, චෛතසික 52 ද, ලැබෙති ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු, වශයෙන් අටළොස් වැදෑරුම් සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. මේ පදය මෙහි පළමු පදයවන අජ්ඣත්ත පදයට සමාන බැවින් ස්වරූප වශයෙන් එ ධර්ම සියල්ලම මෙහිද ගතයුතු වේ. මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදී ලබ්ධ නාම ත්‍රික නම් වේ පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වූ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වේ.

අජ්ඣත්ත ත්‍රිකය නිමි.

# 21 අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

අජ්ඣත්ත ත්‍රිකයට අනතුරුව අජ්ඣත්තාරම්මණ ත්‍රිකය වදාළ සේක.

අජ්ඣත්තා රම්මණා ධම්මා
බහිද්ධා රම්මණා ධම්මා
අජ්ඣත්ත බහිද්ධා රම්මණා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- අජ්ඣත්තා රම්මණා ධම්මා, අධ්‍යාත්මයෙහි පවත්නා ධර්මයන් අරමුණු කොට පවත්නාවූ ධම්මා, සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ඒ ධර්මයෝ නම්:- අධ්‍යාත්ම ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ විඤ්ඤාණඤ්චායතන, නෙව සඤ්ඤා නාසඤ්ඤායතන සිත් 6 ද, ඒ හා සමග යෙදෙන චෛත සික 30 ද, අනේකාන්ත වශයෙන් අජ්ඣත්ත ධර්‍මයන් අරමුණු කරන්නාවූ කාමාවචර සිත් 54 ද, අභිඥා සිත් 2 ද, ඒ සමග යෙදෙන ඉස්ස අප්පමඤ්ඤ හැර චෛතසික 49 ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? අධ්‍යාත්ම ධර්මයන් ඒකාන්ත වශයෙන් හා අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ සිත් 62 ද, ඒ සමග යෙදෙන චෛතසික 49ද වේ. ඒ සිත් සමගයෙදෙන චෛතසික අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි. සංඥාව සංඥා ස්කන්ධ යයි. ඉතිරි චෛතසික 47 සංස්කාර ස්කන්ධ යයි. සිත් 62 විඤ්ඤාණ ස්කන්ධ යයි. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 62 මනායතන යයි. චෛතසික 49 ධම්මායතනයයි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට වැදැරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනො ධාතු යන ධාතු කොටස් 6 ද, ඉතිරි සිත් 49 මනො විඤ්ඤාණ ධාතු ද, චෛතසික 49 ධම්ම ධාතුව ද වේ. මෙසේ ධාතු වශයෙන් අට වැදැරුම් වේ.

සත්‍ය වශයෙන් දෙවැදැරුම් වන්නේ කෙසේද යත්? සිත් 62 සහ ලෝභය හැර චෛතසික 48 දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදැරුම් වේ.

2 බහිද්ධා රම්මණා ධම්මා, යන දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්; බාහිර ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ ආකාශානඤ්චා යතන සිත් 3 ද, පඤ්චම ධ්‍යාන අභිඥා සිත් 2 හැර රූපාවචර සිත් 15 ද, ලෝකෝත්තර සිත් 8 ද, ඒ සමග යෙදෙන චෛතසික 38 ද ලැබෙති.

බාහිර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ කාමාවචර සිත් 54 ද, අභිඥ සිත් 2 ද, ඒ සමග යෙදෙන මච්ඡරිය හැර චෛතසික 51 ද, ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදැරුම්. ආයතන වශයෙන් දෙවැදැරුම් ධාතු වශයෙන් අට වැදැරුම්. සත්‍ය වශයෙන් තෙවැදැරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදැරුම් වන්නේ කෙසේද යත්? බාහිර ධර්මයන් ඒකාන්ත වශයෙන් හා අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ සිත් 82 සහ චෛතසික 51 අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 49 සංස්කාර ස්කන්ධ නම්. සිත් 82 විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිවු වැදැරුම්.

ආයතන වශයෙන් දෙවැදැරුම් වන්නේ කෙසේද යත්? සිත් සියල්ල මනායතන නම්. චෛතසික 51 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදැරුම් වේ.

ධාතු වශයෙන් අට වැදැරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, යන

විඤ්ඤාණ ධාතු 5 ද, මනො ධාතුව ද, ඉතිරි සිත් 69 මනො විඤ්ඤණ ධාතු ව ද, චෛතසික 51 ධම්මා ධාතුව ද වන්නේය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? ලෞකික සිත් 74 ද, ඒ සමග යෙදෙන ලෝභය හැර චෛත සික 50 ද දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සෝවාන් මාර්ගාදීන්හි යෙදෙන සම්මා දිට්ඨි ආදී මාර්ගාඞ්ගයෝ මාර්ග සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්–තෝත්පාදයෝ 27 හා ඵල චිත්තෝත්පාද 35 සත්‍ය විනිර් මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වේ.

3 අජ්ඣත්ත බහිද්ධා රම්මණා ධම්මා, යන ත්‍රිය පදයා–ගේ ස්වරූපාර්ථයෝ නම්: අධ්‍යාත්මික වූද, බාහිර වූද ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ කාමාවචර සිත් 54 ද, අභිඥා සිත් 2 ද, ඉස්සා, මච්ඡරිය, අප්පමඤ්ඤ හැර චෛතසික 48 ද, යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 56 සමග යෙදෙන වේදනාව වේදනාස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 46 සංස්කාර ස්කන්ධ නම්. සිත් 56 විඤ්ඤණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශ–යෙන් සිවු වැදෑරුම් වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 56 මනායතන නම්. චෛතසික 48 ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නේ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, යන 5 ද, මනො ධාතුව ද, මනො විඤ්ඤණ ධාතු ධම්ම ධාතු යන 3 ද සමග ධාතු අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 56, සහ චෛතසික 47 දුක්ඛ සත්‍යයයි. ලෝභය සමුදය සත්‍ය යයි. මෙසේ සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ.

මේ ශබ්දවලි තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් නොවූ හෙයින් සප්ප දෙස ත්‍රික නම් වේ.

අජ්ඣත්තා රම්මණ ත්‍රිකය නිමි.

# 22 සනිදස්සන ත්‍රිකය

අජ්ඣත්තාරම්මණ ත්‍රිකයට අනතුරුව සනිදස්සන ත්‍රිකය වදාළ සේක.

සනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන අප්පටිඝා ධම්මා යනු වෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්: සනිදස්සන සප්පටිඝා ධම්මා, දැකීම් සහිතවූ ද, හැපීම් සහිතවූද, ධම්මා සත්වනොවන ජීව නොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. සනිදස්සන සප්පටිඝ වන්නාවූ, දැකීම ස්වභාවයෙන් යුක්තවූ ද, හැපීම ස්වභාවයෙන් යුත්තවූ ද වර්ණායතන නම්වූ රූප අරමුණ ලැබේ. එය ස්කන්ධ වශයෙන් එක් වැදෑරුම්. ආයතන වශයෙන් එක් වැදෑරුම්. ධාතු වශයෙන් එක් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් රූපස්කන්ධ යයි. ආයතන වශයෙන් රූපායතන යයි. ධාතු වශයෙන් රූප ධාතුව යි. සත්‍ය වශයෙන් දුක්ඛ සත්‍යයයි. මෙහි ස්වරූප වශයෙන් ගනු ලබනු යේ අටවිසි රූපය අතුරෙන් වර්‍ණ රූපය පමණකි. දැකීම ස්වභාවයෙන් යුත් රූපයයි.

2 අනිදස්සන සප්පටිඝා ධම්මා යන ද්‍රුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්: දැකීම රහිතව, දැකිය නොහැකි චක්ඛු විඤ්ඤාණයට අරමුණු නොවන රූපයෝය. සප්පටිඝා-ගැටෙනු ලබන්නාවූ චක්ඛු ප්‍රසාදයෙහි ගැටෙන රූපා රම්මණය හැර සෝත ඝාණ ජිව්හා කාය යන ප්‍රසාද රූපයන් හා ගැටෙන ශබ්දරම්මණ ගන්ධා රම්මණ රසා රම්මණ පොට්ඨබ්බා රම්මණ යන ආරම්මණ සතර දෙන සහ ප්‍රසාද රූප පස මෙහි ස්වරූප ධර්ම වන්නේය. ඒ ධර්මයෝ නම් ඕලාරික රූප 11 යි. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් රූපස්කන්ධය

පමණක් වේ. ආයතන වශයෙන්, චක්ඛායතන, සෝතායතන ඝාණයතන ජිව්හායතන කායා යතන යන 5 ද, (රූපායතන හැර) ශබ්දයතන, ගන්ධායතන, රසායතන පොට්ඨබ්බා යතන යන 4 ද සමග ආයතන 9 ය ලැබෙති. මෙසේ ආයතන වශයෙන් නව වැදෑරුම් වේ.

ධාතු වශයෙන් චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු යන 5 ද, (රූප ධාතුව හැර) ශබ්ද ධාතු ගන්ධ ධාතු රස ධාතු පොට්ඨබ්බ ධාතු යන 4 ද සමග ධාතු 9 දෙනෙක් ලැබෙති. මෙසේ ධාතු වශයෙන් නව වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් මෙහි ලැබෙන ඕලාරික රූප 11 ලැබෙති ඒ රූපයෝ දුක්ඛ සත්‍ය වේ. මෙසේ සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

3 අනිදස්සන අප්පටිඝා ධම්මා යන තතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්: දැකීම් රහිත වූද ගැටීමක් නැත්තා වූද දැකීමක් හෝ හැපීමක් නොවන්නාවූ සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහ. ඒ සමූහය නම්– සිත් 89 ද චෛතසික 52 ද සුඛුම රූප 16 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්‍ම සමූහය, ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් සිවු වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්? රූපස්කන්ධය අතුරෙන් සුඛුම රූප 16 රූපස්කන්ධ නම්. චෛතසික දෙපනස අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ නම්. සංඥාව සංඥා ස්කන්ධ නම්. ඉතිරි චෛතසික 50 සංස්කාර ස්කන්ධ නම්. සිත් 89 විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑ රුම් වේ. නිර්වාණය ස්කන්ධ යන්ට අයත් නො වේ. ස්කන්ධ විනිර්මුක්ත වේ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්? සිත් 89 මනායතන යයි. චෛතසික 52 සහ සුඛුම රූප 16 හා නිර්වාණය ධම්මායතනය යි. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ.

ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නෝ කෙසේද යත්? චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ කාය විඤ්ඤාණ යන විඤ්ඤාණ ධාතු, 5 ද, මනො ධාතුව ද, ඉතිරි සිත් සියල්ල මනො විඤ්ඤාණ ධාතුව ද, චෛතසික 52 සහ සුඛුම රූප 16 ද, නිර්වාණය ද ධම්ම ධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වේ.

සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වන්නේ කෙසේද යත්? සුඛුම රූප 16 ද, ලෞකික සිත් 81 ද, චෛතසික ලෝභය හැර 51 ද, යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍ය නම්. ලෝභය සමුදය සත්‍ය නම්. ලෝකෝත්තර සිත් 8 අතුරෙන් මාර්ග සිත් සතරෙහි ලැබෙන සෝවාන් මාර්ගාඞ්ගයෝ අට දෙන එක් වරක්ද, සත් දෙන සතර වරක්ද, සකදාගාමි මාර්ගාඞ්ගයෝ අට දෙන එක් වරක්ද සත් දෙන සතර වරක්ද අනාගාමි මාර්ගාඞ්ගයෝ අට දෙන එක්වරක්ද සත් දෙන සතර වරක්ද, අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක්ද සත් දෙන සතර වරක්ද මාර්ග සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ 29 හා ඵල චිත්තෝත්පාදයෝ 37 සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වේ.

මේ ශබ්දවලී තොමෝ පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් වන හෙයින් නිප්පදෙස ත්‍රික නම් වන්නේය.

සනි දස්සන ත්‍රිකය නිමි.

මෙසේ ත්‍රික මාතිකා වෙහි වේදනා ත්‍රිකය. විතක්ක ත්‍රිකය, ප්‍රීති ත්‍රිකය, පරිත්තා රම්මණ ත්‍රිකය. මග්ගාරම්මණ ත්‍රිකය, උප්පන්න ත්‍රිකය, අතීත ත්‍රිකය, අතීතා රම්මණ ත්‍රිකය අජ්ඣත්තාරම්මණ ත්‍රිකය, යන ත්‍රික ධර්ම නව දෙන සපපදෙස ත්‍රක නම් වේ. ඉතිරි ත්‍රක ධර්ම තෙළෙස නිප්පදෙස ත්‍රික නම් වන්නේය.

ත්‍රික දෙවිස්ස නිමි.

## දුක මාතිකාව

තික මාතිකාවට අනතුරුව දුක මාතිකාව වදළසේක. ඒ දුක මාතිකාවද, හේතු ගොච්ඡකය, චූල්ලන්තර දුකය, ආසව ගොච්ඡකය, සංයොජන ගොච්ඡකය, ගන්ථ ගොච්ඡකය, ඕඝ ගොච්ඡකය, යොග ගොච්ඡකය, නීවරණ ගොච්ඡකය, පරාමාස ගොච්ඡකය, මහන්තර දුකය, උපාදාන ගොච්ඡකය, කිලෙස ගොච්ඡකය, පිට්ඨි දුකය, යන මොවුන්ගේ වශයෙන් තෙළෙස් වැදෑරුම්.

ඔවුන් අතුරෙන් හේතු ගොච්ඡකය පළමුකොට වදළසේක. හේතු හේතු දුකය, සහේතුක දුකය, හේතු සම්පයුත්ත දුකය, හේතු සහේතුක දුකය, හේතු හේතු සම්පයුත්ත දුකය, න හේතු සහේතුක දුකය, යන මොවුන්ගේ වශයෙන් සවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් හේතු දුකය පළමුකොට වදළසේක. එය ප්‍රථම පදය දුතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළසේක. කෙසේ වදළසේක්ද යත්? හේතු ධම්මා යනුවෙනි, ඊට අනතුරුව දුතිය පදය වදළසේක. කෙසේ වදළසේක් ද යත්? න හේතු ධම්මා යනුවෙනි.

### 1. හේතු ගොච්ඡකය

1 හේතු දුකය.

හේතු ධම්මා
න හේතු ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම් - ලෝභ, දෝස, මෝහ සහ අලෝභ, අදෝස, අමෝහ යන හේතු 6 ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 1 ද, ආයතන 1 ද, ධාතු 1 ද, සත්‍ය 3 ද, වේ. ලෞකික සහේතුක සිත් 63 සමග යෙදෙන ලෝභය හැර ඉතිරි හේතූන් 5 දෙන දුක්ඛ සත්‍ය නමි. ලෝභය සමුදය සත්‍ය නමි. සතර මාර්ග සම්ප්‍රයුක්ත අමෝහ සංඛ්‍යාත සෝවාන් ආදී මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි 4 දෙන මාර්ග සත්‍ය නමි. සතර මාර්ග

සම්ප්‍රයුක්ත අලෝභ අදෝස දෙදෙන හා ඵල සම්ප්‍රයුක්ත අලෝභ අදෝස අමෝහ යන හේතු තුන සත්‍ය විනිර්මුක්ත වේ.

2 න හේතු ධම්මා - හේතු ධර්ම නොවන්නාවූ, ධම්මා සත්ව නොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සිත් 89 ද, හේතු ධර්ම හැර චෛතසික 46 ද රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථධර්ම සියල්ල ඇතුලත් වූ හෙයින් නිප්පදෙස දුක නම්.

හේතු දුකය නිමි.

## 2. සහේතුක දුකය.

හේතු දුකයට අනතුරුව සහේතුක දුකය වදළසේක.

සහේතුකා ධම්මා
අහේතුකා ධම්මා. යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම් - සහේතුකා සම්ප්‍රයුක්ත හේතු ඇත්තාවූ ධම්මා, සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් සහේතුක සිත් 71 ද, මෝහ මූලයෙහි මෝහය හැර චෛතසික 52 ද, වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 3 ද වේ.

අහේතුකා ධම්මා - අහේතුක වූ හේතු නොයෙදෙන්නා වූ අහේතුක සිත් 18 ද, එහි යෙදෙන චෛතසික 12 ද, රූප 28 ද, මෝහමූලයෙහි මෝහයද නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද වේ. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. මෙසේ පරමාර්ථ ධර්ම සියල්ල ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

සහේතුක දුකය නිමි.

## 3 හේතු සම්පයුත්ත දුකය

සහේතුක දුකයට අනතුරුව හේතු සම්පයුත්ත දුකය වදාළ සේක.

හෙතු සම්පයුත්තා ධම්මා
හෙතු විප්පයුත්තා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම් - හේතු සම්පයුත්තා, හේතුන් සමග සම්ප්‍රයුක්ත වූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය, ඒ ධර්මයෝ නම් සහේතුක සිත් 71 ද, මෝහ මූලයෙහි මෝහය හැර චෛතසික 52 ද වේ.

හේතු විප්පයුත්තා ධම්මා, හෙතුන් සමග නො යෙදුනාවූ සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් අහේතුක සිත් 18 ද, එහි යෙදෙන චෛතසික 12 ද, රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

මෙහි සමාන දුක දෙකක් වදාරන ලද්දේ පුද්ගල ධ්‍යාශය හා දෙසනා විලාසය වශයෙන් ද වදාළසේක.

හෙතු සම්පයුත්ත දුකය නිමි.

ත්‍රිකමාතිකාවෙහි ස්වරූප පැහැදිළි ලෙස තිබෙන බැවින් දුක මාතිකා මෙහිදී ඒ අනුසාරයෙන් ස්වරූප බලාගැනිම පහසු වන බැවින් වැඩි විස්තර නොකළ බව කරුණාවෙන් සැලකුව මැනවි.

## 4. හේතුචේව සහේතුක දූකය.

හේතු සම්පයුත්ත දූකයට අනතුරුව හෙතුචේව සහේතුක දූකය වදළ සේක.

හේතුචේව ධම්මා සහේතුකාච
සහේතුකා චේව ධම්මා – නවහේතු යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- හේතු චේව ධම්මා සහේතුකාච, හේතුචේව හේතු නම් වන්නාවූද, හේතුන් සමග යෙදෙන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. මෝහ මූලයෙහි මෝහය හැර හේතුන් 6 ලැබෙති.

සහේතුකා චේව ධම්මා නවහේතු - සහේතුක වන්නාවූද හේතු නොවන්නාවූද ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සහේතුක සිත් 71 ද, හේතු 6 හැර චෛතසික 46 ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද සත්‍ය 2 ද ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දූක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දූක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සවිප්පදෙස දූක නම් වේ.

හේතු චේව සහේතුක දූකය නිමි.

## 5 හේතු හේතු සම්පයුත්ත දූකය

හේතු සහේතුක දූකයට අනතුරුව හේතු හේතු සම්පයුත්ත දූකය වදළ සේක.

හේතු චේව ධම්මා - හේතු සම්පයුත්තාච
හේතු සම්පයුත්තා චේව ධම්මා - නව හෙතු, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් – හේතු චේව ධම්මා – හේතු සම්පයුත්තාච, හේතු චේව හේතු නම් වූද, හේතු සම්පයුත්තාච හේතූන් සමග යෙදූනාවූද ධම්මා, සත්ව නොවූ ජීව නොවූ

ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ මෝහ මූලයෙහි මෝහය හැර හේතු 6 ලැබෙති.

හේතු සම්පයුත්තා චෙව ධම්මා නච හේතු - හේතූන් හා සම්ප්‍රයුක්තවූද, හෙතු නොවන්නාවූද ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සහේතුක සිත් 71 ද, හෙතු 6 හැර චෛතසික 46 ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

හේතු හේතු සම්පයුත්ත දුකය නිමි.

## 6. න හේතු සහේතුක දුකය

හේතු හේතු සම්පයුත්ත දුකයට අනතුරුව න හේතු සහේතුක දුකය වදළසේක.

න හේතු බෝපන ධම්මා - සහේතුකාපි
න හේතු බෝපන ධම්මා - අහේතුකාපි, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - නහේතු බෝපන ධම්මා සහේතුකාපි, හේතු නම් නොවන්නාවූද, හේතු සම්ප්‍රයුක්තවූද, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සහේතුක සිත් 71 ද, හේතු 6 හැර චෛතසික 46 ද, ලැබෙති.

න හේතු බොපන ධම්මා අහෙතුකාපි, හේතු නම් නොවන්නාවූද, අහේතුක සිත් 18 ද, චෛතසික 12 ද රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

හේතු ගොච්ඡකය නිමි.

ඒ ධර්මයෝ නම්, සිත් 89 ද චෛතසික 52 ද රූප 28 ද වේ. ස්කන්ධ 5, ආයතන 12 ධාතු 18 සත්‍ය 3 වේ.

අසංඛතා ධම්මා එකී ප්‍රත්‍යයන් ගෙන් සකස් නොකරන ලද්දවූ ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. නිර්වාණ ධාතුව ලැබෙති. ඒ ධර්ම සමූහය පද දෙකෙහිම ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ද ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුලත් වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සංඛත දුකය නිමි.

## 9. සනිදස්සන දුකය

සංඛත දුකයට අනතුරුව සනිදස්සන දුකය වදළ සේක.

සනිදස්සනා ධම්මා
අනිදස්සනා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - සනිදස්සනා ධම්මා. දැකීම් සහිත වූ වර්ණායතන රූපය නම්වූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ වර්ණ රූපයයි. ස්කන්ධ 1 ආයතන 1 ධාතු 1 සත්‍ය 1 යි.

අනිදස්සනා ධම්මා - දැකීම් ස්වභාවය නොවන්නාවූ, වර්ණ රූපය හැර රූප 27 ද, සිත් 89 ද, චෛතසික 52 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 11 ද, ධාතු 17 ද, සත්‍ය 4 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නම් ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සනිදස්සන දුකය නිමි.

## 7. චූල්ලන්තර දුකය

හේතු ගොච්ඡකයට අනතුරුව චූල්ලන්තර දුකය වදාළ සේක.

සප්පච්චයා ධම්මා
අප්පච්චයා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - සප්පච්චයා ධම්මා, කර්ම චිත්ත, ඍතු, ආහාර යන ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාවූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති.

අප්පච්චයා ධම්මා - එකී චතුර්විධ හේතූන්ගෙන් සකස් නොකරන ලද්දවූ නිර්වාණ ධාතුව ලැබෙති. ඒ පද දෙකෙහිම ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත්වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සප්පච්චය දුකය නිමි.

## 8. සංඛත දුකය

සප්පච්චය දුකයට අනතුරුව සංඛත දුකය වදාළසේක.

සංඛතා ධම්මා
අසංඛතා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් – සංඛතා ධම්මා, කර්ම, චිත්ත, ඍතු, ආහාර යන ප්‍රත්‍ය ධර්මයන්ගෙන් සකස් කරන ලද්දවූ, ධම්මා, සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්‍ම ඇත්තාහුය.

අරූපිනො ධම්මා – ශීත - උෂ්ණ ආදිය කරන කොට ගෙන විකාර නොවන ස්වභාව ඇත්තාවූ, ධම්මා සත්ව නොවූ ජීව නොවූ ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සිත් 89 ද, චෛතසික 52 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ධාතු 8 ද, සත්‍ය 4 ද ලැබෙති. මෙසේ මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

රූපී දුකය නිමි.

## 12. ලෝකිය දුකය

රූපී දුකයට අනතුරුව ලෝකිය දුකය වදාළ සේක.

ලොකියා ධම්මා
ලොකුත්තරා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ලොකියා, වෘත්ත දුක්ඛ සංඛ්‍යාත සංසාර ලෝකයෙහි පවත්නාවූ, තණ්හා දෘෂ්ටි ආදීන්වූ උපාදාන යන්ට අරමුණු වූ ධම්මා - සත්ව නොවූ, ජීව නොවූ, ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් - ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද, අටවිසි රූපය (28) ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම්:- ලෝකුත්තරා, සංසාර, වෘත්ත දුක්ඛයෙන් එතරවෙමින් පවත්නාවූ, ධම්මා, සත්ව නොවූ, ජීව නොවූ, ස්වභාවධර්ම සමූහයක් ඇත්තාහුය. උපාදාන යන්ට අරමුණු නොවන්නාවූ ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්, ලෝකෝත්තර සිත් අටය, එහි යෙදෙන චෛතසික සතිසය, නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සිවුවැදෑරුම්, ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

## 10. සප්පටිඝ දුකය

සනිදස්සන දුකයට අනතුරුව සප්පටිඝ දුකය වදළ සේක.

සප්පටිඝා ධම්මා
අප්පටිඝා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම් - සප්පටිඝා ධම්මා, හැපීම් සහිත ඕලාරික රූප 12 ලැබෙති ඒ ධර්ම සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ වෙති. ස්කන්ධ 1 යි, ආයතන 10 යි, ධාතු 10 සත්‍ය 1 යි.

අප්පටිඝා ධම්මා – හැපීම් ස්වභාවය නැත්තාවූ ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් - සිත් 89 ද, චෛතසික 52 ද, සූක්‍ෂ්ම රූප 16 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 2 ද, ධාතු 8 ද, සත්‍ය 4 ද, වේ. මෙසේ මෙ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සප්පටිඝ දුකය නිමි.

## 11. රූපි දුකය

සප්පටිඝ දුකයට අනතුරුව රූපි දුකය වදළ සේක.

රූපිනො ධම්මා
අරූපිනො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - රූපිනො ධම්මා, ශීත උෂ්ණ ආදී විරුද්ධ ප්‍රත්‍යයන්ගෙන් පහර ලැබ විකාරවන ස්වභාව ඇත්තාවූ ධම්මා, සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහ යක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - රූප 28 වේ.

පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

ලෝකිය දුකය නිමි.

## 13. කෙනචිවිඤ්ඤෙය්‍ය දුකය

ලෝකිය දුකයට අනතුරුව කෙනචි විඤ්ඤෙය්‍යා දුකය වදළ සේක.

කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා
කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම් - කෙනචි විඤ්ඤෙය්‍යා, යම්කිසි විඤ්ඤාණයකින් දත හැකිවූ, ධම්මා, සත්ව නොවූ, ජීව නොවූ, ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් - සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්‍ම සමූහය, ස්කන්ධ 5 ද ආයතන 12 ද ධාතු 18 ද සත්‍ය 4 ද වේ.

දුතිය පදයාගේ ස්වරූපාර්ථයෝ නම් - කෙනචි න විඤ්ඤෙය්‍යා, යම්කිසි විඤ්ඤාණයකින් නොදතහැකිවන්නා වූ, ධම්මා, සත්ව නොවූ, ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්‍ම සමූහය නම්, සිත් 89 ද, චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද ධාතු 18 ද, නිර්වාණයද ලැබෙති. මෙයද මුල් පදය මෙනි. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නාම ලබන හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ සියල්ල ඇතුළත් වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චූල්ලන්තර දුකය නිමි.

# 14 ආසව දුකය

චුල්ලන්තර දුකයට අනතුරුව ආසව ගොච්ඡකය වදාළ සේක.

ආසවා ධම්මා
නො ආසවා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- ආසවා ධම්මා, ආශ්‍රව නම්වූ නොහොත් භූමි වශයෙන් භවාග්‍රය දක්වාද, ධර්ම වශයෙන් ගොත්‍රභූ සිත දක්වාද, වහනය වෙමින් වැගිරෙමින් පවත්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. බොහෝ කල් පිළුණුවූ පල්වෙමින් මෙන් පවත්නා වූ ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝභ දිට්ඨි මෝහ යන ධර්මයෝ තිදෙන ලැබෙති. (කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන 4 යි) ලෝභ මූල සිත්හි ලැබෙන කාමාසව භවාසව දිට්ඨාසවාදීන් හා සියලුම අකුසල් සිත්හි ලැබෙන අවිජ්ජාසවයද යන මේ ධර්මයෝ ලැබෙති.

2 නො ආසවා ධම්මා ආසව ධර්ම නොවන්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ නම්:-සිත් 89 ද චෛතසික 49 ද රූප 28 ද නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද ආයතන 12 ද ධාතු 18 ද සත්‍ය 3 ද වේ. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

ආසව දුකය නිමි.

# 15 සාසව දුකය

ආසව දුකයට අනතුරුව සාසව දුකය වදළසේක.

සාසවා ධම්මා

ආනාසවා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්: සාසවා ධම්මා, ආශ්‍රව ධර්මයන්ට අරමුණු වන්නාවූ ධම්මා සත්නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද, රූප 28ද, වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද ආයතන 12 ද ධාතු 12 ද සත්‍ය 2 ද වේ.

2 අනාසවා ධම්මා– ආශ්‍රව ධර්මයන්ට අරමුණු නො කළ හැකි වූද අරමුණු නොවන්නාවූද ධම්මා සත්නොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් ලෝකෝත්තර සිත් 8 ද චෛතසික 36 ද නිර්වාණයද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද ආයතන 2 ද ධාතු 2 ද සත්‍ය 2 ද වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුකනම් වේ පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

සාසව දුකය නිමි

# 16 ආසව සම්පයුත්ත දුකය

සාසව දුකයට අනතුරුව ආසව සම්පයුත්ත දුකය වදළ සේක.

ආසව සම්පයුත්තා ධම්මා

ආසව විපපයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් ආසව සම්පයුත්තා ධම්මා කාමාසවාදීන් හා එකට යෙදී සම්ප්‍රයුක්ත වන්නාවූ ධම්මා සත්ව

නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්: අකුසල් සිත් 12 ද, ද්වේෂ මූල මෝහ මූල යන්හි යෙදෙන (අවිජ්ජා සවය) හැර චෛතසික 27 ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද වේ.

ආසව විප්පයුත්තා ධම්මා- ආසව ධර්මයන් හා නොයෙදුනාවූ එකට නො උපදනාවූ, ධම්මා සත්වනොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් අකුසල් සිත් 12 හැර සිත් 77 ඒ හා සමග යෙදෙන චෛතසික 38 ද ද්වේෂ මූල මෝහ මූලයන්හි යෙදුන මෝහයද රූප 28 ද නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 වැදෑරුම්. ආයතන 12 ද ධාතු18 ද සත්‍ය 3 වැදෑරුම්.

පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුළත් වන හෙයින් නිප්පදේස දුක නම් වේ.

ආසව සම්පයුත්ත දුකය නිමි

## 17 ආසව සාසව දුකය

ආසව සම්පයුත්ත දුකයට අනතුරුව ආසව සාසව දුකය වදළ සේක.

ආසවා චේව ධම්මා සාසවාච
සාසවා චේව ධම්මා නොච ආසවා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ආසවා චේව ආසව වන්නාවූද සාසවාච ආශ්‍රවයන්ට අරමුණු වන්නාවූද ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ දිට්ඨි මෝහ යන තුනයි.

2 සාසවා චේව ධම්මා - ආසව ධර්මයන්ට අරමුණු වන්නාවූද නොච ආසවා ආසව නොවන්නාවූද ධම්මා ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෞකික සිත් 81 ද.

ආසව හැර චෛතසික 49 ද, රූප 28 ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද ආයතන 12 ද ධාතු 18 ද සත්‍ය 1 ද ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පද-යෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. සියලු පරමාර්ථ ධර්ම ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ආසව සාසව දුකය නිමි.

## 18 ආසව ආසව සම්පයුත්ත දුකය

ආසව සාසව දුකයට අනතුරුව ආසව ආසව සම්පයුත්ත දුකය වදළසේක.

ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තාව
ආසව සම්පයුත්තා චෙව ධම්මා නොච ආසවා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ආසවා චෙව ධම්මා, ආසව නම් වන්නාවූද ආසව සම්පයුත්තාව ආසව ධර්ම හා සම්ප්‍රයුක්ත වන්නාවූද ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ දිට්ඨි මෝහ යන ආසව ධර්ම තුනය. මෝහ මූලයෙහි මෝහය සම්ප්‍රයුක්ත නොවේ.

2 ආසව සම්පයුත්තා චෙව ධම්මා - ආසවයන් හා සම්ප්‍ර-යුක්ත වන්නාවූ අකුසල් 12 ද චෛතසික 14 ද වේ. ඒ ධර්ම ආසව නොවන්නේය. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ආසව ආසව සම්පයුත්ත දුකය නිමි

## 19. ආසව විප්පයුත්ත සාසව දුකය

ආසව ආසවසම්පයුත්ත දුකයට අනතුරුව ආසව විප්ප යුත්ත දුකය වදාළ සේක.

ආසව විප්පයුත්තා බෝපන ධම්මා සාසවාපි
ආසව විප්පයුත්තා බෝපන ධම්මා අනාසවාපි යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්: ආසව විප්පයුත්තා බෝපන ධම්මා ආසව ධර්මයන් හා නො යෙදුනාවූ ද සාසවාපි ආසව ධර්මයන්ට අරමුණු වන්නාවූ ද ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ආසව විප්පයුත්ත වන (අකුසල් හැර) ලෞකික සිත් 69 ද, චෛතසික 38 වේ. ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහය සහ රූප 28 ද ලැබෙති.

ආසව විප්පයුත්තා බෝපන ධම්මා- ආසව විප්‍රයුක්ත වූ ලෝකෝත්තර සිත් 8 ද, චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදී ලබ්ධ නාම දුක නම්. මෙහි පරමාර්ථ ධර්ම සියල්ල ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

(මෙහි ස්වරූප ධර්ම නම් ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 සත්‍ය 4 ලැබෙති)

ආසව විප්පයුත්ත සාසව දුකය නිමි

## 20 සංයෝජන ගොච්ඡකය

ආසව විප්පයුත්ත දුකයට අනතුරුව සංයෝජන දුකය වදළ සේක.

සංයෝජනා ධම්මා
නො සංයෝජනා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සංයෝජනා ධම්මා, භව රථය නමැති සංසාරයටම සත්වයා යොදවාලන ධර්ම සංයෝජන නම් වේ. එය සූත්‍රාන්ත නය හා අභිධර්ම නය යන ක්‍රම දෙකකින්ම වදරා තිබේ. සංයෝජන ධර්ම 10 කි. ධර්ම 9 ක් වේ. ලෝභ පටිඝ මෝහ මාන දිට්ඨි විචිකිච්ඡා උද්ධච්ච ඉස්සා මච්ඡරිය යන අකුසල ධර්ම සමූහයයි.

නො සංයොජනා ධම්මා- සංයෝජන නොවන්නාවූ සිත් 89 ද, සංයෝජන ධර්ම හැර චෛතසික 43 ද, රූප 28 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද ධාතු 12 ද, සත්‍ය 3 ද ලැබෙති. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සංයෝජන දුකය නිමි

## 21 සංයෝජනීය දුකය

සංයෝජන දුකයට අනතුරුව සංයෝජනීය දුකය වදළ සේක.

සංයෝජනීයා ධම්මා
අසංයෝජනීයා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සංයෝජනීයා, සංයෝජන යන්ට අරමුණු වන්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ

ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. එ ධර්මයෝ නම්- ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද, රූප 28 ද, ලැබෙති. ස්කන්ධ 5යි ආයතන 12 ධාතු 18 සත්‍ය 2 යි. ආසංයෝජනීයා ධම්මා– සංයෝජනයන්ට අරමුණු නොවන්නාවූ ලෝකෝත්තර සිත් 8 ද චෛතසික 36 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්‍ම සමූහය ස්කන්ධ 4 ද ආයතන 2 ද ධාතු 2 ද සත්‍ය 2 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පද යෙන් නම් ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්‍ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සංයෝජනීය දුකය නිමි

## 22 සංයෝජන සම්පයුත්ත දුකය

සංයෝජනීය දුකයට අනතුරුව සංයෝජන සම්පයුත්ත දුකය වදාළසේක.

සංයෝජන සම්පයුත්තා ධම්මා
සංයෝජන විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සංයෝජන සම්පයුත්තා, දස සංයෝජනයන් හා සම්ප්‍රයුක්තවන්නාවූ, ධම්මා සත්වනොවූ, ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ, අකුසල් සිත් 12 ද, උද්ධච්ච සිතෙහි යෙදෙන මෝහය හැර ඉතිරි චෛතසික 27 ලැබෙති. ස්කන්ධ 4 ද ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති.

සංයෝජන විප්පයුත්තා, සංයෝජනයන් හා නොයෙදෙන ධම්මා, සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්මයන් ඇත්තාහුය අකුසල් හැර සිත් 77 ද, චෛතසික 38 ද, රූප 28 ද, උද්ධච්ච සිතෙහි මෝහයද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ක් ද ඇත්තාහුය. ඒ පරමාර්ථ ධර්ම සමූහය. පදදෙකක් කොට වදාළහෙයින් දුක නම්. මුල් පදයෙන් නම ලැබූ හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම වන්නේය.

සංයෝජන සම්පයුත්ත දුකය නිමි.

## 23 සංයෝජනා චෙව සංයෝජනීය දුකය

සංයෝජන සම්ප්‍රයුත්ත දුකයට අනතුරුව සංයෝජන චේව දුකය වදාළසේක.

සංයෝජනා චෙව ධම්මා සංයෝජනීයාච
සංයෝජනීයා චේව ධම්මා නොච සංයෝජනා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් සංයෝජනා චේව සංයෝජන වූද, සංයෝජනීයාච සංයෝජනයන්ට අරමුණු වන්නාවූද, ධම්මා, සත්වනොවූ, ජීවනොවූ, ස්වභාව ධර්ම ඇත්තාහුය සංයෝජන ධර්ම 9 දෙන ලැබෙති. සංයෝජනයන්ට අරමුණු වන ධර්ම ඇතත් සංයෝජන නොවන නිසා නොගතයුතුය.

සංයෝජනියා චේව ධම්මා සංයෝජනයන්ට අරමුණු වන්නාවූ ලෞකික සිත් 81 ද, සංයෝජන 9 හැර චෛතසික 43 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ, ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු, 18 ද, සත්‍ය 2 ද,වේ පරමාර්ථ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නම ලැබූ හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. නව ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වන්නේය.

සංයෝජනීය දුකය නිමි.

## 24 සංයෝජනීය සංයෝජන දුකය

සංයෝජනා චේව දුකයට අනතුරුව සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය වදාළසේක.

සංයෝජනා චෙව ධම්මා සංයෝජන සම්පයුත්තාච
සංයෝජන සම්පයුත්තා චේම ධම්මා නොච සංයෝජනා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්: සංයෝජනා චේව ධම්මා සංයෝජන වන්නාවූද, සංයෝජන සම්පයුත්ත වන්නාවූද

ධම්මා, සත්වනොවූ, ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධම්යෝ -උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහයට සම්පයුත්තවීමට සංයෝජනයක් එහි නොමැති බැවින් එම අවිජ්ජා සංයෝජනය හැර ඉතිරි සංයෝජන 9 ගනු ලැබේ.

2 සංයෝජන සම්පයුත්තා චේව- සංයෝජනයක් සමග යෙදුනාවූ ද, නොව සංයෝජනා, සංයෝජන නොවන්නාවූ ද ධම්මා, සත්වනොවූ, ජීවනොවූ ස්වභාව ධර්මයන් ඇත්තාහුය. ඒ ධම්යෝ නම්- අකුසල් සිත් 12 ද, සංයෝජන ධම් 9 හැර චෛතසික 18 ලැබෙති. ධම්යෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 1 ද වේ.

පරමාර්ථ ධම් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් නම ලබන හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලු පරමාර්ථ ධම් ඇතුළත් නොවූ හෙයින් සප්ප දෙස දුක නම් වන්නේය.

සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය නිමි.

## 25 සංයෝජන විප්පයුත්ත බෝපන දුකය

සංයෝජනීය දුකයට අනතුරුව සංයෝජන විප්පයුත්ත බෝපන දුකය වදළසේක.

සංයෝජන විප්පයුත්තා බෝපන ධම්මා සංයෝජනීයාපි
සංයෝජන විපසයුත්තා බෝපන ධම්මා අසංයෝජනයාපි
යනුවෙනි.

එහි ස්වරූපාර්ථ නම්- සංයෝජන විප්පයුත්තා බෝපන ධම්මා- සංයෝජනයන් හා නො යෙදුනාවූ, සංයෝජනයන්ට අරමුණුවූද, ධම්මා, සත්වනොවූ, ජීවනොවූ, ස්වභාව ධම් සමූහයක් ඇත්තාහුය, ඒ ධම්යෝ නම්- අකුසල් 12 හැර ලෞකික සිත් 6 ද චෛතසික 38 ද, උද්ධච්ච සිතෙහි මෝහය ද, රූප 28 ද ලැබෙති. ඒ ධම්යෝ, ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද ලැබෙති.

සංයෝජන විප්පයුත්ත කෝපන ධම්මා, සංයෝජන ධර්‍ම-යන් සමග නොයෙදුනාවූ, සංයෝජනයන්ට අරමුණු නොව-න්නාවූද, ධම්මා, සත්වනොවූ, ජීවනොවූ ස්වභාව ධර්‍ම සමූහ-යක් ඇත්තාහුය. ලෝකෝත්තර සිත් 8 ද, චෛතසික 36 ද, නිර්‍වාණයද ලැබෙති. පරමාර්ථ ධර්‍ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් නම ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්‍ම සියල්ල ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වන්නේය.

සංයෝජන ගොච්ඡකය නිමි

## 26 ගන්ථ ගොච්ඡකය

සංයෝජන විප්පයුත්ත දුකයට අනතුරුව ගන්ථ දුකය වදළ සේක.

ගන්ථා ධම්මා
නො ගන්ථා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ගන්ථා ධම්මා, සංසාරයෙහි සත්වයන් ගැටගසා තබන්නාක් මෙන් කරන බැවින් මේ ධර්‍ම යෝ ගන්ථ නම් වේ. ලෝභ, ද්වේෂ, දිට්ඨි යන තුනයි.

නො ගන්ථා ධම්මා - ගන්ථ නම් නොවන්නාවූද, ධම්මා, සත්වනොවූ, ජීවනොවූ ස්වභාව ධර්‍ම සමූහයක් ඇත්තාහුය. ගන්ථ වූන්නාවූ ලෝභ, ද්වේෂ, දිට්ඨි, තුන හැර සිත් 89 ද, චෛතසික 49 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්‍ම සමූහය, ස්කන්ධ 5 ද, ආයතන 12, ධාතු 18 ද, සත්‍ය 3ද ලැබෙති පරමාර්ථ ධර්‍ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් නම ලැබූ හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලු පරමාර්ථ ධර්‍ම මෙහි ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වන්නේය.

ගන්ථ දුකය නිමි.

## 27 ගන්ථනීය දුකය

ගන්ථ දුකයට අනතුරුව ගන්ථනීය දුකය වදළසේක.

ගන්ථනීයා ධම්මා
අගන්ථනීයා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- ගන්ථනීයා, ගන්ථ ධර්ම තුනට අරමුණු වන්නාවූ ලෞකික සිත් 81 ද, චෛතසික 49 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර් සමූහය, ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු, 18 ද, සත්‍ය 3 ලැබෙති.

ආගන්ථනීයා - ගන්ථ ධර්මයන්ට අරමුණු නොවන්නාවූ, ලොකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද, නිර්වාණයද වේ. සියලු පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මූල් පදයෙන් නම ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියල්ල ඇතුලත් හෙයින් නිප්ප දෙස දුක නම් වේ.

ගන්ථනීය දුකය නිමි

## 28. ගන්ථ සම්පයුත්ත දුකය

ගන්ථනීය දුකයට අනතුරුව ගන්ථ සම්පයුත්ත දුකය වදළ සේක.

ගන්ථ සම්පයුත්තා ධම්මා
ගන්ථ විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ගන්ථ සම්පයුත්තා ගන්ථ ධර්මයන් සමග යෙදුනාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ මූල සිත් 8 සහ ද්වේෂ මූල සිත් 2 ද යන සිත් 10 ලැබෙති. චෛතසික ලෝභ ද්වේෂ දෙක හැර 25 ලැබෙති.

ගන්ථ විප්පයුත්තා- ගන්ථ ධර්මයන් සමග නො යෙදුනාවූ ලෝභ මූල ද්වේෂ මූල සිත් 10 හැර සිත් 79 ද, චෛතසික 38 ද රූප 28 ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ආයතන 12 ධාතු 18 ද, සත්‍ය 3 ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ගන්ථ සම්පයුත්ත දුකය නිමි

## 29 ගන්ථ ගන්ථනීය දුකය

ගන්ථ සම්පයුත්ත දුකයට අනතුරුව ගන්ථ ගන්ථනීය දුකය වදළසේක.

ගන්ථා චෙව ධම්මා ගන්ථනීයාච
ගන්ථනීයා චෙව ධම්මා නොච ගන්ථා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්:- ගන්ථා චෙව ධම්මා, ගන්ථ නම් වන්නාවූද, ගන්ථනීයාච ගන්ථයන්ට අරමුණු වන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ගන්ථ ධර්ම තුන ලැබෙති.

ගන්ථනීය චෙව ධම්මා නොච ගන්ථා, ගන්ථ ධර්මයන්ට අරමුණු වන්නාවූද, ගන්ථ නො වන්නාවූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෞකික සිත් 81 ද, ගන්ථ ධර්ම 3 හැර චෛතසික 49 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 12 ද ලැබෙති. මෙසේ පද දෙකක් කොට වදළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම වේ.

ගන්ථ ගන්ථනීය දුකය නිමි.

## 30 ගන්ථ ගන්ථ සම්පයුක්ත දුකය

ගන්ථනීය දුකයට අනතුරුව ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය වදාළ සේක.

ගන්ථා චේව ධම්මා ගන්ථ සම්පයුත්තා ච
ගන්ථ සම්පයුත්තා චේව ධම්මා - නොච ගන්ථා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- ගන්ථා චේව ධම්මා, ගන්ථනම් වන්නාවූද, ගන්ථ සම්පයුත්තා ච, ගන්ථ ධර්මයන් හා සම්ප්‍රයුක්ත වන්නාවූද, ලෝභ, දිට්ඨි දෙක ලැබෙති. ද්වේෂය ගන්ථ වූවත් ගන්ථ සම්පයුත්ත නො වේ.

ගන්ථ සම්පයුත්තා චෙව - ගන්ථධර්ම හා සම්ප්‍රයුත්ත වූ ද, නොච ගන්ථා ගන්ථ නොවන්නා වූද, ධම්මා සත්ව නොවූ, ජීවයක් නොවූ ස්වභාව ධර්මයෝ ලැබෙති. එය ලෝභ මූල ද්වේෂ මූල සිත් 10 ද, ගන්ථ ධර්ම හා විචිකිච්ඡාවද හැර චෛතසික 23 ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 1 ද, සත්‍ය 1 ද ලැබෙති. මෙය ආදිලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය නිමි

## 31 ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය

ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකයම අනතුරුව ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය වදාළ සේක.
ගන්ථ විපපයුත්තා බෝපන ධම්මා ගන්ථනියාපි
ගන්ථ විප්පයුත්තා බෝපන ධම්මා අගන්ථනියාපි යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- ගන්ථ විප්පයුත්තා බෝපන ධම්මා, ගන්ථයන්ට අරමුණ නොවූද, ගන්ථ ධර්ම යන්ගෙන් විප්පයුත්ත වූද, සත්ව නොවන ජීව නොවන ස්වභාව ධර්මයෝ නම්- ලෝභ මූල ද්වේෂ මූල සිත් හැර ලෞකික සිත් 71 ද,

ද්වේෂ විචිකිච්ඡා සමග චෛතසික 40 ද, රූප 28 ද ලැබෙත. ඒ ධර්මයෝ ස්කන්ධ 5 යි. ආයතන 12 ධාතු 18 සත්‍ය 1 යි.

ගන්ථ විප්පයුත්තා ඛෝපන ධම්මා - ගන්ථ ධර්ම සමග නො යෙදුනාවූද ගන්ථ ධර්මයන්ට අරමුණු නොවන්නාවූ ද, ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද, ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාථර ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය නිමි.

## 32 ඕඝ ගොච්ඡකය

ගන්ථ දුකයට අනතුරුව ඕඝ දුකය වදළ සේක.

ඕඝා ධම්මා

නොඕඝා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - ඕඝා ධම්මා, සත්වයන් සංසාර සාගර පත්ලෙහිම ගසන්නාවූ අර්ථයෙන් ඕඝ නම්වූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම රාශියක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ දිට්ඨි මෝහ යන ධර්මයෝය. ස්කන්ධ1 ආයතන 1 ධාතු 1 යි සත්‍ය 2 යි.

නො ඕඝා ධම්මා- ඕඝ නම් නො වන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම-යෝ නම්- සිත් 89 ය. ඕඝ ධර්ම හැර චෛතසික 49 ද, රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති. මෙසේ පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

ඕඝ දුකය නිමි

## 33 ඕඝනීය දුකය

ඕඝ දුකයට අනතුරුව ඕඝනීය දුකය වදාළ සේක.

ඕඝනීයා ධම්මා
අනෝඝනීයා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - ඕඝනීයා ධම්මා, ඕඝයන්ට අරමුණු වන්නාවූ, ධම්මා සත්ව නොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්; ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද, රූප 28 ද, ලැබෙති. ස්කන්ධ 5 යි. ආයතන 12 යි ධාතු 18 සත්‍ය 2 ලැබෙති.

අනෝඝනීයා ධම්මා - ඕඝ ධර්මයන්ට අරමුණු නොවන්නා වූ ලෝකෝත්තර සිත් 8 ද, චෛතසික 36 ද නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 3 ද ලැබෙති. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලු පරමාර්ථයන් ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

ඕඝනීය දුකය නිමි

## 34 ඕඝ සම්පයුත්ත දුකය

ඕඝනීය දුකයට අනතුරුව ඕඝ සම්පයුක්ත දුකය වදාළසේක

ඕඝ සම්පයුත්තා ධම්මා
ඕඝ විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් - ඕඝ සම්පයුත්තා, ඕඝ ධර්මයන් හා සම්ප්‍රයුක්තවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය අකුසල් සිත් 12 ද, ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහයන් හැර චෛතසික 27ද, ලැබෙති.

**ඕඝ විප්පයුත්තා ධම්මා**- ඕඝ ධර්ම සමග සම්ප්‍රයුක්ත නොවූ සිත් 77 ද, චෛතසික 38 ද, ද්වේෂ මූල මෝහ මූලයන් සමග යෙදුන මෝහයන්ද රූප 28 ද, නිර්වාණයද. ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් නම් ලබන හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

ඕඝ සම්පයුත්ත දුකය නිමි

## 35 ඕඝා චෙව ඕඝනීය දුකය

ඕඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඕඝ ඕඝනීය දුකය වදාළ සේක.

ඕඝා චේව සම්මා ඕඝනීයාච
ඕඝනීයා චේව ධම්මා නොච ඕඝා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ඕඝා චේව ධම්මා, ලෝභ මූල යෙහි ලැබෙන ඕඝ ධර්ම 3 ලැබෙති. (ලෝභ දිට්ඨි මෝහ) ඕඝනීයාච ඕඝනාම් වන්නාවූද ඕඝයන්ට අරමුණ වන්නාවූද ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය.

ඕඝනීයා චේව ධම්මා නොච ඕඝා - ඕඝ ධර්මයන්ට අරමුණ වන්නාවූද ඕඝ නොවන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් ලෞකික සිත් 81 ද, ඕඝ නොවන චෛතසික 49 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 1 ද වේ. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලුම පරමාර්ථ ධර්ම ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ඕඝනීය දුකය නිමි

## 36 ඕඝ ඕඝ සම්පයුත්ත දුකය

ඕඝ ඕඝනීය දුකයට අනතුරුව ඕඝ ඕඝ සම්පයුත්ත දුකය වදාළ සේක.

ඕඝා චේව ධම්මා ඕඝ සම්පයුත්තාච
ඕඝ සම්පයුත්තා චේව ධම්මා නොච ඕඝා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- ඕඝා චේව ඕඝ නම් වන්නාවූද, ඕඝ සම්පයුත්තාචි ඕඝ සම්පයුක්ත වන්නාවූ ද, ධම්මා, සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම යෝ නම්-ලෝභ මූල සිත් සමග යෙදුනාවූ ඕඝ ධර්ම 3 ලැබෙති.

ඕඝ සම්පයුත්තා චේව ධම්මා නොච ඕඝා - ඕඝයන් හා සම්ප්‍රයුක්ත වන්නාවූද ඕඝ නොවන්නාවූ ද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- අකුසල් සිත් 1 සහ ලෝභ මූල 8 ඕඝ ධර්ම හැර චෛත සික 18 ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවන හෙයින් සප්පදෙස දුක නම් වේ.

ඕඝ සම්පයුත්ත දුකය නිමි

## 37 ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය

ඕඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය වදාළ සේක.

ඕඝ විප්පයුත්තා ඛෝපන ධම්මා ඕඝනියාපි
ඕඝ විප්පයුත්තා ඛෝපන ධම්මා අනෝඝනියාපි යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- ඕඝ විප්පයුත්තා ඕඝ ධර්මයන් සමග නොයෙදුනාවූද, ඕඝ ධර්මයන්ට අරමුණු වන්නාවූද ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- අකුසල් සිත් ලෝභ 8 හැර ලෞකික සිත්73

ද, චෛතසික 43 ද, මෝහ ද්වේෂ 4 විචිකිච්ඡා සිත්හි මෝහයන්ද, රූප 28 ද, ලැබෙති. ස්කන්ධ 5 යි ආයතන 12 යි ධාතු 18 සත්‍ය 1 ලැබෙති

ඕඝ විප්පයුත්තා චෝපන ධම්මා- ඕඝයන් සමග නොයෙදෙන්නාවූද, ඕඝ නොවන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්- ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36ද නිර්වාණයද ලැබෙති ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද ධාතු 2 ද, සත්‍ය 3 ද ලැබෙති. මෙසේ මේ ධර්ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය නිමි

## 38 යෝග ගොච්ඡකය

ඕඝ ගොච්ඡකයට අනතුරුව යෝග ගොච්ඡකය වදළ සේක.

යෝගා ධම්මා
නො යෝගා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝගා ධම්මා සත්වයන් සසරෙහි යොද ලන්නාවූ, ධම්මා, සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම් ලෝභ දිට්ඨි මෝහ තුන ලැබෙති. (ප්‍රභෙද වශයෙන් කාමයෝග, භවයෝග දිට්ඨි යෝග අවිජ්ජායෝග යන 4 යි)

නො යෝගා ධම්මා- යෝග නම නොවන්නාවූද, ධම්මා සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්- අකුසල් සිත් 12 හැර සිත් 77 ද, චෛතසික 38 ද, ද්වේෂ මූල මෝහ මූල යන්හි යෙදුන මෝහයද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද ධාතු 18 ද, සත්‍ය 3 ද වේ. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන්

ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

යෝග දුකය නිමි

## 39 යෝගනීය දුකය

යෝග දුකයට අනතුරුව යෝගනීය දුකය වදළසේක.

යෝගනීයා ධම්මා
අයෝගනීයා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝගනීය ධම්මා, කාමයෝග ආදීන්ට අරමුණු වන්නාවූ ලෞකික සිත් 81 ද, චෛතසික 52ද රූප 28 ද ලැබෙති. ස්කන්ධ 5 යි, ආයතන 2 යි. ධාතු 18 සත්‍ය1

අයෝගනීයා ධම්මා, යෝග ධර්මයන්ට අරමුණු නොවන්නා වූ ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝකෝත්තර සිත් 8 ද චෛත සික 36 නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 3 ද ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් හෙයින් නිප්පදෙස දුක නම් වේ.

යෝගනීය දුකය නිමි

## 40 යෝග සම්පයුත්ත දුකය

යෝගනීය දුකයට අනතුරුව යෝග සම්පයුත්ත දුකය වදළ සේක.

යෝග සම්පයුත්තා ධම්මා
යෝග විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝග සම්පයුත්තා ධම්මා, යෝග ධර්මයන් හා සම්ප්‍රයුක්ත වන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ,

නම්- අකුසල් සිත් 12 ද ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහය හැර චෛතසික 27 ද, ලැබෙති. ස්කන්ධ 4 ආයතන 2 යි. ධාතු 2 සත්‍ය 2 යි.

යෝග විප්පයුත්තා ධම්මා- යෝග ධර්ම සමග සම්ප්‍රයුක්ත නොවන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ඉතිරි සිත් 77 ද, චෛතසික 38 ද, ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහයද රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

## 41 යෝගා යෝගනීය දුකය

යෝග සම්පයුත්ත දුකයට අනතුරුව යෝගා යෝගනීය දුකය වදළ සේක.

යෝගා චේව ධම්මා යෝගනීයාච
යෝගනීයා චේව ධම්මා නෝච යෝගා යනුවෙති.

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝගා චේව ධම්මා, යෝග නම් වන්නාවූද, යෝගනීයාච යෝගයන්ට අරමුණු වන්නාවූද ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ දිට්ඨි මෝහ යන 3 යි.

යෝගනීයා චේව ධම්මා නෝච යෝගා යෝග ධර්මයන්ට අරමුණු වන්නාවූද, යෝග නොවන්නාවූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෞකික සිත් 81 ද, යෝග ධර්ම හැර චෛතසික 49 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18ද, සත්‍ය 1 ද ලැබෙති. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්, මුල් පදයෙන් නම් ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

## 42 යෝග යෝග සම්පයුත්ත දුකය

යෝගයෝගනීය දුකයට අනතුරුව යෝග යෝග සම්පයුත්ත දුකය වදළසේක.

යෝගා චේව ධම්මා යෝග සම්පයුත්තාච
යෝග සම්පයුත්තා චේව ධම්මා නෝච යෝගා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝගා චේව ධම්මා යෝග නම් වන්නාවූද, යෝග සම්පයුත්තාච යෝග ධර්ම හා සම්පයුක්ත වන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝභ දිට්ඨි මෝහ තුන ලැබෙති.

යෝග සම්පයුත්තා චේව ධම්මා- යෝග ධර්ම හා සම්ප්‍රයුක්ත වන්නාවූද, නෝච යෝගා යෝග නම් නොවන්නාවූද ධම්මා සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- අකුසල් සිත් 12 සහ යෝග ධර්ම හැර චෛතසික 24 ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 1 ද, ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

යෝග යෝග සම්පයුත්ත දුකය නිමි

## 43 යෝග විප්පයුත්ත යෝගනීය දුකය

යෝග යෝග සම්පයුත්ත දුකයට අනතුරුව යෝග විප්පයුත්ත යෝගනීය දුකය වදළසේක.

යෝග විප්පයුත්තා ඛෝපන ධම්මා යෝගනීයාපි
යෝග විප්පයුත්තා ඛෝපන ධම්මා අයෝගනීයාපි යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- යෝගවිප්පයුත්තා ඛෝපන ධම්මා-යෝගයන් සමග නොයෙදුනාවූ ධම්මා, සත්‍වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. යෝගනීයාපි

යෝගයන්ට අරමුණු වන්නාවූ ස්වභාව ධර්ම සමූහය නම්– ලෞකික සිත් 69 ද, (අකුසල් හැර) ඒ සමග යෙදෙන චෛතසික 38 ද ලැබෙති. ස්කන්ධ 4 යි. ආයතන 2 යි ධාතු 2 යි සත්‍ය 1

යෝග විප්පයුත්තා චෝපන ධම්මා අයෝගනීයාපි යෝග ධර්ම සමග නො යෙදුනාවූද, යෝගයන්ට අරමුණු නොවන්නාවූද, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

යෝග විප්පයුත්ත යෝගනීය දුකය නිමි

## 14 නීවරණ ගොච්ඡකය

යෝග ගොච්ඡකයට අනතුරුව නීවරණ ගොච්ඡකය වදළ සේක.

නීවරණා ධම්මා
නො නීවරණා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්– නීවරණා ධම්මා නීවරණ නම්වූ නිවන් මග හා සුගති මගද ආවරණය කරන්නාවූ, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්– කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා, යන අකුසල ධර්ම 5 ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 1 යි ආයතන 1 යි, ධාතු 1 යි, සත්‍ය 2 යි.

නො නීවරණාධම්මා- නීවරණ නො වන්නාවූ ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, නීවරණ හැර චෛතසික 44 ද, රූප 28 ද නිර්වාණයද ලැබෙති, ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද ආයතන 12 ද

ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති. පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

නීවරණ දුකය නිමි.

## 45 නීවරණීය දුකය

නීවරණ දුකයට අනතුරුව නීවරණීය දුකය වදාළ සේක.

නීවරණීයා ධම්මා
අනීවරණීයා ධම්මා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- නීවරණීයා ධම්මා, නීවරණ ධර්ම යන්ට අරමුණු වන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්- ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද රූප 28 ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය 2 ද ලැබෙති.

අනීවරණීයා ධම්මා- නීවරණයන්ගෙන් අරමුණු නොකළ හැකිවූ ලෝකෝත්තර සිත් 8 ද, චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද, ලැබෙති. මෙසේ මේ ධර්මයන් පද දෙකක් කොට වදාළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති. හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

නිවරණීය දුකය නිමි.

## 46 නීවරණ සම්පයුත්ත දුකය

නීවරණීය දුකයට අනතුරුව නීවරණ සම්පයුත්ත දුකය වදාළ සේක.

නීවරණ සමපයුත්තා ධම්මා
නීවරණ විප්පයුත්තා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- නීවරණ සමපයුත්තා ධම්මා, නිවරණයන් හා සම්ප්‍රයුක්ත වන්නාවූ ස්වභාව ධර්මයෝ නම් අකුසල් සිත් 12 ද චෛතසික නීවරණ හැර 19 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද ආයතන 2 ද, ධාතු 2 ද සත්‍ය 1 දලබෙති

නීවරණ විප්පයුත්තා ධම්මා- නීවරණ ධර්මයන් හා නො යෙදෙන්නාවූ, ධම්මා සත්වනොව ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම අකුසල ධර්ම හැර ඉතිරි සිත් 77 ද, චෛතසික 38 ද ද්වේෂ මූල මෝහ මූල යන්හි මෝහය සහ රූප 28 ද නිර්වාණ යද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5ද, ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය 3 ලැබෙති.

පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

නීවරණ සම්පයුත්ත දුකය නිමි

## 47 නීවරණ නීවරණීය දුකය

නීවරණ සම්පයුත්ත දුකයට අනතුරුව නීවරණ නිවරණීය දුකය වදාළ සේක.

නීවරණා චෙව ධම්මා නීවරණීයාච
නීවරණීයා චෙව ධම්මා නොච නිවරණා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- නීවරණම චෙව ධම්මා, නීවරණ වන්නාවූද නීවරණයන්ට අරමුණු වන්නාවූද, ධම්මා, සත්ව නොවූ ජීවනොවූ ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්ම සමූහය **නීවරණ ධර්ම 5 ලැබෙති.**

නීවරණියා චෙව ධම්මා නොච නීවරණා - නීවරණයන්ට අරමුණු වන්නාවූද, නීවරණ නො වන්නාවූද ලෞකික සිත් ද, නීවරණ හැර චෛතසික 44 ද, රූප 28 ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 1 ද වේ. පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. පළමු පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. ලෝකෝත්තර ධර්ම ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

නීවරණ නීවරණීය දුකය නිමි.

## 48 නීවරණා නීවරණ සම්පයුත්ත දුකය

නීවරණීය දුකයට අනතුරුව නීවරණ නීවරණ සම්පයුත්ත දුකය වදළසේක.

නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්තාච
නීවරණ සම්පයුත්තා චෙව ධම්මා නොච නීවරණා
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- නීවරණා චෙව ධම්මා, නීවරණ නම් වූද, නීවරණ සම්පයුත්තාච නීවරණයන්හා සම්ප්‍රයුක්ත වූද, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය, ඒ ධර්ම සමූහය නම් නීවරණ ධර්ම 5 යි.

නීවරණ සම්පයුත්තා චෙව ධම්මා නොච නීවරණා නීවරණ යන් හා සම්ප්‍රයුක්ත වූද, නීවරණ නො වන්නාවූද, ධම්මා, සත්ව නොවූ, ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම යෝ නම්- අකුසල් 12 ය නීවරණ හැර චෛතසික 19 ලැබෙති ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 1 ද වේ. මෙසේ පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නො වූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

නීවරණා නීවරණ සම්පයුත්ත දුකය නිමි.

## 49 නීවරණ විප්පයුත්ත නීවරණ දුකය

නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්ත දුකයට අනතුරුව නීවරණ විප්පයුත්ත නීවරණ දුකය වදාළ සේක.

නීවරණ විප්පයුත්තා බෝපන ධම්මා නීවරණියා පි
නීවරණ විප්පයුත්තා බෝපන ධම්මා අනීවරණියා පි
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම් නීවරණ විප්පයුත්තා නීවරණ සමග සම්ප්‍රයුක්ත නොවූද, නීවරණියාපි, නීවරණයන්ට අරමුණු වන්නාවූද, ධම්මා, සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- අකුසල් හැර ලෞකික සිත් 69 ද, චෛතසික 38 ද, රූප 28 ද, ලැබෙති.

නීවරණ විප්පයුත්තා බෝපන ධම්මා අනීවරණියාපි නීවරණ ධර්ම සමග නො යෙදුනාවූද, නීවරණ නොවන්නාවූද ධම්මා ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝකෝත්තර සිත් 8 සහ එහි යෙදෙන චෛතසික 36 ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද සත්‍ය 3 ද, වේ. මෙසේ පරමාර්ථ ධර්ම සියල්ල පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

නීවරණ ගොච්ඡකය නිමි.

## 50 පරාමාස ගොච්ඡකය

නීවරණ ගොච්ඡකයට අනතුරුව පරාමාස ගොච්ඡකය වදාළ සේක.

පරාමාසා ධම්මා
නො පරාමාසා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- පරාමාසා ධම්මා, මිථ්‍යා වශයෙන් වරදවා අල්ලාගන්නා ලද්දවූ, ධම්මා, සත්ව නොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. (මිථ්‍යාදිට්ඨි සියල්ල ගනු ලැබේ.)

නො පරාමාසා ධම්මා- පරාමාස නො වන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්ම සමූහය මිථ්‍යා දිට්ඨිය හැර සිත් 89 ද, චෛතසික 51 ද, රූප 28 ද, නිර්වාණය ද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

## 51 පරාමට්ඨ දුකය

පරාමාස දුකයට අනතුරුව පරාමට්ඨ දුකය වදාළ සේක.

පරාමට්ඨා ධම්මා

අපරාමට්ඨා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- පරාමට්ඨා ධම්මා, පරාමාස නම්වූ මිථ්‍යා දිට්ඨියට අරමුණු වන්නාවූ, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම සමූහය නම්- ලෞකික සිත් 81 ද, චෛතසික දිට්ඨිය හැර 51 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද වන්නේය.

අපරාමට්ඨා ධම්මා පරාමාස වූ මිථ්‍යා දිට්ඨියට අරමුණු නොවන්නාවූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 නිර්වාණයද ලැබෙති, ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද, වේ. පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

## 52 පරාමාස සම්පයුත්ත දුකය

පරාමට්ඨ දුකයට අනතුරුව පරාමාස සම්පයුත්ත දුකය වදාළ සේක.

පරාමාස සම්පයුත්තා ධම්මා
පරාමාස විප්පයුත්තා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- පරාමාස සම්පයුත්තා, පරාමාස යන් සමග යෙදුනාවූ, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. පරාමාස නම්වූ මිථ්‍යා දිට්ඨිය සමග යෙදුනාවූ දිට්ඨි සම්පයුත්ත සිත් 4 ද, දිට්ඨිය හැර චෛතසික 20 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2ද සත්‍ය 2 ද වේ.

පරාමාස විප්පයුත්තා පරාමාසයන් හා නො යෙදුනාවූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- දිට්ඨි සම්පයුත්ත සිත් 4 හැර, සිත් 85 ද, දිට්ඨිය හැර චෛතසික 51 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය 4 ද, ලැබෙති. මෙසේ පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

පරාමාස සම්පයුත්ත දුකය නිමි.

## 53 පරාමාස පරාමට්ඨ දුකය

පරාමාස සම්පයුත්ත දුකයට අනතුරුව පරාමාස පරාමට්ඨ දුකය වදාළ සේක.

පරාමාසා චේව ධම්මා පරාමට්ඨා ච
පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- පරාමාසා චේව ධම්මා පරාමාස වන්නාවූද පරාමට්ඨා ච, පරාමාසයන්ට අරමුණු වන්නාවූද,

ධම්මා, මිථ්‍යා දිට්ඨිය සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්ම සමූහය ස්කන්ධ 1 ද, ආයතන 1 ද, ධාතු 1 ද, සත්‍ය 1 ද වේ.

පරාමට්ඨා චේව ධම්මා නොච පරාමාසා- පරාමාසයන්ට අරමුණුවන්නාවූද, පරාමාස නොවන්නාවූද, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ ලෞකික සිත් 81 ද, දිට්ඨිය හැර චෛතසික 51 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 2 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද ලැබෙති. මෙසේ පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

පරාමාස පරාමට්ඨ දුකය නිමි

## 54 පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය.

පරාමාස පරාමට්ඨ දුකයට අනතුරුව පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය වදළ සේක.

පරාමාස විප්පයුත්ත ඛෝපන ධම්මා පරාමට්ඨා පි
පරාමාස විප්පයුත්ත ඛෝපන ධම්මා අපරාමට්ඨාපි යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- පරාමාස විප්පයුත්තා ඛෝපන ධම්මා පරාමට්ඨාපි- පරාමාසයන් සමග නො යෙදුනාවූ ද, පරාමාසයන්ට අරමුණුවන්නා වූද, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. දිට්ඨිය ද දිට්ඨි සම්පයුත්ත සිත් 4 ද හැර, ලෞකික සිත් 77 ද, දිට්ඨිය හැර චෛතසික 51 ද, රූප 28 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5ද , ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද වේ.

පරාමාස විප්පයුත්තා ඛෝපන ධම්මා අපරාමට්ඨාපි පරාමාසයන් සමග නො යෙදුනාවූද, පරාමාස නො වන්නාවූද ධම්ම සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝකෝත්තර සිත් 8 ද, චෛතසික 36 ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු2 ද, සත්‍ය 2 ද, ලැබෙති. මෙසේ පරමාර්ථ ධර්ම පද දෙකක්

කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

පරාමාස ගොච්ඡකය නිමි.

## 55 සාරම්මණ දුකය

පරාමාස ගොච්ඡකයට අනතුරුව මහන්තර දුකය වදළ සේක.

සාරම්මණා ධම්මා
අනාරම්මණා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සාරම්මණා ධම්මා, අරමුණු ගන්නා සිත් 89 ද, චෛතසික 52 ද ලැබෙති. ඒ ධර්මයෝ සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම වන්නේය. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 8 ද, සත්‍ය 2 ද, වේ.

අනාරම්මණ ධම්මා අරමුණු ගත නො හැකි සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක්ද ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් -රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 1 ද ආයතන 11 ද, ධාතු 11 ද, සත්‍ය 2 ද, වේ, මෙසේ පරමාර්ථ ධර්ම සියල්ල පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්ප දෙස දුක නම් වේ.

සාරම්මණ දුකය නිමි.

## 56 චිත්තා දුකය

සාරම්මණ දුකයට අනතුරුව චිත්ත දුකය වදාළ සේක
චිත්තා ධම්මා
නො චිත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්තා ධම්මා, සිත් 89 ලැබෙති ස්කන්ධ 1 ආයතන 1 යි ධාතු 2 යි සත්‍ය 1යි නො චිත්තා ධම්ම සිත් හැර චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. සත්වනොවූ ජීවනොවූ ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන11 ද, ධාතු 1 ද, සත්‍ය 4 ද, ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත දුකය නිමි.

## 57 චෙතසික දුකය

චිත්ත දුකයට අනතුරුව චේතසික දුකය වදාළ සේක.
චේතසිකා ධම්මා
අචේතසිකා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චේතසිකා ධම්මා, චේතසික නම්වූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ, ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික ධර්ම 52 ලැබෙති

අචේතසිකා ධම්මා- චෛතසික නොවූ ධර්මයෝ ලැබෙති ඒ ධර්ම සමූහය නම් සිත් 89 ද, රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 2 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 වේ. මේ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චෛතසික දුකය නිමි.

## 58 චිත්ත සම්පයුත්ත දුකය

චේතසික දුකයට අනතුරුව චිත්ත සම්පයුත්ත දුකය වදාළ සේක.

චිත්ත සම්පයුත්තා ධම්මා
චිත්ත විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්ත සම්පයුත්තා ධම්මා, සිත සමග හටගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික 52 වේ. ස්කන්ධ 3 යි. ආයතන 1 යි. ධාතු 1 යි සත්‍ය 3 යි

චිත්ත විප්පයුත්තා ධම්මා- සිත සමග මිශ්‍ර නොවන්නාවූ ධම්මා, සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, රූප 28 ද, නිර්වාණ ය ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 2 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සම්පයුත්ත දුකය නිමි.

## 59 චිත්ත සංසට්ඨ දුකය

චිත්ත සම්පයුත්ත දුකයට අනතුරුව චිත්ත සංසට්ඨ දුකය වදාළ සේක.

චිත්ත සංසට්ඨා ධම්මා
චිත්ත විසංසට්ඨා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්ත සංසට්ඨා ධම්මා, සිත හා සමග මිශ්‍ර වී හටගන්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ, ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් චෛතසික 52 වේ. ස්කන්ධ 3 යි ආයතන 1 යි ධාතු 1 සත්‍ය 3 යි

චිත්ත විසංසට්ඨා ධම්මා, සිත සමග මිශ්‍ර නොවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 2 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2ද ලැබෙති. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. සියලු පරමාර්ථ ධර්ම ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සංසට්ඨ දුකය නිමි.

## 60 චිත්ත සමුට්ඨාන දුකය

චිත්ත සංසට්ඨ දුකයට අනතුරුව චිත්ත සමුට්ඨාන දුකය වදළ සේක.

චිත්ත සමුට්ඨානා ධම්මා
නො චිත්ත සමුට්ඨානා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්ත සමුට්ඨානා ධම්මා- සිත කරන කොට ගෙන හටගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් චෛත සික 52 සහ චිත්තජ රූප 17 ද, ලැබෙති. ස්කන්ධ 4 යි ආයතන 6 ධාතු 6 සත්‍ය 3 යි.

නො චිත්ත සමුට්ඨානා ධම්මා, සිත කරන කොට ගෙන හට නො ගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, කර්මජ රූප 20 ද, ඍතුජ රූප 15 ද, ආහාරජ රූප 14 ද, හා නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 2 ද, ආයතන 12 ද ධාතු 18 ද, සත්‍ය 2 ද, ලැබෙති. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සමුට්ඨාන දුකය නිමි.

## 61 චිත්ත සහභූ දුකය

චිත්ත සමුට්ඨාන දුකයට අනතුරුව චිත්ත සහභූ දුකය වදාළ සේක.

චිත්ත සහභුනො ධම්මා
නො චිත්ත සහභු නො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්ත සහභුනො ධම්මා, සිත සමග හටගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික 52 ද, විඤ්ඤත්ති රූප 2ද, ලැබෙති. ස්කන්ධ 4 ද, ආයතන 1 යි ධාතු 1යි සත්‍ය 3 යි

නො චිත්ත සහභුනො ධම්මා සිත සමග හට නොගන්නා වූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, විඤ්ඤත්ති රූප 2 හැර ඉතිරි රූප 26 ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 2 ආයතන 12 ද, ධාතු 18ද, සත්‍ය 1යි ලැබෙති. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සහභූ දුකය නිමි.

## 62 චිත්තානු පරිවත්ති දුකය

චිත්ත සහභූ දුකයට අනතුරුව චිත්තානු පරිවත්ති දුකය වදාළ සේක.

චිත්තානු පරිවත්තිනො ධම්මා
නො චිත්තානු පරිවත්තිනො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්තානු පරිවත්තිනො ධම්මා, සිත සමග පෙරලෙන්නාවූද, චෙතස්ව සිදියන්නාවූද, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ

ධර්මයෝ නම්- චෛතසික 52 සහ විඤ්ඤත්ති රූප 2 ද ලැබෙති ස්කන්ධ 4 යි ආයතන 1 යි. ධාතු 1 යි සත්‍ය 3යි

නො චිත්තානු පරිවත්තිනො ධම්මා- සිත සමග පෙරලී නො යන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, විඤ්ඤත්ති රූප දෙක හැර රූප 26 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 2ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2ද ලැබෙති මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නම් ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්‍ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්තානු පරිවත්ති දුකය නිමි.

## 63 චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය

චිත්තානු පරිවත්ති දුකයට අනතුරුව චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය වදළ සේක.

චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්තසංසට්ඨ සමුට්ඨානා ධම්මා සිත සමග උපදනාවූ ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික 52 ලැබෙති. ඒ ධර්ම ස්කන්ධ 3 යි ආයතන 1යි ධාතු 1 සත්‍ය 3 යි

නො චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා- සිත සමග නූපදනා ධර්මයෝ ලැබෙති. ඒ ධර්ම සමූහය සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයකි. ඒ ධර්මයෝ නම් සිත් 89ද රූප 28 ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18ද, සත්‍ය 4 ද ලැබෙති. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පද යෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය නිමි.

## 64 චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකය

චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකයට අනතුරුව චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකය වදාළ සේක.

චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා,
නො චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්:- චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ නො ධම්මා-සිත හා සම්ප්‍රයුක්තව සිත සමගම එක්ව යෙදෙන්නාවූ, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික 52 ද වේ. එය ස්කන්ධ 3 යි, ආයතන 1 ද, ධාතු 1 ද, සත්‍ය 3 ද වේ.

නො චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්ම- සිත් සමග නූපදනා, ධම්මා, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ සිත් 89 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 2 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතු ලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සමුට්ඨාන සහභූ සමුට්ඨාන දුකය නිමි.

## 65 චිත්ත සංසට්ඨ සමුට්ඨානා පරිවත්ති දුකය

චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකයට අනතුරුව චිත්ත සංසට්ඨා සමුට්ඨා නානු පරිවත්ති දුකය වදාළ සේක.

චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්තිනො ධම්මා
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්තිනො ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරි වත්ති නො ධම්මා- සිත සමග මිශ්‍රවූද, සිත නිසා හටගන්නාවූද, අනුපරිවත්තිනො, ධම්මා, සිත අනුව පෙරළෙන්නාවූ ද,

සත්වනොවූ ජීවනොවූ, ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- චෛතසික 52 වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 3ද, ආයතන 1 ද, ධාතු 1 සත්‍ය 3 ද වේ.

නො චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්තිනො ධම්මා සිත අනුව සිත නිසා හට නො ගන්නාවූ, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- සිත් 89 ද, රූප 28ද, නිර්වාණය ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 2 ද, ආයතන 12ද, ධාතු 18ද, සත්‍ය 2 ද වේ. මේ ධර්මයෝ පදදෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්ති දුකය නිමි.

## 66 අජ්ඣත්ති දුකය

චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්ති දුකයට අනතුරුව අජ්ඣත්තික දුකය වදාළ සේක.

අජ්ඣත්තිකා ධම්මා
බාහිරා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- අජ්ඣත්තිකා ධම්මා, තමාගේ ආත්මය අධිපති කොට ගන්නාවූ ධර්මයෝ නම්- සිත් 81 ද, ප්‍රසාද රූප 5 ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 2 ද, ආයතන 6 ද, ධාතු 12 ද, සත්‍ය 1 ද වේ.

බාහිරා ධම්මා- ඒ බාහිර ධර්මයෝ නම් චෛතසික 52 ද, රූප 23 ද, නිර්වාණයද ලැබෙති ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 6 ද, ධාතු 6 ද, සත්‍ය 4 ද වේ. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

අජ්ඣත්තික දුකය නිමි.

## 67 උපාදා දුකය

අජ්ඣත්ත දුකයට අනතුරුව උපාද දුකය වදළ සේක.

උපාද ධම්මා

නො උපාද ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාද ධම්මා, යමක් නිශ්‍රය කොට ගෙන හටගන්නාවූ, සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්යෝ ලැබෙති. ඒ ධර්මයෝ නම් මහාභූත රූප නිසා හට–ගන්නාවූ උපාද රූප 24 ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 1 ද, ආයතන 10 ද, ධාතු 10 ද, සත්‍ය 1 ද වේ.

නො උපාද ධම්මා- යමක් නිශ්‍රය නොකොට හටගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්– උපාද රූප හැර මහාභූත රූප 4 ද, සිත් 89 ද, චෛතසික 52 ද නිර්වාණය ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 3 ද, ධාතු 9 ද, සත්‍ය 4 ද, වේ. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

උපාද දුකයට නිමි.

## 68 උපාදින්න දුකය

උපාද දුකයට අනතුරුව උපාදින්න දුකය වදළ සේක.

උපාදින්නා ධම්මා

අනුපාදින්නා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදින්නා ධම්මා, කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් අල්ලා ගන්නා ලද තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අරමුණු කොට ගන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෞකික විපාක සිත් 32 ද, චෛතසික 35 ද, කර්මජ රූප 20 ද

ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 11 ද, ධාතු 17 ද සත්‍ය 1 ද වේ.

අනුපාදින්නා ධම්මා- තෘෂ්ණා දෘෂ්ටීන් ගෙන් යුක්ත කර්‍මය විසින් අරමුණු කොට තමාගේ ඵල භාවයෙන් නො ගන්නා ලද සත්වනොවූ ජීවනොවූ ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්ම යෝ ලෞකික විපාක සිත් හැර ඉතිරි සිත් 57 ද, චෛසික 52ද, චිත්තජ රූප 17 ද, ඍතුජ රූප 15 ද, ආහාරජ රූප 14 ද, නිර්-වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 7 ද, ධාතු 8 ද, සත්‍ය 4 ද ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුකනම් වේ

උපාදින්න දුකය නිමි.

## 69 උපාදන ගොච්ඡකය

මහන්තර දුකයට අනතුරුව උපාදන ගොච්ඡකය වදළ සේක.

උපාදනා ධම්මා
නො උපාදනා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදනා ධම්මා, ඉතා දැඩි කොට අල්ලා ගන්නා අර්ථයෙන් උපාදන නම්වූ, ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝභය හා දිට්ඨියයි. (උපාදන වශයෙන් කාම උපාදනාදීන් ශතු ලැබෙ) ඒ ධර්මයෝ ස්කන්ධ 1 ද, ආයතන 1 ද, ධාතු 1 ද සත්‍ය 2 ද වේ.

නො උපාදනා ධම්මා- උපාදන නො වන්නාවූද සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝභ දිට්ඨි දෙක හැර චෛතසික 50 ද, සිත් 89 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම්

ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

උපාදන දුකය නිමි.

## 70 උපාදනිය දුකය

උපාදන දුකයට අනතුරුව උපාදනිය දුකය වදාළ සේක.

උපාදනියා ධම්මා
අනුපාදනියා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදනියා ධම්මා, උපාදනයන්ට අරමුණු වන ලෞකික සිත් 81 ද, චෛතසික 52 ද, රූප 28 ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18ද සත්‍ය 2 ද ලැබෙති.

උපාදනියා ධම්මා- උපාදනයන් ගෙන් අරමුණු නො කළ හැකි ලෝකෝත්තර සිත් 8 හා චෛතසික 36 ද, නිර්වාණය ද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 3 ද, ආයතන 2 ද, ධාතු 2ද සත්‍ය 2 ද, ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

උපාදනිය දුකය නිමි.

## 71 උපාදන සම්පයුත්ත දුකය

උපාදනිය දුකයට අනතුරුව උපාදන සම්පයුත්ත දුකය වදාළ සේක.

උපාදන සම්පයුත්තා ධම්මා
උපාදන විප්පයුත්තා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදන සම්පයුත්තා ධම්මා, උපාදනයන් හා සම්ප්‍රයුක්ත වන්නාවූ ලෝභ මූල සිත් 8 ද, දිට්ඨි විප්පයුත්ත සිත් 4 හි යෙදෙන ලෝභය හා දෝෂ ඉස්සා මච්ඡරිය. කුක්කුච්ච විචිකිච්ඡා හැර ඉතිරි චෛතසික 22 දවේ.

ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද, ලැබෙති.

උපාදන විප්පයුත්තා ධම්මා–උපාදන සමග නො යෙදුනාවූ ලෝභ මූල සිත් 8 හැර සිත් 81 ද, ලෝභ දිට්ඨි මාන හැර චෛතසික 49 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 18ද, සත්‍ය 3 ද ලැබෙති. (උපාදන විප්පයුත්ත ලෝභය හැර) මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුළත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

උපාදන සම්පයුත්ත දුකය නිමි.

## 72 උපාදන උපාදනීය දුකය

උපාදන සම්පයුත්ත දුකයට අනතුරුව උපාදන උපාදනීය දුකය වදළ සේක.

උපාදනා චේව ධම්මා උපාදනීයා ච
උපාදනීයා චේව ධම්මා නොච උපාදානා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදානා චේව ධම්මා උපාදානීයාච, උපාදාන වන්නාවූ ද, උපාදනයන්ට අරමුණු වන්නාවූද ලෝභ දිට්ඨි දෙක ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 1 ද, ආයතන 1 ද, ධාතු 1 ද, සත්‍ය 2 ද වේ.

උපාදනා චේව ධම්මා නොච උපාදනා- උපාදනයන්ට අරමුණු වන්නාවූද, උපාදන නො වන්නාවූද, සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෞකික සිත් 18 ද, ලෝභ දිට්ඨි හැර චෛතසික 50 ද, රූප 28ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය 1 ද වේ. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුළත් නොවන හෙයින් සප්පදෙස දූක නම් වේ.

උපාදන උපදනිය දුකය නිමි.

## 73 උපාදාන උපාදාන සම්පයුත්ත දුකය

උපාදන උපාදනීය දුකයට අනතුරුව උපාදන සම්පයුත්ත දුකය වදාළ සේක.

උපාදනා චේව ධම්මා උපාදන සම්පයුත්තා ච
උපාදන සම්පයුත්තා චේව ධම්මා නොච උපාදනා,
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදනා චේව ධම්මා උපාදන සම්පයුත්තාච, උපාදනවූද උපාදන සම්පයුත්ත වූද දිට්ඨි ගත සම්පයුත්ත සිත් 4 හි ඇති ලෝභ දිට්ඨි දෙක ලැබෙති. ඒ ධර්ම, යෝ ස්කන්ධ 1 ද, ආයතන 1 ද, ධාතු 1, සත්‍ය 2 ද ලැබෙති.

උපාදනා සම්පයුත්තා චේව ධම්මා නොච උපාදන, උපාදන සම්පයුත්ත වන ලෝභ මූල සිත් 8 ද, උපාදන හැර චෛතසික 20 ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද, වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

උපාදන උපාදන සම්පයුත්ත දුකය නිමි.

## 74 උපාදාන විප්පයුත්ත උපාදානීය දුකය

උපාදන උපාදන සම්පයුත්ත දුකයට අනතුරුව උපාදන විප්පයුත්ත උපාදනීය දුකය වදාළ සේක.

උපාදන විප්පයුත්තා ඛෝපන ධම්මා උපාදනියා පි
උපාදන විප්පයුත්තා ඛෝපන ධම්මා අනුපාදනියා පි
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- උපාදන විප්පයුත්ත උපාදනීය ධර්මයෝ නම්, උපාදනයන් සමග නො යෙදෙන්නාවූද, උපාදන යන්ට අරමුණු වන්නාවූ ද, ලෝභ මූල සිත් 8 හැර ලෞකික

සිත් 73 ද, එහි යෙදෙන චෛතසික උපාදන හැර 50 ද, රූප 28ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 18ද, සත්‍ය 1 ද වේ.

උපාදන විප්පයුත්ත අනුපාදනිය ධම්මා, උපාදන නො වන්නාවූ ලෝකෝත්තර සිත් 8ද, චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද වේ. මෙ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දූක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දූක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නො වන හෙයින් සප්පදෙස දූක නම් වේ.

උපාදන විප්පයුත්ත උපාදනිය දූකය නිමි.

12 උපාදාන ගොච්ඡකයට අනතුරුව කිලේස ගොච්ඡකය වදාළ සේක.

## 75 කිලේස දූකය

කිලෙසා ධම්මා
නො කිලෙසා ධම්මා, යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙසා ධම්මා, ස්වකීය සන්තානයෙහි ඉපද සිත කිලුටු කරන්නාවූ සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෝභ දෝෂ මෝහ මාන දිට්ඨි විචිකිච්ඡා ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන දසයයි. ඒ ධර්මයෝ ස්කන්ධ 1 ද, ආයතන 1 ධාතු 1 ද සත්‍ය 2 ද වේ.

නො කිලෙසා ධම්මා, ස්ව සන්තානය කිලිටි නොකරන්නා වූ සිත් 89 ද, කිලෙස 10 හැර චෛතසික 42 ද, රූප 28ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18ද, සත්‍ය 3 ද වේ. මෙ ධර්ම සියල්ල පද දෙකක් කොට වදාළ හෙයින් දූක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දූක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දූක නම්.

කිලෙස දූකය නිමි.

## 76 සංකිලෙසික දුකය

කිලෙස දුකයට අනතුරුව සංකිලෙසික දුකය වදළ සේක.

සංකිලෙසිකා ධම්මා
අ සංකිලෙසිකා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සංකිලෙසිකා ධම්මා, කිලුටු වන ස්වභාව ඇත්තාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම් ලෞකික සිත් 81 ද චෛතසික 52 ද රූප 28 ද, ලැබෙති. ඒ ධර්ම ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 2 ද වේ.

අසංකිලෙසිකා ධම්මා-කිලුටුවන ස්වභාව නැත්තාවූ ලෝකෝත්තර 8 ද චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 සත්‍ය 2 ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සංකිලෙසික දුකය නිමි..

## 77 සංකිලිට්ඨ දුකය

සංකිලෙසික දුකයට අනතුරුව සංකිලිට්ඨ දුකය වදාළ සේක.

සංකිලිට්ඨා ධම්මා
අසංකිලිට්ඨා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- සංකිලිට්ඨා ධම්මා, කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දාවූ අකුසල් සිත් 12 ද, චෛතසික 27 ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති.

අසංකිලිට්ඨා ධම්මා- කෙලෙසුන් ගෙන් කෙලෙසිය නො හැකි වූ ඉතිරි සිත් 77 ද, චෛතසික 38 ද, රූප 28 ද, නිර්වාණ යද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද ධාතු 18 ද, සත්‍ය 3 ද වේ. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සංකිලිට්ඨ දුකය නිමි.

## 78 කිලෙස සම්පයුත්ත දුකය

සංකිලිට්ඨ දුකයට අනතුරුව කිලෙස සම්පයුත්ත දුකය වදළ සේක.

කිලෙස සම්පයුත්තා ධම්මා
කිලෙස විප්පයුත්තා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙස සම්පයුත්තා ධම්මා, කෙලෙසුන් සමග යෙදුනාවූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- අකුසල් සිත් 12ද, චෛතසික 27 ද, වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු, 2 ද, සත්‍ය 2 ද වේ.

කිලෙස විප්පයුත්තා ධම්මා- කෙලෙසුන් සමඟ නො යෙදුනාවූ සිත් 77 ද, චෛතසික 38 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 3 ද වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

කිලෙස සම්පයුත්ත දුකය නිමි.

## 79 කිලෙස සංකිලෙසික දුකය

කිලෙස සම්පයුත්ත දුකයට අනතුරුව කිලෙස සංකිලෙසික දුකය වදාළ සේක.

කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච
සංකිලෙසිකා චෙව ධම්මා -නොච කිලෙසා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙසා චෙව ධම්මා, කිලෙස නම්වූද, සංකිලෙසිකාච, කෙලෙසුන්ගේ ඉපදීමට හිතවූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. කෙලෙස් ධර්ම දසදෙන ලැබෙති. ස්කන්ධ 1 යි, ආයතන 1යි ධාතු 1 යි. සත්‍ය 2 ලැබෙති.

සංකිලෙසිකා චෙව ධම්මා- කෙලෙසුන්ගේ ඉපදීමට හිතවූද, නොච කිලෙසා කෙලෙසුන් නොවූද, ධම්මා සත්ව නොවන ජීවනොවන ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. කෙලෙස් දසය හැර ලෞකික සිත් 81ද, චෛතසික දෙසාළිසද රූප 28 ද ලැබෙති ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද ධාතු 18 ද, සත්‍ය 2 ද ලැබෙති. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

කිලෙස සංකිලෙසික දුකය නිමි.

## 80 කිලෙස සංකිලට්ඨ දුකය

කිලෙස සංකිලෙසික දුකයට අනතුරුව කිලෙස සංකිලිට්ඨ දුකය වදළ සේක.

කිලෙසා චෙව ධම්මා- සංකිලිට්ඨාච
සංකිලිට්ඨා චෙව ධම්මා- නොච කිලෙසා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙසා චෙව ධම්මා කෙලෙසුන් වන්නාවූද සංකිලිට්ඨාච කෙලෙසන ලද්දාවූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය.

(ලෝභ, දිට්ඨි මෝහ මාන දෝෂ විචිකිච්ඡා ථීන උඩච්ච අහිරික අනොත්තප්ප යන10 යි ) ඒ ධර්ම ස්කන්ධ 1 ආයතන 1 ධාතු, 1 සත්‍ය 2

සංකිලිට්ඨා චේව ධම්මා නොච කිලෙසා - කෙලෙසුන්ට හිතවූද, කිලෙස නොවන්නාවූද ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- කිලෙස 10 හැර අකුසල් සිත් 12ද, චෛතසික 17 ද, ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 1 වේ. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නමි.

කිලෙස සංකිලිට්ඨ දුකය නිමි.

## 81 කිලෙස කිලෙස සම්පයුත්ත දුකය

කිලෙස සංකිලිට්ඨ දුකයට අනතුරුව කිලෙස කිලෙස සම්පයුත්ත දුකය වදාළ සේක.

කිලෙසා චේව ධම්මා- කිලෙස සම්පයුත්තා ච
කිලෙස සම්පයුත්තා චේව ධම්මා- නොච කිලෙසා
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙසා චේව ධම්මා, කිලෙස වන්නාවූද, කිලෙස සම්පයුත්තාව, කිලෙස හා සම්පයුත්තවූද, ධම්මා ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. කෙලෙස 10 ලැබෙති ඒ ධර්ම ස්කන්ධ 1, ආයතන 1 ධාතු 1 සත්‍ය 2 යි.

කිලෙස සම්පයුත්තා චේව ධම්මා- කිලෙස සම්පයුත්තවූද නොච කිලෙසා, කෙලෙස් නො වන්නාවූද, ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. අකුසල් 12 ද, කෙලෙස් නොවන චෛතසික 77ද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2ද සත්‍ය 1 ද වේ. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් නම් ලබන හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

කිලෙස කිලෙස සම්පයුත්ත දුකය නිමි.

## 82 කිලෙස විප්පයුත්ත සංකිලෙසික දුකය

කිලෙස කිලෙස සම්පයුත්ත දුකයට අනතුරුව කිලෙස විප්පයුත්ත සංකිලෙසික දුකය වදළ සේක.

කිලෙස විප්පයුත්තා චෝපන ධම්මා- සංකිලෙසිකාපි
කිලෙස විප්පයුත්තා චෝපන ධම්මා-අසංකිලෙසිකා පි
යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කිලෙස විප්පයුත්තා චෝපන ධම්මා- කිලෙස විප්පයුත්තවූද, කිලෙසයන්ට හිතවූද ස්වභාව ධර්මයෝ ඇත. අකුසල් හැර ලෞකික සිත් 69 ද චෛතසික 38 ද, රූප 28 ද, ලැබෙති.

කිලෙස විප්පයුත්තා චෝපන ධම්මා- අසංකිලෙසිකාපි කෙලෙසුන් සමග නො යෙදුනාවූද, කෙලෙසුන්ට හිත නොවූද, ධර්ම සමූහයක් ඇත්තාහුය. ලෝ කෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 2 ද, සත්‍ය 2 ද ලැබෙති. මෙ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පද-යෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම වේ.

කිලෙස ගොච්ඡකය නිමි.

## 83 දස්සනේන පහාතබ්බ දුකය

කිලෙස ගොච්ඡකයට අනතුරුව පිටියි දුකය වදළ සේක.

දස්සනෙන පහාතබ්බා ධම්මා
න දස්සනෙන පහාතබ්බා ධම්මා යනුවෙනි

එහි ස්වරූපාර්ථයෝ නම්- දස්සනෙන පහාතබ්බා ධම්මා දස්සන සංඛ්‍යාත සෝවාන් මගින් පහකටයුතු ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. සෝවාන් මගින් සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණය කටයුතු වූ දිට්ඨිගත සම්පයුත්ත සිත් 4 හා විචිකිච්ඡා සිතද, මාන දෝෂ ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර චෛතසික 22 ද, සෝවාන් මගින් තුනී

කටයුතුවූ ආපායගාමී ශක්තියෙන් යුත් දිට්ඨි ගත විප්පයුත්ත සිත් 4 හා ද්වේෂ මූල දෙසිතද, උඬච්ච සිතද, දිට්ඨි විචිකිච්ඡා, ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික 22ද, අපාය ගාමී ශක්තියද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද ආයතන 2 ද ධාතු 2 වේ. සත්‍ය 1 ද වේ.

න දස්සනෙන පහාතබ්බා ධම්මා- සෝවාන් මගින් ප්‍රහානය නො කළ යුතු අපාය ගාමී ශක්තිය හැර දිට්ඨි විප්පයුත්ත සිත් 4 හා ද්වේෂ මූල සිත් ද, උඬච්ච සහගත සිත ද. අකුසල් සිත් 12 හැර සිත් 76 ද, දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික 47 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. මේ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12ද ධාතු 18 ද සත්‍ය 4 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුකනම් මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාමදුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්ප දෙස දුක නම් වේ.

දස්සනෙන පහාතබ්බ දුකය නිමි.

## 84 භාවනාය පහාතබ්බ දුකය

දස්සන දුකයට අනතුරුව භාවනාය පහාතබ්බ දුකය වදළ සේක.

භාවනාය පහාතබ්බා ධම්මා
න භාවනාය පහාතබ්බා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- භාවනාය පහාතබ්බා ධම්මා, මතු මාර්ග තුනෙන් පහකටයුතුවූ දිට්ඨි ගත විප්පයුත්ත සිත් 4ද ද්වේෂ මූල දෙසිතද,උඬච්ච සහගත සිතද, දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික 25 ද, ලැබෙති. ඒ ධර්ම ස්කන්ධ 4 ආයතන 22 ද ධාතු 2 සත්‍ය 1 ලැබෙති.

න භාවනාය පහාතබ්බා ධම්මා– මතු මාර්ග සිත් තුනෙන් ම පහ කටයුතු නොවූ දිට්ඨි ගත සම්පයුත්ත සිත් 4 ද, විචිකිච්ඡා සිත් 2 ද, යන අකුසල් සිත් හැර ඉතිරි සිත් 76 ද,

චෛතසික 50 ද රූප 28 ද, නිර්වාණයද ලැබෙති ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ද ලැබෙති.

මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

භාවනාය පහාතබ්බ දුකය නිමි.

## 85 දස්සනේන පහාතබ්බහේතු දුකය

භාවනාය පහාතබ්බ දුකයට අනතුරුව දස්සනේන පහාතබ්බ හේතු දුකය වදළ සේක.

දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා
න දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- දස්සනේන පහාතබ්බ හේතුකා දස්සන යනුවෙන් ප්‍රකාශවන සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහානය කරන්නාවූ දිට්ඨි ගත සම්පයුත්ත සිත් 4ද, විචිකිච්ඡා සිත 1 ද යන සිත් 5 ද, දිට්ඨි විචිකිච්ඡා යන චෛතසික 2 ද හැර ඉතිරි චෛතසික 25 ලැබෙති. සෝවාන් මගින් තුනී කිරීම වශයෙන් අපාය ගාමී ශක්තිය ඇති දිට්ඨි විප්පයුත්ත සිත් 4 ද, ද්වේෂ මූල සිත්2 ද යන සිත් 6 ද, දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික 21 ද ලැබෙති.

න දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා– සෝවාන් මගින් ප්‍රහානය නො කටයුතු හේතු ඇති ධර්මයෝ නම්- සෝවාන් මගින් ප්‍රහානය කටයුතු හේතු ඇති ධර්ම හැර අපාය ගාමී ශක්තිය පහකළාවූ දිට්ඨි ගත විප්පයුත්ත සිත් 4 ද, ද්වේෂ මූල සිත් 2ද සෝවාන් මගින් ඒකාන්තයෙන් ප්‍රහානය නොකටයුතු උද්ධච්ච සහගත සිතද, කුසල් සිත් 21 ය විපාක සිත් 36 ය, ක්‍රියා සිත් 30ය. දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසිත 47 ය. විචිකිච්ඡ සිතෙහි යෙදුනාවූ මෝහයද රූප 28ද, නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද ධාතු 18 ද, සත්‍ය 4 ද ලැබෙති, මේ ධර්මයෝ ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ සියල්ල ඇතුලත්වූ හෙයින් නිප්පදෙස දුක නම් වේ.

# 86 භාවනාය පහාතබ්බා හේතු දුකය

දස්සනේන පහාතබ්බ හේතු දුකයට අනතුරුව භාවනාය පහාතබ්බ හේතු දුකය වදළ සේක.

භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා
න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා- සෝවාන් මාර්ගය හැර ඉහළ මාර්ග තුනෙන් පහකළයුතු හේතු ඇති ධර්මයෝ නම්- සකදාගාමි මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් පහකළයුතු ඖදරික දිට්ඨි විප්පයුත්ත සිත් 4 ය. ද්වේෂ මුල් සිත් 2 ය. අනාගාමි මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් පහකළයුතු ද්වේෂ මූල සිත් 2 ය. කාමරාගයෙන් යුත් දිට්ඨි ගත විප්පයුත්ති සිත් 4 ය. යන මේ ධර්ම සමූහය ලැබෙති. අර්හත් මාර්ගයෙන් ඉතිරි නැතිව පහකළ යුතු රූප රාග ආරූප- රාග මාන උද්ධච්ච අවිද්‍යාවන් සමග යෙදුනාවූ දිට්ඨි විප්පයුත්ත සිත් 4 ය. උද්ධච්ච සහගත සිත් 1 ද, දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර ඉතිරි චෛතසික 22 ද, ලැබෙති.

න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා- මතු මාර්ග තුනෙන් පහකටයුතු හේතු නැත්තාවූ දිට්ඨි ගත සම්පයුත්ත සිත් 4 ද විචිකිච්ඡා සිතද, කුසල් සිත් 21ද, විපාක සිත් 36 ද, ක්‍රියා සිත්, 20ද, චෛතසික 52 ද, උද්ධච්ච සිතෙහි මෝහය සහ රූප 28ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 18 ද, සත්‍ය 4 ද, ලැබෙති. මේ ධර්ම සමූහය මුල් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වේ. මුල් පදයෙන් ලැබෙන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම් වේ. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වේ.

භාවනාය පහාතබ්බ හේතු දුකය නිමි.

## 87 සවිතක්ක දුකය

භාවනාය පහාතබ්බ හේතුක දුකයට අනතුරුව සවිතක්ක දුකය වදළ සේක.

සවිතක්කා ධම්මා
අවිතක්කා ධම්මා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- සවිතක්කා ධම්මා, විතක්කය සහිත සිත් 55 ය. විතක්කය හැර චෛතසික 51 ය, යන මේ සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහය ලැබෙති.

අවිතක්කා ධම්මා-විතක්කය නො යෙදෙන සිත් 66 ය. විතක්කය හැර චෛතසික 37 ය, රූප 28ය. නිර්වාණය යන මේ ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 17 ද, සත්‍ය 3 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

සවිතක්ක දුකය නිමි.

## 88 සවිචාර දුකය

සවිතක්ක දුකයට අනතුරුව සවිචාර දුකය වදළ සේක.

සවිචාරා ධම්මා
අවිචාරා ධම්මා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- සවිචාරා ධම්මා, විචාරය සහිත සිත් 66 සහ විචාරය හැර චෛතසික 37 ලැබෙති. ස්කන්ධ 4 ද, ආයතන 2 ද, ධාතු 3 ද, සත්‍ය 3 ද ලැබෙති.

අවිචාරා ධම්මා- විචාරය නො යෙදෙන 55 ය විතක්ක විචාර හැර චෛතසික 36 ද, රූප 28 ද නිර්වාණයද ලැබෙති.ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 17 ද, සත්‍ය 3 ලැබෙති. මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක

නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නමි.

සවිචාර දුකය නිමි.

## 89 සප්පීතික දුකය

සවිචාර දුකයට අනතුරුව සප්පිතික දුකය වදාළ සේක.

සප්පිතිකා ධම්මා
අප්පිතිකා ධම්මා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්– සප්පිතිකා ධම්මා, ප්‍රීතිය සහිත සිත් 51 ය. ද්වේෂ ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා සහ ප්‍රීතියද, හැර චෛතසික 46 ලැබෙති. ඒ ධර්ම සමූහය සත්ව නොවන ජීවනොවන ස්වභාව ධර්ම සමූහයක් ලැබෙති. ස්කන්ධ 4 ද, ආයතන 2ද , ධාතු 3 සත්‍ය 3 ද ලැබෙති.

අප්පිතිකා ධම්මා- ප්‍රීතිය නො යෙදෙන සිත් 70 ද, චෛතසික ප්‍රීතිය හැර 51 ද, රූප 28 ද, නිර්වාණයද, යන සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය 4 ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නමි. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදී ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ලම ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

සප්පිතික දුකය නිමි.

## 90 පීති දුකය

සප්පිතික දුකයට අනතුරුව පිති දුකය වදාළ සේක.

පිති සහගතා ධම්මා
න පිති සහගතා ධම්මා, යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- පිති සහගතා ධම්මා, ප්‍රීතිය සමග යෙදෙන සිත් 51 ද චෛතසික 46 ලැබෙති. ඒ ධර්මයෝ සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් වේ.

න පිති සහගතා ධම්මා- ප්‍රීතිය සමග නො යෙදෙන සිත් 70 සහ චෛතසික 51ද වේ. රූප 28 නිර්වාණය ද වේ. සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයකි. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද ධාතු 18ද, සත්‍ය 4 ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නම ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

පිති සහගත දුකය නිමි.

## 91 සුඛ සහගත දුකය

පීති සහගත දුකයට අනතුරුව සුඛ සහගත දුකය වදළසේක

සුඛ සහගතා ධම්මා
න සුඛ සහගතා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- සුඛ සහගතා ධම්මා, සුඛ වේදනාව සමග යෙදෙන සිත් 63 ද, වේදනා දෝෂ ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර චෛතසික 46 ලැබෙති. ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් වේ.

න සුඛ සහගතා ධම්මා- සුඛ වේදනාව සමග නො යෙදෙන උපේක්ෂා සිත් 55 දුක්ඛ සහගතකායවිඥාන සිතද සහ දෙම්නස් සිත් 2 ද ඒ සමග යෙදෙන පිතිය හැර චෛතසික 51 ද, සුඛවේදනා 63 ය. රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 18 ද සත්‍ය 4 ලැබෙති මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් නම ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

සුඛ සහගත දුකය නිමි.

## 92 උපෙක්ඛා දුකය

සුඛ සහගත දුකයට අනතුරුව උපෙක්ඛා සහගත දුකය වදාළ සේක.

උපෙක්ඛා සහගතා ධම්මා
න උපෙක්ඛා සහගතා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- උපෙක්ඛා සහගතා ධම්මා උපෙක්ඛා සහගත සිත් 55 ද, පීති වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හැර චෛතසික 46 ලැබෙති.

න උපෙක්ඛා සහගතා ධම්මා- උපෙක්ඛා වේදනාව සමග නො යෙදුනාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ලැබෙති. ඒ ධර්මයෝ නම්. සුඛ සහගත සිත් 63 ද, දුක්ඛ සහගත සිත් 3 ද, විචිකිච්ඡාව හැර චෛසික 51 ද, උපෙක්ඛා වේදනා 55 ද, රූප 28 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද, ආයතන 12ද, ධාතු 13 ද සත්‍ය 4 ද ලැබෙති. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

උපෙක්ඛා සහගත දුකය නිමි.

## 93 කාමාවචර දුකය

උපෙක්ඛා සහගත දුකයට අනතුරුව කාමාවචර දුකය වදාළ සේක.

කාමාවචරා ධම්මා
න කාමාවචරා ධම්මා යනුවෙනි.

එහි ස්වරූපාර්ථයෝ නම්- කාමාවචරා ධම්මා, එකොළොස් වැදෑරුම් කාම භූමියෙහි බොහෝ සෙයින් ඇති වන්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් වේ. ඒ

ධර්මයෝ කාමාවචර සිත් 54 ද, චෛතසික 52 ද, රූප 28 ද ලැබෙති. ස්කන්ධ 5, ආයතන 12, ධාතු 18 සත්‍ය 2 යි.

න කාමාවචරා ධම්මා- කාමාවචර නො වන්නාවූ මහද් ගත ලෝකෝත්තර සිත් 35 ද, චෛතසික 38 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ආයතන 2 ද, ධාතු 2 ද සත්‍ය 3 ලැබෙති. මෙසේ මේ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

කාමාවචර දුකය නිමි.

## 94 රූපාවචර දුකය

කාමාවචර දුකයට අනතුරුව රූපාවචර දුකය වදළ සේක.

රූපාවචරා ධම්මා
න රූපාවචරා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්– රූපාවචරා ධම්මා, රූපී බඹ තල පසළොසෙහි වැඩි වශයෙන් පවත්නා ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ලැබෙති. රූපාවචර සිත් 15 ද චෛතසික විරති හැර 35 ද වේ.

න රූපාවචරා ධම්මා- රූප භූමින්හි වැඩි වශයෙන් නො හැසිරෙන්නාවූ ඉතිරි සිත් 74 ද, චෛතසික 52 ද රූප 28 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 5, ආයතන 12ද, ධාතු 18ද සත්‍ය 4 වේ.

ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

රූපාවචර දුකය නිමි.

## 95 අරූපාවචර දුකය

රූපාවචර දුකයට අනතුරුව අරූපාවචර දුකය වදාළ සේක

අරූපාවචරා ධම්මා
න අරූපාවචරා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- අරූපාවචරා ධම්මා, අරූප ලෝකයන්හි වැඩි වශයෙන් පවත්නා ධම්මා සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තේය. අරූපාවචර සිත් 12 ද චෛතසික 30 ද වේ. ස්කන්ධ 4 ආයතන 1 ධාතු 1 සත්‍ය 1 ලැබෙති.

න අරූපාවචරා ධම්මා- අරූප ලෝකයෙන් අන්‍ය ලෝකයන්හි පවත්නා අරූපාවචර සිත් හැර ඉති සිත් 77 ද චෛතසික 52 ද රූප 28 ද, නිර්වාණයද වේ. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ද ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පද යෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

අරූපාවචර දුකය නිමි.

## 96 පරියාපන්න දුකය

අරූපාවචර දුකයට අනතුරුව පරියාපන්න දුකය වදාළසේක

පරියාපන්නා ධම්මා
අපරියාපන්නා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- පරියාපන්නා ධම්මා, සංසාර නැමති වෘර්ත දුක්ඛයෙහි ඇතුලත්වූ ධම්මා, සත්වනොවූ ජීව නොවූ ස්වභාව ධර්මයෝ නම් ලෞකික සිත් 81 ද චෛතසික 52 ද, රූප 18 ද ලැබෙති.

අපරියාපන්නා ධම්මා, කර්ම වෘර්ත ක්ලේශවෘතීත විපාක වෘර්ත යන ත්‍රිවිධ වෘතී දුක්ඛයට ඇතුලත් නොවූ ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ නම්- ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම්.

පරියාපන්න දුකය නිමි

## 97 නියයානික දුකය

පරියාපන්න දුකයට අනතුරුව නියයානික දුකය වදළ සේක.

නියයානිකා ධම්මා
අනියයානිකා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- නියයානිකා ධම්මා, සංසාර වෘර්ත දුක්ඛයෙන් නිදහස් වීමට උපකාර වන්නාවූ ධම්මා සත්ව නොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ලැබෙති. ඒ ධර්ම යෝ නම් මාර්ග සිත් 4 ය. චෛතසික 36 ද ලැබෙති.

අනියයානිකා ධම්මා- සංසාර දුක්ඛයෙන් නිදහස් වීමක් නොකරන්නාවූ ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. මාර්ග සිත් 4 හැර සිත් 85 ද චෛතසික 52 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද ආයතන 12ද ධාතු 18 ද, සත්‍ය 4 වේ. ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

නියයානික දුකය නිමි.

# 98 නියත දුකය

නියාානික දුකයට අනතුරුව නියත දුකය වදළ සේක.
නියතා ධම්මා
අනියතා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- නියතා ධම්මා, චුතියට අනතුරුව ම පටිසන්ධි ගෙන දීමට සුදුසු වන්නාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ ඇත්තාහුය. මිථ්‍යා දිට්ඨියෙන්යුත් චිත්ත වීථීන්හි සත්වන ජවනයෝය. මාන දෝෂ ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර චෛතසික 21 ය. පඤ්ච ආනන්තරිය කර්ම බවට පත්වන ද්වේෂ මූල සිත් 2 ද උපදනා චිත්ත වීථීන්හි සත්වන ජවන චේතනාවෝය. පීති ලෝභ දිට්ඨි මාන විචිකිච්ඡා හැර චෛතසික 22 ය. මාර්ග සිත් 4 ය. එහි යෙදෙන චෛතසික 36 ය. යන මේ ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ආයතන 2 ධාතු 2 ය. සත්‍ය 3 ක් ද වේ.

අනියතා ධම්මා- චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව විපාකදීමේ ශක්තිය නැති, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්මයෝ නම් නියත මිථ්‍යා දිට්ඨි වීථීන්හි සත්වන ජවන චේතනාව හා ආනන්තරිය කර්මයන්හි පැවති සත්වන ජවන චේතනාවන්ද මාර්ග සිත් 4 ද හැර ඉතිරි ධර්ම සියල්ල විපාකදීමේ කාල නියමයක් හෝ විපාක දීමේ නියත බවක් හෝ නැත්තේය. අනියත වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 5 ද ආයතන 12ද ධාතු 18ද සත්‍ය 3 ද වේ. මේ ධර්ම සමූහය පද දෙකක් කොට වදළ හෙයින් දුක නමි. මුල් පදයෙන් නම ලබන ලද හෙයින් ආදි ලබ්ධ නාම දුක නමි. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නමි.

නියත දුකය නිමි.

## 99 සඋත්තර දුකය

නියත දුකයට අනතුරුව සඋත්තර දුකය වදාළ සේක.

සඋත්තරා ධම්මා

අනුත්තරා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- සඋත්තරා ධම්මා, වෘර්ත දුක්ඛ යෙන් එතර නොවන්නාවූ තමාට වඩා උත්තරීතර ධර්ම ඇත් තාවූද ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තාහුය. උත්තරීතර ධර්‍මයන්ට වඩා පහත් ස්වභාවයෙන් යුත් ධර්ම සමූහය නම්- ලෞකික සිත් 81 චෛතසික 52 ද, රූප 28 ද ලැබෙති.

අනුත්තරා ධම්මා- අනුත්තර වන්නාවූ ඒ අනුත්තර ධර්ම යන්ට වඩා උත්තරීතර ධර්මයන් නැත්තාවූ උතුම් ධර්ම සමූ- හයක් ඇත්තාහුය. ඒ ධර්මයෝ නම්- ලෝකෝත්තර සිත් 8 සහ චෛතසික 36 ද නිර්වාණයද වේ. ඒ ධර්මයෝ ස්කන්ධ 4 ද, ආයතන 12 ද, ධාතු 18 ද සත්‍ය ඒ ධර්ම සමූහය පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම්. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුලත් වන හෙයින් නිෂ්පදෙස දුක නම්.

සඋත්තර දුකය නිමි.

## 100 සරණ දුකය

සඋත්තර දුකයට අනතුරුව සරණ දුකය වදාළ සේක.

සරණා ධම්මා

අරණා ධම්මා යනුවෙනි,

එහි ස්වරූපාර්ථයෝ නම්- සරණා ධම්මා, රාගාදි කෙලෙස් සහිත වන්නාවූද පිළිසරණක් නැත්තාවූද, පිළිසරණ ලැබිය යුතු වූද, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්යෝ නම් අකුසල් සිත් 12 සහ චෛතසික 27 ලැබෙති.

අරණා ධම්මා,- ඇඩිම් රහිතවූ, දුක් දෙම්නස් නැත්තාවූ, ධම්මා සත්වනොවූ ජීවනොවූ ස්වභාව ධර්ම සමූහයක් ඇත්තා හුය. ඒ ධර්මයෝ නම්- අකුසල් සිත් 12 හැර සිත් 77 ද චෛත සික 38 ද, රූප 28 ද, නිර්වාණයද ලැබෙති. ඒ ධර්ම සමූහය ස්කන්ධ 5 ද, ආයතන 12 ද, ධාතු 18 ද, සත්‍ය 4 ලැබෙති. ඒ ධර්මයෝ පද දෙකක් කොට වදළ හෙයින් දුක නම්. මුල් පද-යෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම දුක නම්. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වන හෙයින් නිප්පදෙස දුක නම් වේ.

දුක මාතිකා නිට්ඨිතා

අභිධම්ම මාතිකා ස්වරූපාර්ථ නිට්ඨිතා

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු